# අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

## වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

## 2019

පටුන

**සභාපතිගේ පණිවුඩය ............ 4**

**1. හැඳින්වීම ............ 6**

**2. නෛතික සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම ............ 7**

දක්නට නොමැති බවට වූ සහතිකය ............ 7
අතුරු වාර්තා ............ 9
අතුරු සහන ............ 10
හදිසි අවස්ථා රෙගුලාසි ............ 12
යුක්තිය හා සම්බන්ධ වෙනත් මැදිහත්වීම් ............ 13
ශිවිසුම් ආයතන වෙත වාර්තා කිරීම ............ 14
නෛතික සහ පරිපාලනමය මැදිහත්වීම ............ 15

**3. විමර්ශන, දත්ත පදනම සහ ආරක්ෂාව ............ 16**

පැමිණිලි ............ 16
අතුරුදහන් වූවන් සම්බන්ධ පවත්නා දත්ත එක්රැස් කිරීම ............ 18
දත්ත පදනම ............ 19
විමර්ශන ............ 20
හඳුනානොගත් මෘත දේහ සොයා ගැනීම ............ 20
මන්නාරම සමූහ මිනීවල ............ 21
වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම ............ 22

**4. ආයතනික සංවර්ධනය ............ 23**

භෞතික පරිශ්‍රය ස්ථාපිත කිරීම ............ 24
කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ............ 24
ප්‍රාදේශීය කාර්යාල ............ 26
ක්‍රියා පටිපාටි සහ රීති සංවර්ධනය කිරීම ............ 27
පවුල් කෙරෙහි මනෝ සමාජීය ප්‍රතිචාර දැක්වීම සහ සංවේදීතාව සහතික කිරීම ............ 27
ධාරිතා වර්ධනය හා දැනුම බෙදාගැනීම ............ 29

**5. සන්නිවේදනය සහ ප්‍රජාව වෙත යොමුවීම ............ 32**

පොදු අවස්ථා ............ 32
ප්‍රාදේශීය කාර්යාල විවෘත කිරීම ............ 32
අධිකරණ වෛද්‍ය විද්‍යාව භාවිතය පිළිබඳ දැනුවත් කිරීම ............ 33
මාධ්‍ය සමඟ සම්බන්ධතා ............ 33
සන්නිවේදන සහ ප්‍රචාරක ව්‍යාපාර ............ 36
ඩිජිටල් මාධ්‍ය මත පැවැත්ම ............ 37

**6. අනුස්මරණය සහ ස්මරණය ............ 37**

**7. මූල්‍ය කටයුතු ............ 39**

https://undp-my.sharepoint.com/personal/imaan_mohamed_one_un_org/Documents/OMP/Annual Report 2019/2019/Final (without Finance)/OMP Annual Report - 2019 (Sinhala).docx - _Toc62652645

## කෙටි යෙදුම් මාලාව

| | |
|---|---|
| CoA | දක්නට නොමැති බවට වූ සහතිකය |
| CoI | විමසුම් කොමිසම |
| CoD | මරණ සහතිකය |
| CTF | ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය පිළිබඳ උපදේශක කාර්ය බලකාය |
| DIG | නියෝජ්‍ය පොලිස්පති |
| DMS | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| HRC | මානව හිමිකම් කොමිෂන් සභාව |
| ICPPED | බලහත්කාරී අතුරුදහන් කිරීමෙන් සියලුම පුද්ගලයන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය |
| ICRC | ජාත්‍යන්තර රතු කුරුස කමිටුව |
| IGP | පොලිස්පති |
| IHL | ජාත්‍යන්තර මානුෂවාදී නීතිය |
| LLRC | උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාව |
| MNIR | ජාතික ඒකාබද්ධතා, ප්‍රතිසංධාන, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගමන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය |
| OMP | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය |
| PSS | මනෝසමාජ සහය උපාය මාර්ගය |
| SCRM | ප්‍රතිසංධාන යාන්ත්‍රණය පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය |
| UNDP | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| WGIED | බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම |

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඵලදායී මෙහෙයුම්කරණය, අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට සහ ඔවුන් සමඟ වැඩ කරන අයවළුන්ට පමණක් නොව මුළු මහත් ශ්‍රී ලාංකිකයින්ටම වැදගත් වන්නකි. අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් දහස් ගණනක් වසර ගණනක්, සමහර විටක දශක ගණනක් තම ආදරණීයයන්ගේ ඉරණම පිළිබඳ තොරතුරු ලබාගැනීමේ අපේක්ෂාවෙන් බලා සිට ඇත. 2019 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි කාර්යාල ස්ථාපනය කරමින්, විමර්ශනයන් ඉදිරියට ගෙන යමින් සහ පවුලේ සාමාජිකයින්ගේ අයිතීන් ආරක්ෂා කරගැනීමට මැදිහත්වෙමින් ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය මුහුණ දෙන භාරදූර කාර්යයක් වන්නේ එහි මූලික අරමුණු සාක්ෂාත් කරගැනීමේ ලා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය භෞතික සහ මානව සම්පත් ඇති බවට වගබලා ගැනීමයි. පසුගිය වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අයදුම් පත්‍ර 22,000 කට වැඩි ප්‍රමාණයක් සමාලෝචනය කර ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා 46 දෙනෙකු බඳවාගෙන ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය කොළඹත් එහි ප්‍රාදේශීය කාර්යාල මාතර, මන්නාරම, යාපනය සහ මඩකලපුව ප්‍රදේශවලත් පිහිටුවන ලදී. ප්‍රාදේශීය කාර්යාල, පැමිණිලි භාරගැනීම, පුද්ගල පැමිණිලි සම්බන්ධ විමසුම් සිදු කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සහ රුචීන් ආරක්ෂා කිරීමට දිස්ත්‍රික් මට්ටමේ බලාධිකාරීන් සමඟ පසු විපරම් කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල අනගි සහයක් ලබාදෙනු ඇති අතර

සාක්ෂ්‍යකරුවන්ගේ ප්‍රකාශ ලබාගැනීම ඇතුළු මූලාශ්‍ර ගණනාවක් වෙතින් තොරතුරු ලබාගනිමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විමර්ශනයන් ඉදිරියට ගෙන යන ලදී. එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, හඳුනනොගත් පුද්ගල මෘත ශරීරවලට අදාළ අධිකරණ ක්‍රියාමාර්ග හතරක නිරීක්ෂකයෙකු ලෙස මැදිහත් විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තාවකාලික දත්ත පදනමක් සංවර්ධනය කළ අතර, ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ බවට හඳුනාගනු ලැබූ හමුදාවේ සහ පොලිසියේ සාමාජිකයින් ඇතුළු අතුරුදහන් වූ තැනැත්තන්ගේ ජාතික ලේඛනයක් සම්පාදනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත, රාජ්‍ය ආයතන, පවුලේ සාමාජිකයින් සහ බලහත්කාරී ලෙස අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම වෙතින් අතුරුදහන් වූවන් හා සම්බන්ධ වාර්තාවන් 37,491 ක් ලැබිණි. එහි දත්ත පද්ධතිය වෙත එවැනි වාර්තා 5,038 ක් ඇතුල් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකි වූ අතර එක් එක් වාර්තාවල විස්තර සනාථ කිරීම සහ ද්විත්ව ලෙස ඇතුල් කිරීම් පිළිබඳව පරීක්ෂා කිරීම අඛණ්ඩව කරගෙන යනු ලැබේ.

2019 මාර්තු මාසයේදී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කරන ලද නිර්දේශවලට ප්‍රතිචාරයක් ලෙස ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ බවට හඳුනාගනු ලැබූ හමුදාවේ සහ පොලිසියේ සාමාජිකයින් ඇතුළු දක්නට නොමැති බවට වූ සහතිකය (CoAs) ලබාගත්, අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට අන්තර්කාලීන සහන සැලසීම සඳහා රජය විසින් අයවැයෙන් රුපියල් මිලියන 500 ක් වෙන් කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෙම නිවේදනය පිළිගන්නා නමුත් මෙය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් සිදුවූ බව සටහන් කරයි. ජාතික ඒකාබද්ධතා, ප්‍රතිසංධාන, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගමන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරු සහන ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් සංවර්ධනය කළ අතර දක්නට නොමැති බවට වූ සහතික ලබාගැනීම ඉක්මන් කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය,

MNIR, මුදල් අමාත්‍යාංශය සහ ප්‍රතිසංධාන යාන්ත්‍රණය සම්බන්ධීකරණය සඳහා වන ලේකම් කාර්යාලය (SCRM) සමඟ සහයෝගයෙන් අතුරු සහන ලබාගැනීමේ නිර්ණායක පුළුල් කිරීමට සහ සහන ලබාගැනීමට හිමිකම් කියන පවුල් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගන්නා ලදී.

ඉහත ප්‍රගතිය ලබාගනු ලැබුවේ අභියෝග ගණනාවකට මුහුණ දෙමිනි. ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතනවල සහයෝගය මඳවීම සහ පවුල්වල අයිතීන් ප්‍රතික්ෂේප කිරීමට ගන්නා ලද අඛණ්ඩ උත්සාහයන් එම අභියෝගයන්ගෙන් කිහිපයකි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2018 අතුරු වාර්තාව තුළ ඉදිරිපත් කරන ලද යුක්තිය හා සම්බන්ධ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නැත. එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට, යුක්තිය සඳහා ක්‍රියාකාරන්නන් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට එල්ල කරන ලද ප්‍රහාරයන් පිළිබඳව දිගින් දිගටම වාර්තා වීම අප මුහුණ දෙන බරපතල ගැටළුවක්ව පවතී.

මගේ සහෝදර කොමසාරිස්වරුන් සහ මම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මෙහෙවර පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමේ ලා මෙන්ම අපගේ සහෝදර ජනයාට සත්‍යය දැනගැනීමට සහ යුක්තිය සාක්ෂාත් කරගැනීමට ඇති අයිතිය ආරක්ෂා කරගැනීම සඳහා දිගින් දිගටම කැප වන්නෙමු.

සාලිය පීරිස්

සභාපති

2019 දෙසැම්බර් 31

## 1. හැඳින්වීම

1.1. 2016 අංක 14 දරන අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාල පනත (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) 2016 අගෝස්තු මස නීතිගත කරන ලදී. 2018 පෙබරවාරි 28 වන දින එවකට ජනාධිපති අතිගරු මෛත්‍රිපාල සිරිසේන විසින් ව්‍යවස්ථාදායක මණ්ඩලයේ නිර්දේශ මත අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ලෙස සාලිය පීරිස් මහතා ද ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු, එස්.කේ ලියනගේ මහතා (නීතිඥ), මේජර් ජනරාල් (විශ්‍රාමික) මොහාන්ති පීරිස්, ජයතීපා පුණ්‍යමූර්ති මෙය, මිරාක් රහීම් මහතා සහ කනපතිපිල්ලෙයි වේන්දන් මහතා කොමසාරිස්වරුන් ලෙසද පත් කරන ලදී.[1]

1.2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත තුළ ප්‍රකාශිත අරමුණු වන්නේ පුද්ගලයන් තුරුදහන් වූ තත්ත්වයන් පැහැදිලි කරගැනීම; නැවත සිදු නොවීම සහතික කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ සැපයීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතීන් හා අභිලාශයන් ආරක්ෂා කිරීම; අතුරුදහන් වූ තැනැත්තන් වෙනුවෙන් අවශ්‍ය සහන සැලසීම සඳහා නිසි මාවත් හඳුනාගැනීම; පවතින මූලාශ්‍රවලින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ දත්ත ලබාගැනීම සහ ලද හැකි සියලු තොරතුරු දත්ත පදනමක් තුළ මධ්‍යගත කිරීම.[2]

1.3. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලතල සහ කාර්ය භාරයන් ගණනාවක් පවරා ඇති අතර, දක්නට නොමැති බවට වන සහතියක නිකුත් කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට හැකිවන පරිදි අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට අතුරු වාර්තා නිකුත් කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට මනෝ සමාජයීය සහය ලබාදීම ඇතුළු සුබසාධන සේවාව සහ පරිපාලන සහය ලබාදීම හෝ ඒ සඳහා පහසුකම් සැපයීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට හානිපූරණයන් ලබාදීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ සැපයීම; වින්දිතයින් සහ සාක්ෂ්‍යකරුවන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රම පද්ධතියක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සියලු විස්තර සහිත දත්ත පදනමක් නිර්මාණය කිරීම, කළමනාකරණය කිරීම සහ පවත්වා ගැනීම; අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට සිදු වූ හානිය සහ ඔවුන් පත්වූ වේදනාකාරී තත්ත්වය සම්බන්ධව මහජන දැනුවත්භාවය සහ සංවේදීතාව ඇති කිරීම හා ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාගැනීමට සහ ආර්ථික, මනෝ සමාජයීය, නෛතික සහ් පරිපාලන සහය වෙත පිවිසීම සහතික කිරීමට මහජනතාවගේ සහය ලබාගැනීමට පහසුකම් සැලසීම ඒ අතර වෙයි.

1.4. රීති සැකසීමට, ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව සංවේදී මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමට, කාර්ය මණ්ඩලය පත් කිරීමට සහ ඉවත් කිරීමට සහ එහි ඵලදායී ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය ඒකක පිහිටුවීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලතල ඇත.[3] එමෙන්ම, ඉදිරියේදී අතුරුදහන් වීම් වැලැක්වීම; ස්මරණයන් සඳහා ක්‍රම සකසා දීම සහ අතුරුදහන් වීම් පිළිගැනීම; හඳුනාගත් සහ හඳුනා නොගත් මළ සිරුරු සම්බන්ධව කටයුතු කිරීම; මහජනයා දැනුවත් කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ගැටළු සම්බන්ධව තොරතුරු පල කිරීම; අතුරුදහන් වූ තැනැත්තන්ට අදාළ ජාතික නීති සහ රෙගුලාසි සංවර්ධනය කිරීම; අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ සමාජ සහ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස හානිපූරණයන්, මනෝ සමාජයීය සහය සහ වෙනත් විධික්‍රමයන් සපයා දීම ඇතුළු ගැටළු ගණනාවක් සම්බන්ධව අනෙක් රාජ්‍ය බලාධිකාරීන්ට නිර්දේශ සැපයීමේ බලයද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඇත.

1.5. එහි විමර්ශනයන් සිදු කිරීම පිණිස පැමිණිලි භාරගැනීමට, විමසුම් ආරම්භ කිරීමට සහ අතුරුදහන් වූ තැනැත්තන් සිටින ස්ථානය විමර්ශනය කිරීමට; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පෙනී සිටින මෙන් කැඳවීම හෝ ලේඛනයක් හෝ වෙනත් යමක් ඉදිරිපත් කිරීම ඇතුළු අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට; රහස්‍ය තොරතුරු පිළිගැනීමට හෝ කැමරාව මත තොරතුරු සටහන් කරගැනීමට; රහස්‍යතාව ආරක්ෂා කිරීමේ කොන්දේසි මත තොරතුරු පිළිගැනීමට; කැණීමක් සිදු කිරීමට හෝ මෘත ශරීර ගොඩගැනීමට අවශ්‍ය වන නියෝගයක් සඳහා මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලීමක් කිරීමට; ඕනෑම රඳවාගැනීම් ස්ථානයක් වරෙන්තුවක් රහිතව සෙවීමට; සහ සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ හෝ

[1] 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) 2016 අගෝස්තු මස නීතිගත කරන ලදී. (අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත)

[2] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 10 වගන්තිය.

[3] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 11 වගන්තිය.

අභිචෝදක අධිකාරියකට වාර්තා කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නිශ්චිත බලතල ඇත.[4]

1.6. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පෙනී සිටීමට හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිකුත් කරන සිතාසියක් මත ලේඛනයක් හෝ වෙනයම් දෙයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එම පුද්ගලයා වෙත යවන ලද දැන්වීමක් හෝ ලිඛිත නියෝගයකට අනුකූල වීම හෝ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ප්‍රතික්ෂේප කිරීම; තම බලය භාවිතා කිරීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නිලධාරියෙකුට බාධා කිරීම; හෝ දැනුවත්ව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වැඩ කටයුතුවලට බාධා කිරීම ඇතුළුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ බලයට විරුද්ධව කටයුතු කිරීමෙන් ඕනෑම පුද්ගලයෙකු එහි බලයට අගෞරව කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවෙකු කළ හැකිය.[5]

1.7. පවතින නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සපයන අතර නීතියේ ආධිපත්‍යය, අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල්වල අයිතීන් සහ අභිලාශයන්ගේ මධ්‍යගතභාවය පිළිගන්නා පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි අරමුණු ක්‍රියාවේ යොදවා ඇත. එමෙන්ම, අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ ඍජුවම බෙදාගත් අදහස් සහ ප්‍රතිසංධාන යාන්ත්‍රණ සඳහා වන උපදේශන කාර්ය සාධක බලකායේ (CTF) නිර්දේශ මගින්ද කාර්යාලය මග පෙන්වීමක් ලබා ඇත.[6]

## 2. නෛතික සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම

2.1. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූවන් සම්බන්ධ නිර්දේශ නිකුත් කිරීමට සහ ඔවුන්ගේ හා ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමේ අරමුණක් ඇත.[7] ඉදිරියේදී සිදුවන අතුරුදහන් වීම් වැලැක්වීම, මිනිස් මෘතදේහ සම්බන්ධව කටයුතු කිරීම සහ අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වල සමාජ සහ ආර්ථික තත්වයන් වැඩි දියුණු කිරීම යනාදිය ඇතුළු කරුණු ගණනාවක් සම්බන්ධව අනෙකුත් රාජ්‍ය ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.[8] එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයට මනෝ සමාජයීය, නෛතික සහ පරිපාලනමය සහය ලබාගැනීමේ ලා වන ප්‍රවේශයට පහසුකම් සැලසීමේ වගකීමද පැවරී තිබේ.[9]

2.2. ඉහත කාර්යයන් සිදු කිරීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, දක්නට නොමැති බව පිළිබඳ සහතිකය (CoA); හදිසි අවස්ථා රෙගුලාසි 2120/5 (හදිසි අවස්ථා රෙගුලාසි); අතුරුදහන් වූවන්ගේ පවුල්වලට දක්නට නොමැති බව පිළිබඳ සහතික ලබාගත හැකි වන පරිදි අතුරු වාර්තා නිකුත් කිරීම; 2019 අයවැය මගින් නිවේදනය කළ අතුරු සහන ක්‍රියාත්මක කිරීම; සහ පුද්ගල සිදුවීම්වලදී නෛතික සහ පරිපාලන සහය සඳහා වන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම යනාදිය සම්බන්ධ නෛතික සහ ප්‍රතිපත්තිමය නිර්දේශ සකසන ලදී. එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් බලහත්කාරී ලෙස අතුරුදහන් කිරීම පිළිබඳ කමිටුව සහ බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGIED)ට අතුරුදහන් වූවන් සම්බන්ධව වන බැඳීම් ශ්‍රී ලංකාව විසින් සැපිරීම පිළිබඳ වාර්තාද ඉදිරිපත් කරන ලදී.

2.3. මෙම මැදිහත්වීම් සිදු කරන ලද්දේ බලහත්කාරී අතුරුදහන් කිරීම් නැවත සිදු නොවීමට, අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයිතීන් සහ අභිලාශයන් ආරක්ෂා කිරීමට සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සඳහා සහය සපයන වඩා පුළුල් නෛතික රාමුවක් සහතික කිරීම සඳහාය.

### දක්නට නොමැති බවට වූ සහතිකය

[4]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 12 වගන්තිය.
[5]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 24 වගන්තිය.
[6]ප්‍රතිසංධාන යාන්ත්‍රණ උපදේශන කාර්ය සාධක බලකායේ අතුරු වාර්තාව (අගෝස්තු, 2016); ප්‍රතිසංධාන යාන්ත්‍රණ උපදේශන කාර්ය සාධක බලකායේ අවසන් වාර්තාව, කාණ්.I සහ II (2016 නොවැම්බර් 17)
[7]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 2 (ආ): 10 (ආ) වගන්තිය.
[8] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 වගන්තිය k)(i),(iii),(vii).
[9]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 වගන්තිය (ඉ), (ඊ).

2.4. 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) (සංශෝධන) (මරණ ලියාපදිංචි කිරීමේ පනත) මගින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට දක්නට නොමැති බවට වන සහතික නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට බලය පවරා ඇත. දක්නට නොමැති බවට වූ සහතිකය, අතුරුදහන් වූවන්ට නිත්‍යානුකූල තත්වයක් ලබාදෙන නිත්‍යානුකූල ලේඛනයක් වන අතර මරණ සහතිකයක් නොමැති අවස්ථාවකදී අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයට පරිපාලන සහ මූල්‍ය සේවාවන් හා වෙනත් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පිවිසිය හැකි වේ.

2.5. අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට අතුරු වාර්තා නිකුත් කිරීමට හැකි වන අතර එමගින් ඔවුන්ට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් දක්නට නොමැති බව පිළිබඳ සහතිකයක් ලබාගත හැකි වේ.[10] උතුරු සහ නැගෙනහිර ඇතිවූ ගැටුම, දේශපාලන කැලඹිලි, සිවිල් කලකෝලහාල, බලහත්කාරී අතුරුදහන් කිරීම් හේතුවෙන් අතුරුදහන් වූ හෝ යුධ හමුදාවේ හෝ පොලීසියේ සාමාජිකයෙකුව සිට ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ අය වෙනුවෙන් දක්නට නොමැති බවට වූ සහතිකය නිකුත් කළ හැකිය.

2.6. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සංඛ්‍යාලේඛන අනුව 2019 ජූනි 30 වන විට නිකුත් කර ඇත්තේ දක්නට නොමැති බව පිළිබඳ සහතික 645 ක් පමණි. බොහෝ විට රාජ්‍ය නිලධාරීන්ගේ දැනුවත් බව මඳ වීම නිසා අතුරුදහන් වූවන්ගේ පවුල් බොහොමයක් දක්නට නොමැති බවට වන සහතික ලබාගැනීමේදී අසීරුතාවන්ට මුහුණ දෙයි. එමෙන්ම බොහෝ පවුල්වලට දක්නට නොමැති බව පිළිබඳ සහතිකයේ වලංගු බව සහ එහි අරමුණ සම්බන්ධව ඇත්තේ සීමිත අවබෝධයක් වන අතර එය කාලයත් සමඟ අනිවාර්යයෙන් මරණ සහතිකයක් බවට පරිවර්තනය වෙනු ඇතැයි බිය වෙති.

2.7. දක්නට නොමැති බවට වන සහතිකය සම්බන්ධ අවබෝධය වැඩි කිරීමට සහ එම ක්‍රියාවලිය අනුකූලනය කරනු පිණිස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලැබිණි. 2019 මැයි මසදී, දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කිරීම වේගවත් කිරීම සඳහා පහසුකම් සැපයීම පිණිස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගිත ලිපියකට අත්සන් කරනු ලැබීය. මරණ ලියාපදිංචි කිරීමේ පනත මගින් ප්‍රාදේශීය රෙජිස්ට්‍රාවරුන් විසින් පවත්වන විමසුම් ක්‍රියාවලියක් හරහා වන සාමානය ක්‍රියාපටිපාටියක් මෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිකුත් කරන ලද අතුරු වාර්තාවක් මත පදනම්ව හෝ පෙර විමසුම් කොමිෂන් සභාවක (CoI) වාර්තාවක් මත පදනම්ව විශේෂ ක්‍රියා පටිපාටියකින් දක්නට නොමැති බව පිළිබඳ සහතිකය ලබාගැනීමට විධි විධාන සලසයි.[11] මෙම වෙනස් ක්‍රියා පටිපාටීන් නිලධාරීන් මෙන්ම බලපෑමලත් පවුල් අතර යම් කිසි ව්‍යවුලක් ඇති කරන ලදී.

2.8. නීතියේ විධිවිධාන පැහැදිලි කරගැනීමට ආයතනික වශයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වන ලද අතර අතුරුදහන් වූ අයගේ පවුල්වලට දක්නට නොමැති බවට වන සහතිකය නිකුත් කළ හැකිවෙන පරිදි මෙම ක්‍රියා පටිපාටීන් දෙකම ක්‍රියාත්මක කිරීම සඳහා එකඟත්වයකට එළඹෙන් ලදී. මෙම සාකච්ඡාවලට පසුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, සාමාන්‍ය සහ විශේෂ ක්‍රියා පටිපාටීන් දෙක යටතේම, විශේෂයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, විමසුම් කොමිෂන් සභාවක් හෝ විශේෂ ජනාධිපති විමසුම් කොමිෂන් සභාවක් විසින් නිකුත් කරන ලද අතුරු වාර්තාවකට අනුකූලව, දක්නට නොමැති බව පිළිබඳ සහතිකයක් නිකුත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ මාර්ගෝපදේශ සහ උපදෙස් සහිත චක්‍රලේඛ කෙටුම්පත් කරන ලදී.[12]

2.9. එමෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් අදාළ නීතිවල දක්වා ඇති පරිදි දක්නට නොමැති බව පිළිබඳ සහතිකයක් නිකුත් කිරීම සම්බන්ධ විස්තරාත්මක ක්‍රියා පටිපාටි, අවශ්‍යතා සහ ප්‍රමිතීන් කෙටුම්පත් කිරීමට කටයුතු කළේය.[13]

[10]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (අ) වගන්තිය.
[11]මරණ ලියාපදිංචි කිරීමේ පනත වගන්තිය 8උ
[12] මරණ ලියාපදිංචි කිරීමේ පනත වගන්තිය 8අ-8ඉ 8උ
[13]මරණ ලියාපදිංචි කිරීමේ පනත වගන්තිය 8අ- 8 උ

2.10. එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් දක්නට නොමැති බවට වන සහතිකය නිත්‍යානුකූලව දරන්නා සම්බන්ධ නෛතික විධිවිධාන සමාලෝචනය කිරීමක් සිදු කරන ලදී. එහිදී නීතියේ විෂමතාවන් පැහැදිලි කිරීම සඳහා හැකි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලදී. විශේෂයෙන් 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ පනත තුළ භාවිතා කර ඇති 'ඥාතියා' සහ 'අයදුම්කරු' යන යෙදුම් දක්නට නොමැති බව පිළිබඳ සහතිකය නිකුත් කරන පුද්ගලයා සම්බන්ධ ව්‍යාකූලතාවයක් ඇති කර තිබිණි.

2.11. දක්නට නොමැති බව පිළිබඳ සහතිකය ලබාගැනීමේ ක්‍රියාවලිය සහ රාජ්‍ය ආයතන තුළ, විශේෂයෙන් අතුරුදහන් වූවන්ගේ පවුල් පළමුවරට සම්බන්ධ වන ආයතනවල ඒවායේ නෛතික බව සම්බන්ධ පැහැදිලිතාව මඳ බවත් අතුරුදහන් වූ තැනැත්තන් සඳහා වන කාර්යාලය දැනුවත් කර තිබිණි. එයට ප්‍රතිචාරයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය සහ එම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලන නිලධාරීන්ගේ කාර්ය භාරය පැහැදිලි කරමින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ ග්‍රාම නිලධාරිවරුන්ට නිකුත් කිරීම පිණිස චක්‍රලේඛයක් කෙටුම්පත් කරන ලදී.

2.12. දක්නට නොමැති නව පිළිබඳ සහතිකය සම්බන්ධව ඇති අඩු අවධානය හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දක්නට නොමැති නව පිළිබඳ සහතිකය ලබාගැනීමේ ක්‍රියාවලිය සහ එහි වලංගු බව පැහැදිලි කරන පෝස්ටර් සහ අත් පත්‍රිකා ඇතුළු දැනුවත් කිරීමේ ලේඛන සකස් කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට දිස්ත්‍රික් සහ සහකාර රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීමේ ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයක් පැවැත්වීමටද එකඟතාවකට පිවිසෙන ලදී. ප්‍රතිසන්ධාන යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ (SCRM) සහාය ඇතිව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ ඒකාබද්ධව සම්මන්ත්‍රණය පැවැත්වීමට එකඟ විය.

### අතුරු වාර්තා

2.13. පරීක්ෂණයක් පැවැත්වීමට නියමිතව, පැමිණිල්ලක් සම්බන්ධ පුද්ගලයා අතුරුදහන් වූ පුද්ගලයෙකු බව නිගමනය කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතුව ප්‍රමාණවත් තොරතුරු තිබේ නම්, අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට අතුරු වාර්තා නිකුත් කිරීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පැවරේ.[14] අතුරු වාර්තාවක එකම අරමුණ වන්නේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් මරණ ලියාපදිංචි කිරීමේ පනතේ අදාළ විධිවිධාන යටතේ එවැනි අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ඥාතියෙකුට දකනට නොමැති බව පිළිබඳ සහතිකයක් නිකුත් කිරීමට පහසුකම් සැලසීමයි.

2.14. මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 8 උ වගන්තියේ දක්වා ඇති විශේෂ ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කරමින්, පවුල්වලට දක්නට නොමැති බවට වන සහතිකයක් ලබා ගැනීමට හැකිවන පරිදි මරණ ලියාපදිංචි කිරීමේ පනත මගින් නියම කර ඇති පරිදි අතුරු වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලියක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සැලසුම් කරන ලදී. විමර්ශන ක්‍රියාපටිපාටිය, අභ්‍යන්තර නීති රීති සහ මාර්ගෝපදේශ, කාර්ය මණ්ඩල වෙන් කිරීම, බඳවා ගැනීමේ සැලැස්ම සහ වෙනත් අදාළ ලියකියවිලි සහ ආකෘතීන් ඇතුළු අදාළ අභ්‍යන්තර ක්‍රියා පටිපාටිය සැලසුම් කරනු ලදුව අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවක් මගින් 2019 ජූනි මසදී අනුමත කරනු ලැබිය.

2.15. ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ දිස්ත්‍රික් මට්ටමින් පරීක්ෂණ පැවැත්වීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා බාධා ඇති වූ අතර එය තවමත් අසම්පූර්ණව ඇති බැවින් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ප්‍රමාදයට ලක් වී ඇත. කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් අතුරු වාර්තාවක් සඳහා දැනටමත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති පවුල් සඳහා අතුරු වාර්තා නිකුත් කිරීමේ නියමු ව්‍යාපෘතියක් කාර්යාලය විසින් ආරම්භ කරන ලදී. ඉහත සඳහන් පරිදි හඳුනාගෙන ඇති අය සඳහා අතුරු වාර්තා නිකුත් කිරීම සඳහා වන පරීක්ෂණ ක්‍රියා පටිපාටිය,

[14] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (අ) (i) වගන්තිය.

පවතින කාර්ය මණ්ඩලය සමඟ 2019 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. 2020 පළමු කාර්තුවේදී පළමු විමසුම් පැවැත්වීමට සැලසුම් කර ඇත.

අතුරු සහන

2.16. තම ආදරණීයයන් අතුරුදහන් වීම හේතුවෙන් වඩාත් අවදානමට ලක්ව සිටින පවුල් සඳහා අතුරු සහන ලබා දෙන ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2018 අගෝස්තු මාසයේ සිය අතුරු වාර්තාවේ නිර්දේශ කර තිබේ. හානි සිදුවූ පවුල්වලට, ඒවායින් මිදීම සඳහා අතුරු සහන ක්‍රියාමාර්ග මගින් ක්ෂණික ආධාර සැපයීම අපේක්ෂා කරන අතර ඒවා වන්දි ගෙවීම් වලින් වෙන්කර හඳුනාගත යුතුය.

2.17. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, සිය අතුරු වාර්තාවේ පහත සඳහන් අතුරු සහන පියවර 2019 අයවැයට ඇතුළත් කරන ලෙස නිර්දේශ කළේය:[15]

a) මූල්‍ය ආධාර වැඩසටහන: අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ස්ථිර ආදායමක් නොමැති ඉතිරිව සිටින කලත්‍රයාට, දරුවාට / දරුවන්ට හෝ දෙමාපියන්ට රු. 6,000 ක මාසික ජීවන දීමනාවක් ලබාදීමේ මූල්‍ය සහන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. මෙය අතුරු පියවරක් ලෙස සිදු කෙරෙනු ඇති අතර අවසාන වන්දි ලබා දීමේදී එය නතර වේ.

b) ණය සහන වැඩසටහන: (අ) මුදල් අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන මුදලකට හෝ ඊට අඩු වටිනාකමක් ඇති ණය කපා හැරීම (උදාහරණ: ක්ෂුද්‍ර මූල්‍ය ණය) අරමුණු කරගත් ණය සහන වැඩසටහනට අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ පවුල් වෙනම ප්‍රමුඛතා කාණ්ඩයක් ලෙස ඇතුළත් කිරීම; හෝ (ආ) ආර්ථික ස්ථාවරත්වය සහ ස්වයං විශ්වාසය තැබීම අරමුණු කරගත් මූල්‍ය අමාත්‍යාංශයේ 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' වැනි මූල්‍ය ආධාර වැඩසටහන් සහ ණය යෝජනා ක්‍රම.

c) නිවාස සංවර්ධන වැඩසටහන: නිවාස අමාත්‍යාංශයේ පවත්නා නිවාස වැඩසටහන් තුළ අතුරුදහන් වූවන්ගේ පවුල් වෙනම ප්‍රමුඛතා කාණ්ඩයක් බවට පත් කිරීම; ස්ථිර නිවාස ඉදිකිරීම සඳහා නව නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම; හෝ අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවාස නිම කිරීම සඳහා මූල්‍යාධාර සැපයීම.

d) අධ්‍යාපන සහය වැඩසටහන: අතුරුදහන් වූ තැනැත්තන්ගේ ළමුන් සඳහා ඔවුන්ගේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන වියදම් පියවා ගැනීමට මාසික දීමනාවක් ලෙස රු. 2,000 ක් ලබාදෙන ශිෂ්‍යත්ව ක්‍රමයක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ හඳුන්වා දීම.

e) වෘත්තීය පුහුණුව සහ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන: සේවාස්ථ පුහුණුව සහිත තාක්ෂණික පුහුණුව සහ පුද්ගලික සංවර්ධන පාඨමාලා හඳුන්වාදීම.

f) රැකියා කෝටාව: රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශවල පුරප්පාඩු පිරවීම සිදුවෙන විට අවශ්‍ය නිපුණතා ඇති අතුරුදහන් වූවන්ගේ පවුලේ සාමාජිකයින්ට පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය අංශය තුළ 1% ක රැකියා කෝටාවක් හඳුන්වා දීම.

2.18. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කරන ලද එක් නිර්දේශයකට ප්‍රතිචාර වශයෙන්, රෙජිස්ට්‍රාර් ජෙනරාල්ගේ අධිකාරිය යටතේ නිකුත් කරන ලද දක්නට නොමැති බව පිළිබඳ සහතිකයක් සන්තකයේ තබා ගැනීමේ කොන්දේසිය මත, ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ බවට හඳුනාගනු ලැබෙන ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ සාමාජිකයිනද ඇතුළුව අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට රු.6000 ක මාසික සහන මුදලක් සැපයීම පිණිස 2019 අයවැයෙන් රු.මිලියන 500 ක මුදලක් වෙන් කිරීමට රජය යෝජනා කළේය.[16] තවද, අතුරුදහන් වූවන්ගේ පවුල්වලට අදාළ "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රම සඳහා

---

[15] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අතුරු වාර්තාව (අගෝස්තු 2018), 45 (අ) - (ඊ) ඡේදය (අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාව)

[16] පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ්) (2019 මාර්තු 5) කාණ්ඩය. 269 අංක. 1, කො. 36-37, https://www.parliament.lk/uploads/documents/hansard/1552280911015264.pdf ලබාගත හැකිය (2020 ජනවාරි 15 ප්‍රවේශ විය).

ප්‍රවේශය ලබා දෙන බවත්, ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලබන ජීවනෝපාය වැඩසටහන්වලට සම්බන්ධ වීමට අවශ්‍ය බවත් රජය නිවේදනය කළේය.[17]

2.19. දක්නට නොමැති බව පිළිබඳ සහතික ප්‍රදානය කිරීමේ නීති සම්පාදනය කිරීමට පෙර (2016 දී) අතුරුදහන් වූ පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් ඇතුළත් කිරීම සඳහා අතුරු සහන ලබා ගැනීම සඳහා සුදුසුකම් නිර්ණායක පුළුල් කිරීමේ අවශ්‍යතාව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් රජයට ඉදිරිපත් කරන ලදී. මරණයට හේතුව අතුරුදහන් වීම ලෙස දක්වමින් මරණ සහතික නිකුත් කරන ලද දකුණු සහ නැගෙනහිර පළාත්වල මෙය විශේෂයෙන් දක්නට ලැබේ. රජය විසින් යෝජනා කරන ලද කොන්දේසි යටතේ මරණ සහතිකයක් සන්තකයේ ඇති පවුල්වලට දක්නට නොමැති බවට වන සහතිකයක් නොමැති නිසා අතුරු සහන සඳහා අයදුම් කිරීම සඳහා නුසුදුසු වෙයි.

2.20. දක්නට නොමැති බව පිළිබඳ සහතිකය 2016 දී හඳුන්වා දීමට පෙර, අනුක්‍රමිකව පත්වූ රජයන් විසින් අතුරුදහන් වූ පුද්ගලයන්ට මරණ සහතික නිකුත් කිරීමට හැකි වන පරිදි පවතින නීතිවලට තාවකාලික සංශෝධන ක්‍රියාත්මක කරන ලදී. එහි අවසන් සංශෝධනය වූයේ 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ පනත වූ අතර එමගින්, ශ්‍රී ලංකාවේ සිදුවූ සිවිලි කැලඹීම් හෝ ත්‍රස්තවාදී හෝ කඩාකප්පල්කාරී ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වූ බවට වාර්තා වන සහ වසරකට වැඩි කාලයක් කිසිදු විස්තරයක් නොලද පුද්ගලයන්ට අදාළව මරණ සහතිකයක් නිකුත් කිරීමට විධිවිධාන සලසන ලදී. සුබසාධන ගෙවීම් සහ වන්දි ලබාගැනීමට හැකි වෙන පරිදි අතුරුදහන් වූවන්ට අදාළව මරණ සහතික නිකුත් කරන මෙන් බලපෑම් ලත් පවුල් විසින් සිදු කරන ලද නියෝජනයන්ට වැඩිමනත් වශයෙන්, උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභා වාර්තාව (LLRC වාර්තාව), මෙම සංශෝධනය ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරන ලදී.[18]

2.21. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අදාළ රීති සමාලෝචනය කළ අතර දක්නට නොමැති බව පිළිබඳ සහතික ඇති අය හට අතුරු සහන සඳහා සුදුසුකම් ලැබීමට සීමා පැනවූ නිර්ණායකයන් සංශෝධනය කිරීමට යෝජනාවක් සංවර්ධනය කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය යෝජනා කළේ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ, අතුරුදහන් වූ ආදරණීයයන් වෙනුවෙන් මරණ සහතිකයක් ලබාගත් පවුල් සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ විශේෂිත කොන්දේසි සැපිරීමෙන් මරණ සහතික ලබාගත් අය යෝග්‍යතා නිර්ණායකයන්ට ඇතුළත් විය යුතු බවයි.

2.22. 2019 ඔක්තෝබර් මසදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කෙටුම්පත් කරන ලද යෝජනාව, ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ලෙස මුදල් අමාත්‍යවරයා සහ ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගමන සහ හින්දු ආගමික කටයුතු (MNIR) අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. අතුරුදහන් වූ ආදරණීයයන් වෙනුවෙන් මරණ සහතික ලබාගත් පවුල්වලට අතුරු සහන ලබාගැනීමට ඉඩ සලසන එම යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් සහිත පවුල් විශාල ගණනකට අතුරු සහන ලබාගැනීමට හැකියාව ලබාදුන් මෙම යෝජනාව අනුමත වීම විශාල ජයග්‍රහණයක් විය.

2.23. යෝජිත අතුරු සහන පවුල් වෙත ලැබීම වේගවත් කිරීම පිණිස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අතුරු සහන ගෙවීම සඳහා වන පරිපාලන ක්‍රියාවලිය විස්තර කරන ලද යෝජනාවක් MNIR වෙත ඉදිරිපත් කරන ලද අතර අතුරු සහන බෙදාදීම අමාත්‍යාංශයට පවරන ලදී. එයට ප්‍රතිචාර දක්වමින් අමාත්‍ය මණ්ඩලය යෝජනාව අනුමත කළ අතර සහන ගෙවීම සෘජුවම ප්‍රතිලාභියාගේ බැංකු ගිණුමට අමාත්‍යාංශය විසින් බැර කළ යුතු බවට විශේෂ නිර්දේශයක්ද සිදු කරන ලදී.

2.24. එක් එක් දිස්ත්‍රික්කයෙන් දක්නට නොමැති බව පිළිබඳ සහතික නිකුත් කළ ඇති පුද්ගලයන්ගේ සනාථ කරන ලද ලැයිස්තුවක් ලබාගැනීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ විය. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලැයිස්තු, අතුරු සහන සඳහා වන අයදුම්පත්‍ර ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා MNIR වෙත භාරදෙන ලදී.

[17] Ibid.

[18] උගත් පාඩම් විමසීම සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ වාර්තාව (2011 නොවැම්බර් 15) 5.39. 8. 61, 8.62. ඡේද

2.25. 2019 අවසන් කාර්තුවේදී MNIR විසින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට අතුරු සහන දීමනා ගෙවීම ආරම්භ කරන ලදී. MNIR වෙතින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ලද තොරතුරුවලට අනුව, 2019 නොවැම්බර් 11 වන දළ වශයෙන් රු. මිලියන 11 ක මුදලක් ප්‍රතිලාභීන් 153 දෙනෙකුට ලබාදී තිබිණි.

2.26. අතුරු සහන අපේක්ෂා කරන අයගේ නම් සහ සම්බන්ධතා විස්තර සනාථ කරගැනීම සඳහා අමාත්‍යාංශය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සහය ඉල්ලා සිටියේය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරු සහන ගෙවීම වේගවත් කිරීමට එහි ප්‍රාදේශීය කාර්යාල සමඟ කටයුතු කිරීමට අමාත්‍යාංශයට සහය වීමට තාවකාලික පදනමින් වින්දිත සහ පවුල් සහය නිලධාරීන් දෙදෙනෙකු පත් කිරීමට එකඟ විය.

## හදිසි අවස්ථා රෙගුලාසි

2.27. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් ඉක්බිතිව හදිසි රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාව හඳුනාගත් අතර, මළ සිරුරු හැසිරවීම සම්බන්ධයෙන් හදිසි රෙගුලාසිවල ඇති ගැටළු සහගත විධිවිධාන පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කළේය. විශේෂයෙන්, හදිසි රෙගුලාසි මඟින් මළ සිරුරු සන්තකයේ තබා ගැනීම, භූමදාන කිරීම හෝ ආදාහනය කිරීම සඳහා පොලීසියට සහ වෙනත් බලයලත් නිලධාරියෙකුට හෝ පුද්ගලයෙකුට පුළුල් බලතල ලබා දී ඇත.

2.28. රෙගුලාසි 58 (1) යටතේ නියෝජ්‍ය පොලිස්පති (ඩීඅයිජී) තනතුරට නොඅඩු ඕනෑම පොලිස් නිලධාරියෙකුට හෝ වෙනත් බලයලත් නිලධාරියෙකුට හෝ පුද්ගලයෙකුට ඕනෑම මළ සිරුරක් සන්තකයේ තබා ගැනීමට, භූමදාන කිරීමට හෝ ආදාහනය කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට මෙන්ම එවැනි සුසාන භූමියක් සඳහා පැමිණිය හැක්කේ කාටද යන්න තීරණය කිරීමට අවසර දී තිබේ.[19] තවද, රෙගුලාසි 58 (2) යටතේ, මළ සිරුරක් සන්තකයේ තබා ගැනීම, භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම සම්බන්ධයෙන් පියවර ගන්නා ඕනෑම නිලධාරියෙකු හෝ පුද්ගලයෙකු හදිසි රෙගුලාසි යටතේ හෝ මරණය, භූමදානය හෝ ආදාහනය පිළිබඳ විමසීමට අදාළ වෙනත් ලිඛිත නීතියක් යටතේ වෙනත් රෙගුලාසිවලට අනුකූල වීමේ වගකීමෙන් පැහැදිලිවම නිදහස් කර ඇත.[20]

2.29. 60 (1) (අ), (ආ) සහ 60 (2) රෙගුලාසි වලට අනුව, පොලිස් නිලධාරියෙකුගේ හෝ යුධ හමුදා සාමාජිකයෙකුගේ ක්‍රියාවක් හේතුවෙන් මියගිය පුද්ගලයෙකුගේ පශ්චාත් මරණ පරීක්ෂණයක් කරන ලදුව දේහය ලැබීමෙන් පසු ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය පවත්වාගෙන යාම හෝ ආරක්ෂා කිරීම සඳහා මළ සිරුර භූමදානය කිරීමට හෝ ආදාහනය කිරීමට නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට පුළුල් බලයක් තිබුණි.

2.30. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අදහස වූයේ, එවැනි පුළුල් බලයක් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට, බලයලත් නිලධාරීන්ට සහ පුද්ගලයින්ට පැවරීමෙන් මියගිය පුද්ගලයාගේ සිරුරට ඥාතීන්ට ප්‍රවේශයක් නොමැති අවස්ථාවන් සහ ඔවුන්ගේ ඥාතියෙකුගේ මරණය පිළිබඳව දැනුම් නොදීම වැනි තත්වයන් ඇතිවිය හැකි බවයි.

2.31. තවද, පොලිස්පතිවරයාගේ (IGP) ඉල්ලීමක් මත කොළඹ මහාධිකරණය විසින් හදිසි රෙගුලාසි යටතේ කිසියම් පුද්ගලයෙකුගේ මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වූ විටක මහාධිකරණය හමුවේ කටයුතු ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූයේ නිසි බලධාරියෙකුගේ අවසරය ඇතිව පමණි.[21] පශ්චාත් මරණ පරීක්ෂණයක් පවත්වන රජයේ වෛද්‍ය නිලධාරියෙකුට මහාධිකරණයේ අවසරයකින් තොරව කිසිදු

[19] හදිසි අවස්ථා රෙගුලාසි අංක. 2120/5 (2019 අප්‍රේල් 22), රෙගුලාසි 58(1).
[20] හදිසි අවස්ථා රෙගුලාසි අංක. 2120/5 (2019 අප්‍රේල් 22), රෙගුලාසි 58(2).
[21] හදිසි අවස්ථා රෙගුලාසි අංක. 2120/5 (2019 අප්‍රේල් 22), රෙගුලාසි 61(8).

තොරතුරක් හෙළි කිරීමට අවසර නොතිබිණි.[22] මහජනතාවට ප්‍රවේශ විය හැක්කේ අයදුම්පතක් ඉදිරිපත් කර අභියාචනාධිකරණය නඩු විභාගය මහජනයාට විවෘතව තිබිය යුතු බවට නියෝග කරන්නේ නම් පමණි.[23]

2.32. ඉහත විධිවිධානවලට අදාළ කරුණු OMP විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත ලිපියක් මගින් ප්‍රකාශ කළ අතර, 58 (1) සහ (2) රෙගුලාසි 2019 ජූලි මාසයේදී අවලංගු කරන ලදී.[24] හදිසි අවස්ථාව 2019 අගෝස්තු මාසයේදී අවසන් වූ අතර රෙගුලාසි බලාත්මක වීම නතර විය.

### යුක්තිය හා සම්බන්ධ වෙනත් මැදිහත්වීම්

2.33. බලහත්කාරයෙන් අතුරුදහන් කළ තැනැත්තන් සඳහා යුක්තිය සහතික කිරීම රජයේ මූලික නෛතික බැඳීමක් බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය 2018 අගෝස්තු අතුරු වාර්තාවේ අවධාරණය කළේය. යුක්තිය වූ කලී අතුරුදහන් වූවන්ගේ පවුල්වල ප්‍රධානතම ඉල්ලීමක් බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිළිගත් අතර පුළුල්ව පැතිර ගිය අතුරුදහන් කිරීම් සඳහා ඉඩ සලසා දුන් වරදට දඬුවම් ලබා නොසිටීමට ඇති පද්ධතිමය හැකියාව අවසන් කිරීම සඳහා අපරාධකරුවන් අභිචෝදනයට ලක් කිරීම අත්‍යවශ්‍ය විය.

2.34. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, තම 2018 අගෝස්තු අතුරු වාර්තාව මඟින් 2018 අංක 5 දරන "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ සම්මුතිය පනත (බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පනත) වෙත සංශෝධන ගණනාවක් නිර්දේශ කරන ලදී. එයට අපරාධයේ අඛණ්ඩ ස්වභාවය හඳුනාගැනීමට සහ බලහත්කාරී අතුරුදහන් කිරීමේ අපරාධය සිදු කළ සියලුම පරාසයන්ගේ පුද්ගලයන් හසු කරගැනීමද අයත් විය.[25] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වැඩි දුරටත් නිර්දේශ කළේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් විමර්ශනය කිරීම සහ අභිචෝදනය කිරීම වේගවත් කර ඒ වෙත ඉහළම ප්‍රමුඛතාවක් ලබා දිය යුතු බවයි.[26]

2.35. යුක්තිය හා සම්බන්ධ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොමැති බවත්, විශේෂයෙන් පැහැරගැනීම් සම්බන්ධ ඉහළ පෙළේ නඩු ගණනාවක් විමර්ශනවල සැලකිය යුතු ප්‍රගතියක් නොමැතිව අධිකරණය ඉදිරියේ රැඳී තිබෙන බවත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කරයි.

2.36. 2018 අගෝස්තු මාසයේ සිය අතුරු වාර්තාවේ ඉදිරිපත් කර ඇති නිර්දේශයන්ට ප්‍රතිචාර වශයෙන් ආරක්ෂක ලේකම් විසින් ලබාදුන් සහයෝගය පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සටහන් කරයි. විශේෂයෙන්, 2019 පෙබරවාරි මාසයේදී ආරක්ෂක ලේකම් විසින් ශ්‍රී ලංකා හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාවට මෙන්ම පොලීසියට ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කරන ලද යුක්තිය සම්බන්ධ සියලු නිර්දේශයන්ට අනුකූල වන ලෙස නියෝග නිකුත් කළ බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කරයි. මෙම යුක්තිය හා සම්බන්ධ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාවේ අණ දෙන නිලධාරීන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ ලිපි හුවමාරු කර ගෙන තිබේ. ඊට අමතරව අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ගරු නීතිපතිතුමා, විමසීම් නීතිය කෙටුම්පත කඩිනමින් බලාත්මක කිරීමේ අවශ්‍යතාවය ඇතුළුව යුක්තිය සම්බන්ධ නිර්දේශ සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හා සාකච්ඡා පැවැත්වීය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එවැනි උත්සාහයන් අගය කරන අතරම, එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා වඩාත් ශක්තිමත් ක්‍රියාමාර්ග ඉල්ලා සිටී.

2.37. පැහැරගැනීම් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සම්බන්ධ අපරාධ ක්‍රියා සම්බන්ධයෙන් සැකකරුවන් ලෙස හෝ චූදිතයන් ලෙස නම් කර ඇති ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ සාමාජිකයින්ගේ සේවය, එවැනි නඩු වල අවසාන තීරණය ලැබෙන තෙක් අත් හිටුවිය යුතු බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිශ්චිත නිර්දේශ ඉදිරිපත් කළේය.[27] විශේෂයෙන්, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ රාජ්‍ය සේවයේ සැක සහිත

[22] හදිසි අවස්ථා රෙගුලාසි අංක. 2120/5 (2019 අප්‍රේල් 22), රෙගුලාසි 61(5).
[23] හදිසි අවස්ථා රෙගුලාසි අංක. 2120/5 (2019 අප්‍රේල් 22), රෙගුලාසි 61(8).
[24] අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2133/1 (2019 ජූලි 22)
[25] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාව, 47 (අ)- (ඌ).
[26] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාව 47 (එ)
[27] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාව 47 (ඔ)

නිලධාරීන්ට එරෙහිව නඩු විභාග වන විට ඔවුන්ට කිසිදු විටක මාරු කිරීම්, උසස් කිරීම් හෝ වෙනත් තනතුරු ලබාදීම් නොකරන බවට රජය විසින් සහතික විය යුතු බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිර්දේශ කළේය.

2.38. යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව, අදාළ නීතිමය රාමුව තුළ, යම් නිලධාරියෙකුට එරෙහිව පිළිගත හැකි (ප්‍රිමා ෆේසී) නඩුවක් පැවරී ඇති විටක ඔවුන්ගේ වැටුප අත්හිටුවීමට හෝ යම් නිලධාරියෙකු අධිචෝදනයකට ලක් වූ විට ඔහු හෝ ඇගේ සේවය අත්හිටුවීමට විධිවිධාන ඇති බව දක්වන අතරම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 (5) වගන්තිය අනුව එවැනි චූදිත නිලධාරීන් වැරදිකරුවන් බව සනාථ වන තුරුම නිවැරදි කරුවන් ලෙස සැලකීම් ලැබීමට හිමිකම් ලබන බව දන්වමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ප්‍රතිචාර දැක්වීය.

2.39. වැරදිකරු බව ඔප්පු වන තුරු නිර්දෝෂී යැයි උපකල්පනය කිරීමෙන් රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලුම පුරවැසියන් ආරක්ෂා වන බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිළිගනී; කෙසේ වෙතත්, එවැනි ආරක්ෂාවක් මගින් බරපතළ අපරාධ සම්බන්ධයෙන් චූදිත හෝ සැක සහිත පුද්ගලයින්ට මහජන විශ්වාසය දැරීමට ඉඩ දීම සඳහා හෝ ඔවුන් බලතල අනිසි ලෙස භාවිතා කරමින් දැනට කරගෙන යනු ලබන විමර්ශනවලට මැදිහත් වීමට අවස්ථාව ඇති අධිකාරී තනතුරුවලට පත් කිරීම සඳහා ඉඩ දීමට එම ආරක්ෂාව අර්ථකථනය නොකළ යුතුය. සාමාන්‍යයෙන් බරපතළ අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින රජයේ සේවකයින්ට වැඩ තහනම් කිරීමට ඉඩ ඇති බවත් එබැවින් ඔවුන් තම නිර්දෝෂී භාවය සනාථ කරනතුරු ඔවුන්ගේ නිල රාජකාරී කිරීමෙන් වලක්වන බවත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කරයි.

2.40. පැහැරගැනීම් සහ වෙනත් බරපතළ අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින නිලධාරීන් උසස් කිරීමට උත්සාහ කළ අවස්ථා ගණනාවකදී, OMP විසින් බලධාරීන්ට කරුණු ඉදිරිපත් කරමින් එවැනි උසස්වීම් අත්හිටුවන ලෙස නිර්දේශ කළ අතර එවැනි නිලධාරීන්ගේ වැඩ තහනම් කිරීම සඳහා පවත්නා නීති යටතේ ඇති බැඳීම් ඉස්මතු කරන ලදී.[28]

2.41. තවද, බලහත්කාරී අතුරුදහන් කිරීම්වල අභිචෝදක ලෙස කටයුතු කරන අතරම හබයාස්කෝප්පුස් රිට් ඇතුළු නීති කටයුතුවලදී වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටීම යන දෙකම සිදු කරන බැවින් නීතිපති දෙපාර්තමේන්තුව තුළ නෛසර්ගිකවම බැඳියා පිළිගැටුමක් ඇති බව 2018 අතුරු වාර්තාව තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කර ඇත.[29] නීතිපති දෙපාර්තමේන්තුව, හබයාස්කෝප්පුස් අයදුම්පත්‍රවලදී අපරාධකරුවන් ලෙස චෝදනා ලැබූ තැනැත්තන්ගේ අභිලාශයන් වෙනුවෙන් පෙනී නොසිට පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා වන ලෙස රජයේ අභිලාශයන් වෙනුවෙන් පෙනී සිටිය යුතු බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිර්දේශ කර සිටී.

2.42. සිවිල් හා සාපරාධී ක්‍රියාවන්හි දී රජයේ නිලධාරීන් ආරක්ෂා කිරීමට නීතිපතිවරයාට බලය තිබුණද, එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා අභිමතය පරිදි කටයුතු කිරීමට නීතිපතිවරයාට බලය ඇති බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂණය කරයි. තවද, රජයේ නිලධාරියෙකු සාපරාධී ක්‍රියාවක් කර ඇති අවස්ථාවල දී, නීතිපතිවරයා එයට විරුද්ධව නඩු පැවරිය යුතු වන්නේය. අතීතයේ දී, විශේෂයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මූලික අයිතිවාසිකම් අයදුම්පත් සඳහා ඉදිරියට යාමට අවසර ලබාදුන් අවස්ථාවකදී, වධහිංසා චෝදනා ලැබූ රජයේ සේවකයින් ආරක්ෂා කිරීම නීතිපති විසින් ප්‍රතික්ෂේප කර තිබේ.

### ගිවිසුම් ආයතන වෙත වාර්තා කිරීම

2.43. ශ්‍රී ලංකාව 2015 දෙසැම්බර් 10 වන දින බලහත්කාරයෙන් අතුරුදහන් වූවන්ගෙන් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට (ICPPED) අත්සන් තැබූ අතර ඒ සඳහා අපරානුමත කිරීමේ ලේඛනයක්

[28] ශ්‍රී ලංකා හමුදා වැටුප් සංග්‍රහය (1982) සමඟ එකට කියවිය යුතු හමුදා නිලධාරීන්ගේ සේවා රෙගුලාසි (නිත්‍ය බලකාය) (1992), වගන්තිය (2)(1)(අ) , වගන්ති 2(3)(අ),(ඊ); නාවික හමුදා වැටුප් සංග්‍රහය (1993), වගන්තිය 2(3)(අ) ගැසට් නිවේදන. 1,010/1 (1998.01.13) මගින් සංශෝධිත වගන්තිය 2; ගුවන් හමුදා වැටුප් සංග්‍රහය (1982) සමඟ කියවිය යුතු ගුවන් හමුදා නිලධාරීන්ගේ රෙගුලාසි (නිත්‍ය බලකාය), වගන්තිය 2(1)(අ) වගන්ති 2(3)(අ),(ඊ).

[29] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාව 30 ඡේදය

2016 මැයි 25 දින සන්ධාපනය කරන ලදී.[30] ඒ අනුව, ICPPED හි 29 වන වගන්තියේ 1 වන ඡේදය යටතේ, ශ්‍රී ලංකාව 2016 ජුනි සිට 2019 ජුනි දක්වා සිය වගකීම් ඉටු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග බලහත්කාරයෙන් අතුරුදහන් වූවන් පිළිබඳ කාරක සභාවට වාර්තා කළ යුතු විය. ICPPED යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඉදිරිපත් කිරීම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ කමිටුවට ඉදිරිපත් කරන ලද අතර, එහි පිටපතක් විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

2.44. WGIED 2016 දී ශ්‍රී ලංකාවට පැමිණ, අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් සිය බැඳීම් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කළේය[31] ඒ අනුව 2019 දී නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ලබා ඇති ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලංකාව වාර්තාවක් සැපයිය යුතු විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් WGIED වෙත නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ලබා ඇති ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ අතර එහි පිටපතක් 2019 සැප්තැම්බර් මාසයේදී විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.[32]

2.45. බලහත්කාරයෙන් අතුරුදහන් වූවන් පිළිබඳ කමිටුව විසින් අතුරුදහන් වූවන් සෙවීම සඳහා කෙටුම්පත් මාර්ගෝපදේශ මූලධර්ම (කෙටුම්පත් මාර්ගෝපදේශ මූලධර්ම) නිකුත් කළ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම්වලට ආරාධනා කළේය.[33] කෙටුම්පත් මාර්ගෝපදේශ මූලධර්ම ICPPED යටතේ ඇති වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම අරමුණු කර ගෙන ඇත. අතුරුදහන් වූවන් සෙවීම සඳහා වන ජාතික ආයතනයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, තමන් වෙත හෝ බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳ කමිටුවට ඉදිරිපත් කිරීම් යොමු කරන් ලෙස රාජ්‍ය නොවන සංවිධානවලට ඇරයුම් කළේය. තවද, මාර්ගෝපදේශයන්ට යටත් වන ප්‍රමිතිගත මූලධර්ම සහ ප්‍රායෝගිකව කොතරම් දුරට එවැනි මූලධර්ම ක්‍රියාත්මක කළ හැකිද යන්න පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තමන්ගේම ඉදිරිපත් කිරීම්ද කරන ලදී.[34]

### නෛතික සහ පරිපාලනමය මැදිහත්වීම

2.46. පුද්ගල නඩුවලදී නීතිමය ආධාර ලබාදෙන ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඉල්ලීම් ලැබිණි. විශේෂයෙන් අතුරුදහන් වූ පුද්ගලයින්ගේ සිවිල් හා සිවිල් නොවන පවුල් වෙතින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත සහය සඳහා වන ඉල්ලීම් ලැබිණි; එම ඉල්ලීම් අතරට රාජ්‍ය සේවාවන් වෙත පිවිසීම, මූල්‍ය සේවාවන් සහ වන්දි, මරණ සහතික සහ විශ්‍රාම වැටුප් ලබාගැනීම, පවතින නඩු, වත්කම් පිළිබඳ මතභේද, උරුමය සහ නැවත විවාහ වීම් යනාදී ඉල්ලීම් ඇතුළත් විය. එවන් ඉල්ලීම් ලැබීමෙන් පසුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, මෙතෙක් ගෙන ඇති පියවර සමාලෝචනය කළ අතර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සහ බැංකු වැනි රාජ්‍ය නොවන ආයතන සමඟ එක්ව ගත හැකි පසුවිපරම් ක්‍රියාමාර්ග පිළිබඳව ඇගයීමක් සිදු කළේය. වින්දිත සහ පවුල් සහය ඒකකය හා නීති කාර්ය මණ්ඩලය හැකි ලෙස ඒවාට මැදිහත් වූ අතර නීති උපදෙස් සහ ප්‍රායෝගික මාර්ගෝපදේශයන් සමඟ ඔවුන්ට සහය විය.

---

[30] එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය, "UN Treaty Body Database – Reporting Status for Sri Lanka" < https://tbinternet.ohchr.org/_layouts/15/TreatyBodyExternal/Countries.aspx?CountryCode=LKA&Lang=EN> (2020 ජනවාරි 5 දින පිවිසිණි).

[31] බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම "ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා නොවන සහ බලහත්කාරී අතුරුදහන් වීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ වාර්තාව",UN Doc A/HRC/33/51/Add.2 (2016) <https://ap.ohchr.org/documents/dpage_e.aspx?si=A/HRC/33/51/Add.2 > accessed 20 January 2020.

[32] ස්වේච්ඡා නොවන සහ බලහත්කාරී අතුරුදහන් කිරීම් **පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම පිරු සහ ශ්‍රී ලංකාව වෙත කළ සංචාරයන්ගේ පසුවිපරම -ස්වේච්ඡා නොවන සහ බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳ කණ්ඩායමේ වාර්තාව"UN Doc AHRC/42/40/Add.1 (10 September 2019)** < https://ap.ohchr.org/documents/dpage_e.aspx?si=A/HRC/42/40/Add.1> **accessed 10 January 2020.**

[33] බලහත්කාරයෙන් අතුරුදහන් වූවන් පිළිබඳ කමිටුව, අතුරුදහන් වූවන් සෙවීම සඳහා කෙටුම්පත් මාර්ගෝපදේශ මූලධර්ම පිළිබඳ ලිඛිත ඉදිරිපත් කිරීම් < https://www.ohchr.org/EN/HRBodies/CED/Pages/SearchDisappearedPersons.aspx > 2019 දෙසැම්බර් 31 පිවිසිණි.

[34] අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය, අතුරුදහන් වූවන් සෙවීම සඳහා කෙටුම්පත් මාර්ගෝපදේශ මූලධර්ම පිළිබඳ අදහස් (2019 ජනවාරි 25) <https://www.ohchr.org/Documents/HRBodies/CED/DraftGuidingPrinciplesSearch/SriLanka.pdf> 019 දෙසැම්බර් 31 පිවිසිණි.

2.47. පවුල්වලට දක්නට නොමැති බව පිළිබඳ සහතික ලබා ගැනීමට සහ ඔවුන්ගේ එම සහතික භාවිතා කරමින් සේවාවන් ලබා ගැනීමට සහ උපකාර කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මැදිහත් විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අතුරුදහන් වූවන්ගේ පවුල්වලින් ලැබුණු ඉල්ලීම් සම්බන්ධව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරීන් සමඟ මැදිහත් වී කටයුතු කළේය. රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරීන් සමඟ සම්බන්ධ වී දක්නට නොමැති බවට වන සහතික ලබාගැනීම සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කළ පවුල්වලට තනි තනිව සහය ලබාදීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකි විය. එමෙන්ම පවුල් සමඟ කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන දැනුවත් කිරීමද කරන ලදී.

2.48. එමෙන්ම, දක්නට නොමැති බවට වා සහතිකයක් භාවිතා කරමින් බැංකු සේවාවන්ට පිවිසීම සම්බන්ධයෙන් පවුල් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි පිළිබඳව කටයුතු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තනි දේශීය බැංකු වෙත මැදිහත් විය.

2.49. අතුරුදහන් වූවන්ගේ සමහර පවුල්, ඔවුන්ගේ අතුරුදහන් වූ ආදරණීයයන් සඳහා මරණ සහතික ලබා ගැනීමේදී ඇති වූ දුෂ්කරතා පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත දැනුම් දුන්හ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, එවැනි අවස්ථාවලට සහාය වීම සඳහා රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර්වරුන් සමඟ කටයුතු කළ අතර සමහර පවුල්වලට නීති උපදෙස් ලබා දී ඇත.

## 3. විමර්ශන, දත්ත පදනම සහ ආරක්ෂාව

3.1. අතුරුදහන් වූවන් සෙවීම සහ සොයා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සැපයීම සහ එවැනි පුද්ගලයින් අතුරුදහන් වූ අවස්ථා පැහැදිලි කිරීම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ එක් ප්‍රධාන අරමුණකි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විමර්ශන බලතල අතර අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි, ප්‍රකාශ සහ තොරතුරු ලබා ගැනීමේ බලය සහ මිනිස් මෘතදේහ කැණීම් හා ගොඩකිරීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයකට අයදුම් කිරීමේ බලය ඇතුළත් වේ. තවද, මිනිස් මෘත දේහ හැසිරවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විමර්ශන කාර්යයට අදාළව, අතුරුදහන් වූවන් සම්බන්ධ දත්ත එක්රැස් කර දත්ත සමුදායක් නිර්මාණය කිරීමේ අරමුණක්ද ඇත.

3.2. එහි මූලික අරමුණු අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් තනි පුද්ගල පරීක්ෂණ; සැක සහිත සොහොන් බිම් සහ හඳුනා නොගත් මිනිස් නටබුන් පිළිබඳ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ වලදී නිරීක්ෂණය කිරීම සහ නිර්දේශ කිරීම ඉදිරියට ගෙන යන ලදී.

3.3. පැමිණිලි ලැබීමට, දත්ත එක්රැස් කිරීමට හා දත්ත සමුදායක් ස්ථාපිත කිරීමට ඇති අරමුණ අනුව, වෙනත් රාජ්‍ය ආයතන විසින් යොමු කරන ලද නව පැමිණිලි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සකසන ලද අතර නව පැමිණිලි ලැබීමට තමන්ගේම ආකාරයක් සහ ක්‍රියා පටිපාටියක් සකස් කරන ලදී. මීට අමතරව, අතුරුදහන් වූවන් සම්බන්ධව වෙනත් රාජ්‍ය බලධාරීන් සහ ජාත්‍යන්තර ආයතන සතුව ඇති දත්ත වලට ප්‍රවේශවීමේ හා සැකසීමේ ක්‍රියාවලිය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ආරම්භ කරන ලදී. එමෙන්ම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තාවකාලික දත්ත ගබඩාවක් නිර්මාණය කළ අතර දත්ත සමුදායට එකතු කර ඇති තොරතුරු සැකසීමට හා ඇතුළත් කිරීම ආරම්භ කරන ලදී.

3.4. වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන අරමුණ අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් පුහුණු කාර්ය මණ්ඩලය බඳවා ගන්නා ලද අතර අදාළ ක්‍රියා පටිපාටි සකස් කර ආරක්ෂක ගැටළු මතුවන තනි පුද්ගල සිදුවීම්වලට මැදිහත්වීම් කරන ලදී.

### පැමිණිලි

3.5. අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ඥාතියෙකුගෙන් හෝ අතුරුදහන් වූවන් සම්බන්ධ වෙනත් පුද්ගලයෙකුගෙන් හෝ සංවිධානයකින්, එම අතුරුදහන් වීම සිදුවූ කාලය නොසලකා පැමිණිලි ලැබීමට අතුරුදහන් වූ

තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.[35] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමෙන් පසු නව පැමිණිලි ලැබීමේ ක්‍රියාවලිය මෙන්ම MNIR විසින් ඉදිරිපත් කර ඇති පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීම සහ සැකසීමද ආරම්භ කරන ලදී.

3.6. 2017 දී එවකට ජනාධිපති සිරිසේන අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව MNIR විසින් අතුරුදහන් වූවන්ගේ පවුල් අතර ප්‍රතිපෝෂණ දත්ත පත්‍රිකා බෙදා හැරියේය. අතුරුදහන් වූ පුද්ගලයෙකු පිළිබඳ තොරතුරු, පුද්ගලයා අතුරුදහන් වූ සන්දර්භය සහ තත්වයන්, ගන්නා ලද පසු විපරම් ක්‍රියාමාර්ග සහ අපේක්ෂා කරන ආධාර හෝ ප්‍රතිකර්ම පිළිබඳව පවුලේ සාමාජිකයෙකු විසින් දත්ත පත්‍රිකාවලට තොරතුරු සැපයිය යුතු විය. සම්පූර්ණ කරන ලද ප්‍රතිපෝෂණ දත්ත පත්‍රිකා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ඇතිව MNIR වෙත යොමු කරන ලදී. සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ලිපිගොනු 14,700 ක්[36] 2018 මාර්තු 15 දින අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත භාර දෙන ලදී.

3.7. 2018 දී පිහිටුවන ලද දින සිට, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රධාන කාර්යාලයට සෘජුවම පැමිණිලි 548 ක් ලැබී ඇති අතර ප්‍රාදේශීය කාර්යාලවලට ලිපිගොනු 530 ක් ලැබී තිබේ. 2019 කාලය තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය වින්දිත සහ පවුල් සහායක නිලධාරීන්ට පවුලේ සාමාජිකයින්ගෙන් සහ සාමාන්‍ය ජනතාවගෙන් පැමිණිලි වාර්තා කිරීම පිළිබඳ පුහුණුව ලබා දුන්නේය.

3.8. MNIR විසින් භාර දෙන ලද පැමිණිලි සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත කෙලින්ම ලැබුණු පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. අද වන විට, අතුරුදහන් වූවන් පිළිබඳ වාර්තා 5,038 ක් එහි දත්ත ගබඩාවට ඇතුළත් කර ඇත.

3.9. තවද, අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි ලැබීම සඳහා තුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් "අතුරුදහන් වූවන්ගේ දත්ත ආකෘතිපත්‍රය" යන නමින් නිල අයදුම්පතක් සකස් කරන ලදී. අතුරුදහන් වූවන්ගේ දත්ත ආකෘති පත්‍රය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය අදියර කිහිපයකට භාජනය වී ඇත. වෙනත් රටවල ඒ හා සමාන ආයතන විසින් අනුගමනය කරන ලද ප්‍රමිතීන්, දත්ත කළමනාකරණ උපදේශකයෙකුගේ උපදෙස් සහ ක්ෂේත්‍ර මට්ටමේදී පවුල්වල සහ කාර්ය මණ්ඩලයේ ප්‍රතිපෝෂණයන් දත්ත ආකෘති පත්‍රය සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගන්නා ලදී.

3.10. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි අතුරුදහන් වූවන්ගේ දත්ත ආකෘතිපත්‍රය නිර්මාණය කරන ලද්දේ, තම වැඩිම තොරතුරු ප්‍රමාණයක් එක් රැස් කරගැනීමේ අරමුණ සපුරාගැනීමේදී අදාළ පවුල් වෙත නැවත නැවත ගොස් ඔවුන්ව පීඩාවට සහ අපහසුතාවට පත් කිරීම වැළැක්වීම සඳහාය. උපරිම තොරතුරු රැස් කිරීම සඳහා ආකෘති පත්‍රයක් සංවර්ධනය කිරීමට පදනම් වූවේ වසරින් වසර අතුරුදහන් වූවන්ගේ පවුල් සාමාජිකයින් ගණන වැඩිවීම සහ ඉදිරියේදී තොරතුරු එක් රැස් කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නොහැකි වීමට ඉඩ ඇති බැවිනි.

3.11. 2018 වසරේදී දත්ත ආකෘති පත්‍ර යොදාගන්නා ලදී. ලැබුණු ප්‍රතිපෝෂණයෙන් මගින් දැක්වුණේ ආකෘති ඉතා සවිස්තරාත්මක වන බවත් සම්පූර්ණ කිරීමට දීර්ඝ කාලයක් ගතවන බවත් වන අතර එනිසාම සමහර ක්ෂේත්‍ර පිළිතුරු නොදී හිස්ව තැබීමට හේතු විය. ආකෘති පත්‍රය සැලසුම් කර ඇත්තේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නිලධාරියෙකු විසින් ඉතා මැනවින් හැසිරවීම සඳහා වුවත්, කාර්යාලය රට පුරා ව්‍යාප්තව නොමැති බැවින් මෙය ප්‍රායෝගික දුෂ්කරතා ඇති කළේය.

3.12. මෙම අභියෝගය ජය ගැනීම සඳහා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අතුරුදහන් වූවන් සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමේ මූලික මෙවලමක් ලෙස වඩා සරල දත්ත ආකෘති පත්‍රයක් සංවර්ධනය කළ අතර එය අනෙක් තොරතුරු එක් රැස් කිරීමේ මෙවලම් සමඟ භාවිතා කළ හැකි විය. එය සංවර්ධනය කරනු ලැබුවේ අතුරුදහන් වූ තැනැත්තෙකු පිළිබඳව වාර්තා කිරීමට අවශ්‍ය අවම තොරතුරු පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ සන්දර්භයන් සහ අවශ්‍යතාවයන්ට අනුකූලවයි.

---

[35] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 12 (අ) වගන්තිය.

[36] MNIR වෙතින් ලිපිගොනු 14,641 ක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ලැබී ඇති බව 2018 වාර්ෂික වාර්තාවේ 3.16 ඡේදයේ දැක්වෙයි. කෙසේ වෙතත්, අන්තර්ගතය සමාලෝචනය කිරීමෙන් පසුව සහ ගොනු ගණන නැවත ගණනය කිරීමෙන් පසුව එම අගය 14,700 දක්වා ඉහළ ගියේය.

අතුරුදහන් වූවන් පිළිබඳ මූලික දත්ත ආකෘති පත්‍රය මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කරන ලදී.

### අතුරුදහන් වූවන් සම්බන්ධ පවත්නා දත්ත එක්රැස් කිරීම

3.13. මේ වන විට, අතුරුදහන් වූවන් සහ අතුරුදහන් වූ සිද්ධීන් පිළිබඳ තොරතුරු විවිධ රාජ්‍ය ආයතන, ජාත්‍යන්තර සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සතුව ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ එක් අරමුණක් වන්නේ දැනට සිදුකෙරෙන ක්‍රියාවලීන් හෝ වෙනත් ආයතන, සංවිධාන, රාජ්‍ය දෙපාර්තමේන්තු, විමසුම් කොමිෂන් සභා සහ විශේෂ ජනාධිපති විමසුම් කොමිෂන් සභා මගින් ලබාගන්නා අතුරුදහන් වූවන් පිළිබඳ දත්ත එක් රැස් කිරීමත් ඒවා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය යටතේ ස්ථාපිත දත්ත පදනමක් තුළ මධ්‍යගත කිරීමත්ය.

3.14. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කටයුතු කඩිනම් කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් රැස් කරන ලද අදාළ තොරතුරු ඵලදායී ලෙස භාවිතා කරන බව සහතික කිරීමට එය පිහිටුවන ලද දින සිට, අතුරුදහන් වූවන් සම්බන්ධ පවත්නා දත්ත එක්රැස් කිරීමට උත්සාහයන් ගෙන ඇත. විශේෂයෙන්, පෙර විමසුම් කොමිෂන් සභා සහ වෙනත් රාජ්‍ය ආයතන විසින් රැස් කරන ලද දත්ත වලට ප්‍රවේශ වීමෙන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් දැනටමත් සිදු කර ඇති කටයුතු ද්විභාවිතය වලක්වා ගත හැකිය; එමෙන්ම පිළිතුරු ලබා දීමට සමත්ව නැති රාජ්‍ය ආයතන සහ විමර්ශන කොමිෂන් සභා සමඟ කටයුතු කිරීමෙන් වෙහෙසට පත්ව ඇති පවුල් වෙත නැවත යාමෙන් ඔවුන්ට ඇති වන වෙහෙස සහ අපේක්ෂා භංගත්වය වලක්වා ගත හැකිය; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධව පවුල් අතර වැඩි විශ්වාසයක් ඇති කරගත හැකිය.

3.15. මානව හිමිකම් උල්ලංඝනය කිරීම්, ස්වේච්ඡාවෙන් ඉවත් කිරීම සහ අතුරුදහන් වීම් සම්බන්ධව විමසුම් කොමිෂන් සභා වාර්තා ජනාධිපති මුද්‍රාව යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ (DNA) වසර තිහක කාලයක් සඳහා ගබඩා කර ඇත. 2018 අප්‍රේල් 27 දිනැති ලිපියක් මගින්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එවකට අතිගරු ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතාගෙන් ඉල්ලා සිටියේ තෝරාගත් විමර්ශන කොමිෂන් සභා වාර්තා වෙත ප්‍රවේශ වීමට හා ඒවා ඩිජිටල්කරණය කිරීමට අනුමැතිය ලබා දෙන ලෙසයි. එවකට ජනාධිපතිවරයාගේ ලේකම් විසින් 2018 මැයි 9 දිනැති ලිපිය මගින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අනුමැතිය ලබා දී DNA සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නිර්දේශ කරන ලදී. මෙම වාර්තා පරිශීලනය කිරීමේ හා ඩිජිටල්කරණ ක්‍රියාවලිය සඳහා අනුමැතිය එවකට ජනාධිපති ලේකම් උදය ආර්. සෙනෙවිරත්න මහතා විසින් 2019 ජනවාරි 11 දිනැතිව ලිපියක් මගින් නැවත නිකුත් කරන ලදී. 2019 මැයි 24 දිනැති ලිපිය මගින් DNA අයත්වන නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යන ලෙස DNA වෙත තවදුරටත් උපදෙස් ලබා දෙනු ලැබිණි.

3.16. මෙම අනුමත කිරීම් වලට අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2019 ජූලි 22 දින DNA සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

3.17. අතුරුදහන් වූවන් පිළිබඳ තොරතුරු වෙනත් රාජ්‍ය ආයතනවලින් ද මෙම කාර්යාලය වෙත ලැබී තිබේ. අතුරුදහන් වූවන්ගේ ලැයිස්තු ගණනාවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ඉදිරිපත් කර ඇති අතර, එහි ඇතුළත් කිරීම් 5,472 කි. ත්‍රිවිධ හමුදාව විසින් ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ අතුරුදහන් වූ සාමාජිකයින් පිළිබඳ ලැයිස්තු ගණනාවක් ඉදිරිපත් කර ඇත. ඒවායේ ඇතුළත් කිරීම් 3,742 ක් ඇත.

3.18. අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් ලැබී ඇති සියලුම වාර්තා WGIED විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබේ. අතුරුදහන් වූවන් පිළිබඳ වාර්තා 12,664 ක් 2019 දී විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට යොමු කරන ලද අතර, එයට පැහැදිලි නොකළ වාර්තා 6,066 ක් සහ පැහැදිලි කළ වාර්තා 6,598 ක් ඇතුළත් වේ.[37] අතුරුදහන් වූ පුද්ගලයාගේ

[37] WGIED ට අනුව, අතුරුදහන් වූ පුද්ගලයෙකු පිළිබඳ වාර්තාවකට ප්‍රතිචාර වශයෙන් රජයක් තොරතුරු සැපයීමට අපොහොසත් වූ විට නඩු "පැහැදිලි නොකළ" ලෙස වර්ගීකරණය කර ඇත. අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ ඉරණම පිළිබඳව රජයක් ප්‍රතිචාරයක් දක්වන විට වාර්තා "පැහැදිලි" ලෙස වර්ගීකරණය කෙරේ.

ඉරණම එතැන් සිට තහවුරු වී ඇති අවස්ථා හඳුනා ගැනීමෙන් සහ අනුපිටපත් කිරීම සඳහා තනි ලිපිගොනු හරස් පරීක්ෂාවෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් වාර්තා සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

### දත්ත පදනම

3.19. ඉහත සඳහන් කළ පරිදි, අතුරුදහන් වූවන් සම්බන්ධ සියලු දත්ත ශ්‍රී ලංකාව තවමත් මධ්‍යගත කර නොමැති අතර අතුරුදහන් වූ හෝ අතුරුදහන් වූ මුළු පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ නිල සංඛ්‍යා ලේඛනද නැත. මෙම අභියෝගයට මුහුණ දීම සඳහා, බහුවිධ ආයතන සතුව ඇති දත්ත එක්රැස් කිරීම, ඒවායේ දත්ත නිරවද්‍යතාව තහවුරු කිරීම සහ ද්විත්ව පිටපත් වාර්තා පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. තවද, සැකසූ පසු, අතුරුදහන් වූවන් පිළිබඳ නිල වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා දත්ත පදනමක් තුළ තොරතුරු කේන්ද්‍රගත කිරීම සහ විමර්ශන පැවැත්වීම සිදු කළ යුතුය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත යටතේ, අතුරුදහන් වූවන් පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් විය යුතු දත්ත සමුදායක් නිර්මාණය කිරීමට, කළමනාකරණය කිරීමට හා නඩත්තු කිරීමට මෙන්ම එහි සියලුම දත්ත පදනම් සහ දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන සියලුම පියවරයන්, තාක්ෂණික ආරක්ෂාවන්ද ඇතුළුව, ගැනීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලට පැහැදිලිවම බලය ඇත.

3.20. 2019 කාලය තුළ OMP සිය දත්ත සමුදාය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ක්‍රියාවලිය දිගටම කරගෙන යන ලදී; තාවකාලික දත්ත පදනමක් නිර්මාණය කර ක්‍රියාත්මක කර ඇති අතර පුළුල් පදනමක් සඳහා අවශ්‍යතා සිතියම් ගත කර ඇත.

3.21. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ දත්ත සමුදාය කළමනාකරණය කරනු ලබන්නේ එහි දත්ත කළමනාකරණ ඒකකය වන අතර එය දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරුවන් පස් දෙනෙකුගෙන් සහ දත්ත කළමනාකරණ ප්‍රධානියාගෙන් සමන්විත වේ. දත්ත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලීන් ඇතුළුව ධාරිතා වර්ධනය අරමුණු කරගත් පුහුණු සැසි මාලාවක් මෙම ඒකකය හරහා ක්‍රියාත්මක වී තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2019 ඔක්තෝම්බර් මාසයේදී දත්ත කළමනාකරණ ප්‍රධානියා පත් කරන ලද අතර එහි කටයුතු බාධාවකින් තොරව කරගෙන යන බව සහතික කරමින් මේ වන විට එම ඒකකය සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ නිරත වී සිටී.

3.22. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වූ පුද්ගලයින්, සිදුවීම් සහ සොහොන් බිම් සම්බන්ධ ලේඛන තුනකින් සමන්විත තාවකාලික දත්ත ගබඩාවක් නිර්මාණය කර ඇති අතර, පැමිණිලිකරුවන්ගෙන් සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලින් ලබාගත් දත්ත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබේ. තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පුළුල් හා ස්ථිර දත්ත සමුදායක් සඳහා අවශ්‍යතා සිතියම් ගත කරමින් සිටී.

3.23. ඉහත සඳහන් කළ පරිදි, MNIR, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, WGIED සහ සෘජුවම පවුලේ සාමාජිකයින් වෙතින් ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් ද ඇතුළුව අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන් පිළිබඳ ලැයිස්තු, වාර්තා සහ පැමිණිලි ලැබී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ වාර්තා 37,491 ක් සැකසීමේ නියැලී සිටී. අතුරුදහන් වූවන් පිළිබඳ වාර්තා 5,038 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය දත්ත ගබඩාවට ඇතුළත් කර ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සත්‍යාපන ක්‍රියාවලියේ වැදගත් අංගයක් වන්නේ සපයන ලද තොරතුරු වල නිරවද්‍යතාවය සහතික කිරීම සහ වාර්තා අතර අනුපිටපත් සත්‍යාපනය කිරීමයි.

3.24. ලැබුණු පැමිණිලිවල අවම තොරතුරු දත්ත පදනමට ඇතුළත් කෙරෙන බව සහතික කිරීමට, 2019 දෙසැම්බරයේදී දත්ත සැකසීමට වෙනත් අංශවලින් තාවකාලිකව කාර්ය මණ්ඩලය වෙන් කරගෙන අවශ්‍ය කාර්ය මණ්ඩලය අතිකාල සේවා සඳහාද යොදවාගනිමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කරන ලදී. අතුරුදහන් වූවන්ගේ තාවකාලික ලැයිස්තුවක් සකස් කිරීම සඳහා මෙම ක්‍රියාවලිය කඩිනම් කරන ලද අතර එය 2020 දී ප්‍රසිද්ධ කෙරෙනු ඇත. අතුරුදහන් වූවන්ගේ

පවුල්වලට සහ අනෙකුත් මහජනතාවට ඔවුන්ගේ අතුරුදහන් වූ ආදරණීයයන්ගේ තොරතුරු තාවකාලික ලැයිස්තුවේ නිවැරදිව සටහන් කර ඇති බවට සහතික කර ගැනීමට ආරාධනා කරනු ලැබේ.

### විමර්ශන

3.25. ප්‍රධාන නඩු වලට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දිගින් දිගටම විමර්ශනය කරන ලදී; මන්නාරම සමූහ මිනීවළ විමර්ශනයට සහාය වීම; සහ සැක සහිත සොහොන් බිම් ඇතුළුව මිනිස් දේහයන් හැසිරවීම සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීමට මැදිහත් වීම ඒ අතර වෙයි.

3.26. අතුරුදහන් වූවන්ගේ පවුල් සහ රජයේ හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු විවිධ මූලාශ්‍රයන්ගෙන් අතුරුදහන් වූවන් පිළිබඳ තොරතුරු සහ පැමිණිලි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත අඛණ්ඩව ලැබුණි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ 12 (ආ) (ii) සහ (iii) වගන්තිවලට අනුව, සැලකිය යුතු ලෙස ලේඛනගත කර ඇති සහ මහජන වැදගත්කමක් ඇති සිදුවීම්වල, අතුරුදහන් වීමේ රටාවන් සහ සන්දර්භයන් විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කළේය. තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ක්ෂේත්‍ර චාරිකාවේ නිරත වීම ඇතුළුව මූලික විමසීම් පවත්වන ලදී.

3.27. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අදාළ පාර්ශවයන් සමඟ සම්මුඛ සාකච්ඡා සහ රැස්වීම් පැවැත්වූ අතර අතුරුදහන් වූවන්ගේ සිදුවීම් පිළිබඳ තොරතුරු රැස් කළේය. මීට අමතරව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙනත් රාජ්‍ය බලධාරීන්ගෙන් වැඩිදුර තොරතුරු ඉල්ලා සිටියේය.

3.28. පරීක්ෂණ සඳහා සැලකිය යුතු තාක්ෂණික විශේෂඥතාවයක් අවශ්‍ය බැවින්, අතුරුදහන් වූවන් සෙවීමේදී අධිකරණ මානව විද්‍යාව සහ අධිකරණ පුරාවිද්‍යාව භාවිතා කිරීම ඇතුළු ක්‍රම හරහා පරීක්ෂණ පැවැත්වීම සඳහා ආයතනික හැකියාව වැඩි දියුණු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම සම්පත් කැප කළේය. විශේෂයෙන්, සැලසුම් කිරීම, විමර්ශනය සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි සහ සම්පත්, අතුරුදහන් වූවන් සිටින ස්ථානය හඳුනා ගැනීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයන් සහ කැණීම්, මිනිස් සිරුරු ගොඩ ගැනීම සහ ඒවා හඳුනාගැනීමට අධිකරණ වෛද්‍ය විද්‍යාව භාවිතා කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ක්‍රියාකාරීන්ගෙන් තාක්ෂණික විශේෂඥ දැනුම හා පුහුණුව ලැබිණි.

### හඳුනානොගත් මෘත දේහ සොයා ගැනීම

3.29. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විමර්ශන බලතල යටතේ, කැණීම් හෝ කැණීම් වලදී නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයකට අයදුම් කිරීමට එයට බලය ඇත.[38] මෘත දේහ හැසිරවීම සම්බන්ධයෙන් රාජ්‍ය බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමටත්, අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ උනන්දුව ආරක්ෂා කිරීමටත් එයට නිශ්චිත බලයක් ඇත.[39] 2019 කාලය තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෘත දේහ සම්බන්ධව ඉදිරියට යන අධිකරණ ක්‍රියාමාර්ග තුනකට මැදිහත් විය.

3.30. මඩකලපුවේ කුරුක්කල්මඩම්හි සැක සහිත මිනීවල සම්බන්ධව වන අංක 172/2014 දරන නඩුවේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නියෝජිතයෙකු සමඟ එම සැක සහිත මිනීවල නැරඹීමටඅවසර ඉල්ලමින් කලවංචිකුඩි මහේස්ත්‍රාත් අධිකරණයේ ගරු මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කිරීමක් කරන ලදී.

3.31. 2019 ඔක්තෝබර් මාසයේදී පුදුකුඩුඉරිප්පු ප්‍රදේශයේ මිනිස් අවශේෂ හමු වූ අතර එය නඩු අංක AR/808/19 යටතේ මුලතිව් මහේස්ත්‍රාත්වරයා ඉදිරියේදී විමර්ශනයට භාජනය වෙමින් ඇත. එම ස්ථානය ආරක්ෂා කරන ලෙසත්, මෘත දේහ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙසත් මහේස්ත්‍රාත්වරයා ප්‍රාදේශීය පොලිසියට නියෝග කර ඇත. තවද, දේහය පරීක්ෂා කරන ලෙස මහේස්ත්‍රාත්වරයා අධිකරණ වෛද්‍ය නිලධාරියාට නියෝග කර තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ 12 (ඇ) වගන්තිය යටතේ, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එම නඩු කටයුතුවල නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කිරීම සඳහා සාර්ථක

[38]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 12 (ඇ) වගන්තිය.

[39]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1)(iii), 10 (ඇ) වගන්තිය.

ඉල්ලීමක් කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරයකු සහ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු මහේස්ත්‍රාත්වරයා එම ස්ථානයට පැමිණීම නිරීක්ෂණය කළ අතර විමර්ශනය ඉදිරියට ගෙන යාම සඳහා ගත යුතු පියවර පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කළේය.

3.32. 2018 නොවැම්බර් මාසයේදී මන්නාරමේ තිරුකේතීස්වරන් හි සැක කටයුතු මිනීවල විමර්ශනය කිරීමේ B768/13 නඩුවෙහි නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. පසුගිය වසර පුරා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නඩුව දිගටම නිරීක්ෂණය කර, අධිකරණ මානව විද්‍යාඥයින්ගේ සහාය ඇතිව මෙතෙක් සිදු කර ඇති විමර්ශනයේ ප්‍රගතිය සමාලෝචනය කළ අතර, පවුල් නියෝජිතයින් ඇතුළු අදාළ පාර්ශවකරුවන් සමඟ සොයා ගැනීම් සාකච්ඡා කළේය.

## මන්නාරම සමූහ මිනීවල

3.33. 2018 මාර්තු 22 වන දින මන්නාරම් නගරයේ සතොස ගොඩනැගිල්ලේ අස්ථි කොටස් ප්‍රමාණයක් සොයා ගන්නා ලදී. මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණ නියෝගයකට අනුව, විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි මන්නාරම් නගරයේ සතොස ගොඩනැගිල්ලේ සැකකටයුතු සොහොන් බිම කැණීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මන්නාරම මහේස්ත්‍රාත්වරයා වෙත කරන ලද ඉල්ලීමකට අනුව, 2018 ජුනි 4 වන දින සැක සහිත සොහොන් බිම කැණීමේදී නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අවසර ලැබිණි. එතැන් සිට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එම ක්‍රියාවලිය නිරීක්ෂණය කරමින් සිටී.

3.34. මන්නාරමෙහි සැකකටයුතු සමූහ මිනී වළ පිළිබඳ පරීක්ෂණ සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විවිධ මට්ටම්වලින් සහාය ලබා දී ඇත.[40] දින 155 ක් පුරා සිදු කෙරුනු විමර්ශනය අතර ශරීර 325 ක අස්ථි කොටස් සොයා ගනු ලැබිණි. කැණීම් කණ්ඩායමේ ආහාර, නවාතැන් හා කැණීම් කණ්ඩායමේ විවිධ භාණ්ඩවල පිරිවැය සහ මෝසම් වැසි වලින් වෙබ් අඩවිය ආරක්ෂා කිරීම සඳහා ටාපෝලින් ආවරණ සඳහා වන වියදම් ආවරණය කරමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් විසින් කැණීම් සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදී.

3.35. තවද, එම ස්ථානයෙන් කැණීම් කරන ලද අස්ථි හා දත් සාම්පලවල විකිරණශීලී කාබන් දින ගණනය කළ යුතු යැයි විමර්ශන කණ්ඩායම තීරණය කළ විට, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එම සාම්පලවල හිමිකාරීත්වය සහතික කිරීමට උපයෝගී කරගත හැකි ක්‍රියාමාර්ග සහ මාධ්‍ය මගින් තේරීම් ක්‍රියාවලියට පිවිසීම හා අතුරුදහන් වූවන්ගේ පවුල්වල නියෝජිතයින් සම්බන්ධ නිර්දේශ සපයන ලදී. විමර්ශනයේ නිරීක්ෂකයෙකු ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරු 2018 දෙසැම්බර් 18 සිට 21 දක්වා අස්ථි හා දත් සාම්පල තෝරා ගැනීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කළහ.

3.36. විමර්ශනයේ ක්‍රියාවලිය හා ප්‍රතිඵල පිළිබඳ මහජන විශ්වාසය සහතික කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය නිර්දේශ ඉදිරිපත් කළේ ය. කැණීම් හා මෘත දේහ ගොඩ ගැනීම ඇතුළු විමර්ශන ක්‍රියාවලියට මාධ්‍යයේ සහ පුරවැසි කමිටුවේ සාමාජිකයින්ට ප්‍රවේශය සහතික කිරීමෙන්, දැනුවත්භාවය ඇති කිරීමට සහ විනිවිදභාවයට පහසුකම් සැලසීමට හැකි බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි. විශේෂයෙන්, එවැනි ප්‍රවේශයක් සහතික කිරීම පවුල්වල කැමැත්ත සහ රාජ්‍ය මැදිහත්කරුවන්ගේ ඵලදායී පරීක්ෂණ පැවැත්වීමේ හැකියාව පිළිබඳ විශ්වාසය සුරක්ෂිත කිරීම සඳහා වැදගත් බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි. ශ්‍රී ලංකාවේ වර්තමාන නෛතික රාමුව, විමර්ශන ක්‍රියාවලියට

[40]මන්නාරම සමූහ මිනි වලේ අස්ථි සාම්පල කාබන් දින ගණනය සඳහා ජාත්‍යන්තර රසායනාගාරයකට ලබාදීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරයි, මාධ්‍ය නිවේදනයි (2019 ජනවාරි 30)<https://www.facebook.com/ompsrilanka/photos/a.2177156629210232/2232615643664330/?type=3&theater > 2019 මැයි 29 පිවිසිණි.

සහභාගී වීමට සහ දැනුම්වත් වීමට අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුලේ සාමාජිකයින්ට ඇති අයිතිය පිළිගන්නා බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි.[41]

3.37. 2019 ජනවාරි 18 වන දින වෙබ් අඩවියෙන් තෝරාගත් සාම්පල ඇමරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩා හි මයාමි හි පිහිටි බීටා ඇනලිටික්ස් හි රසායනාගාරයේ විකිරණ කාබන් දින ගණනය සඳහා යවන ලෙස මන්නාරම් මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. සාම්පල හය, බීටා ඇනලිටික්ස් නම් ඇමරිකා එක්සත් ජනපදයේ මයාමි හි රසායනාගාරයේ කාබන් දින ගණනය සඳහා වන පිරිවැය සහ මන්නාරම අධිකරණ වෛද්‍ය නිලධාරිගේ ගමන් වියදම් සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල මූල්‍යමය වශයෙන් සහාය විය. තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරයකු සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල නෛතික නියෝජිතයින් දෙදෙනෙකු අධිකරණ වෛද්‍ය නිලධාරියා සමඟ මියාමි වෙත ගොස් අස්ථි රසායනාගාරයට භාර දීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කළහ.

3.38. සොහොන් පිටියේ නියෝජිත සාම්පලවල කාබන් දින ගණනය කිරීමේ ප්‍රතිඵලවලින් පෙනී යන්නේ දේහය ක්‍රි.ව. 1499-1719 දක්වා වූ ඓතිහාසික යුගයකට අයත් බවයි. කාබන් දින ගණනයේ ප්‍රතිඵල ලැබෙන අවස්ථාවේදී, පරීක්ෂණ කණ්ඩායම රසායනාගාර පරීක්ෂණවල ප්‍රතිඵල සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය බලධාරීන්ගෙන් වාර්තා බලාපොරොත්තුවෙන් සිටි අතර කැණීමෙන් ලද වෙනත් සාක්ෂි තවදුරටත් විශ්ලේෂණය කරන ලෙස ඉල්ලා සිටියේය.

3.39. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2019 මාර්තු 20 වන දින මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයට නිර්දේශ කර ඇත්තේ විමර්ශන කාලය තුළ ජනනය කර ඇති අනෙකුත් සියලුම තොරතුරු සහ සාක්ෂි විශ්ලේෂණය කිරීමෙන් කාබන් දින ගණනයේ ප්‍රතිඵල සලකා බැලිය යුතු බවයි. තවද, විමර්ශන කණ්ඩායම විසින් වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව විමර්ශනයේ අනාගත ගමන් මාර්ගය තීරණය කළ යුතු බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සටහන් කරන ලදී. මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තාව ඉදිරිපත් කළ පසු, අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින් සහ සාමාන්‍ය ජනතාවට වාර්තාවට ප්‍රවේශ වීම පහසු කිරීම සඳහා එය වාර්තාගත කරන ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තවදුරටත් නිර්දේශ කළේය.

3.40. 2019 මාර්තු මාසයේදී මන්නාරම මහේස්ත්‍රාත්වරයා විසින් මේ දක්වා විමර්ශනය අතරතුර ජනනය කරන ලද සියලු සාක්ෂි විශ්ලේෂණයන් ඇතුළත් වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස නියෝග කළේය. විමර්ශන කණ්ඩායම විසින් වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිතව තිබියදී මහේස්ත්‍රාත්වරයා විසින් කැණීම් නැවැත්වීම පිණිස වන තාවකාලික නියෝගය දීර්ඝ කරන ලදී. මෙම නියෝගයන් පනවනු ලැබුවේ මහේස්ත්‍රාත්වරයා විසින් මන්නාරම අධිකරණ වෛද්‍ය නිලධාරිගේ ප්‍රධානත්වයෙන් පුරාවිද්‍යාඥයින්, පොලිසිය (අපරාධ ස්ථාන නිලධාරීන් ඇතුළුව), අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල නියෝජිතයින් සහ අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලය සමඟ කැඳවූ හමුවීමකින් අනතුරුවය.

3.41. උසාවියේ නියෝගයන්ට අනුකූලව, කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පුරාවිද්‍යා ආයතනයේ පුරාවිද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව විසින් වාර්තාව සකස් කිරීම ආරම්භ කරන ලදී. පර්යේෂණ සහායකයින් සිව් දෙනෙකු රඳවා තබා ගැනීම සඳහා මූල්‍ය ආධාර ලබා දීමෙන් අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලය කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහාය ලබා දුන්නේය.

3.42. සවිස්තරාත්මක වාර්තාව 2019 ජුනි 30 දින අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 වන විට ඇතැම් කෞතුක වස්තු විමර්ශන කණ්ඩායමට ලබා දී නොමැති බැවින් වාර්තාව නිකුත් කිරීම ප්‍රමාද වී ඇත.

## වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම

[41] 1979 අංක 15 අපරාධ නඩු විධාන සංග්‍රහය, 260 වගන්තිය; 2015 අංක 4 දරණ අපරාධ හා සාක්ෂිකරුවන්ගේ වින්දිතයින්ට සහාය වීම සහ ආරක්ෂා කිරීම, 3 (උ), 3 (ඊ) (ii), 3 (ඊ) (iii), 7; 2018 අංක 5 දරණ බලහත්කාරයෙන් අතුරුදහන් වීම් වලින් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය 14 (1) වගන්තිය.

3.43. වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා පද්ධතියක් සංවර්ධනය කිරීමට සහ බලාත්මක කිරීමට අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.[42] අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාල කාර්ය මණ්ඩලයේ සහ එහි පරිශ්‍රයන්හි ආරක්ෂාව සහතික කිරීම එහි ආරක්ෂණ ඒකකයට පැවරී තිබේ. 2019 කාලය තුළ අතුරුදහන් වූ තැනත්තන් පිළිබඳ කාර්යාලය දක්ෂ හා පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට උත්සාහ කළේය; ආරක්ෂණ ඒකකය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම සහ පවුල්, යුක්තිය සහයෝගිතාකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මැදිහත් වීමක් සිදු කරන ලදී.

3.44. ආරක්ෂක අංශ ප්‍රධානියෙකු සහ කළමනාකරණ සහකාරවරයෙකු 2019 ජූලි මාසයේදී පත් කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ආරක්ෂණ ඒකකය සඳහා අමතර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් සිටී.

3.45. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ආරක්ෂණ අවශ්‍යතා ලේඛනගත කිරීම සහ නඩු කටයුතු කළමනාකරණය පිළිබඳ ක්‍රියා පටිපාටි සකස් කරන ලදී. තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල මූලස්ථානයේ සහ එහි ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය සහ පරිශ්‍රයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වැළැක්වීමේ පියවරයන් අනුගමනය කරන ලදී.

3.46. ඉහත සඳහන් කළ පරිදි, 2019 පෙබරවාරි මාසයේදී ආරක්ෂක ලේකම් විසින් ශ්‍රී ලංකා හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාවට මෙන්ම පොලීසියට ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කරන ලද යුක්තිය සම්බන්ධ සියලු නිර්දේශයන්ට අනුකූල වන ලෙස ආරක්ෂක ලේකම් විසින් විධාන කරනු ලැබීය. ඊට ප්‍රතිචාර වශයෙන් ත්‍රිවිධ හමුදාවේ අණ දෙන නිලධාරීන් සහ පොලිස්පතිවරයා විසින් අතුරුදහන් වූවන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා පියවර ගන්නා ලෙස සහ අනෙකුත් අධිකරණ සහයෝගීතාවන්ට අදාළ නිලධාරීන්ට උපදෙස් දුන් බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තවදුරටත් සඳහන් කරයි.

3.47. ආරක්ෂක ලේකම්, ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් ලබා දෙන සහයෝගීතාවය සඳහන් කරන අතරම, අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සහ යුක්ති සහයෝගිතාකරුවන්ට එරෙහිව ආරක්ෂක අංශයේ සාමාජිකයින් විසින්ද කරන ලද බිය ගැන්වීම් සහ සෝදිසි කිරීම් පිළිබඳ වාර්තා අඛණ්ඩව ලැබෙමින් පවතින බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දැඩි කනස්සල්ලෙන් යුතුව සඳහන් කරයි. 2019 දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පවුල්, යුක්තිය සහයෝගිතාකරුවන් සහ එහි කාර්ය මණ්ඩලයෙන් පැමිණිලි ගණනාවක් වාර්තා කර ඇත. කායික හා වාචික පහරදීම්, තර්ජන සහ බිය ගැන්වීම්, සෝදිසි කිරීම් සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා සිදුකෙරෙන ප්‍රහාරයන් හා තර්ජන සම්බන්ධ පැමිණිලි ඒ අතර වෙයි. මෙම පැමිණිලි වලට ප්‍රතිචාර වශයෙන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෙම ගැටළු විසඳීම සඳහා අදාළ බලධාරීන්ට මැදිහත් විය.

3.48. තවද, පැහැරගැනීම් සම්බන්ධව දැනට පවතින අධිකරණ ක්‍රියාමාර්ගවල නියැලී සිටින නීති නියෝජිතයින්, යුක්තිය සහයෝගිතාකරුවන් සහ පවුලේ සාමාජිකයින්ට එරෙහි ප්‍රහාර සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පැමිණිලි ලැබුණි. ඊට ප්‍රතිචාර වශයෙන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශේෂිත අවස්ථාවන්ට මැදිහත් වී අදාළ පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ විමර්ශනවල ප්‍රගතිය සහ නීතිමය කටයුතු සහතික කිරීම සඳහා බලධාරීන් සමඟ සාකච්ඡා කළේය.

## 4. ආයතනික සංවර්ධනය

4.1. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය කාර්යාලය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පසුගිය වසර පුරා සැලකිය යුතු අවධානයක් හා සම්පත් ප්‍රමාණයක් කැප කළේය. එහි දෙවන වසර තුළදී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වඩාත් බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම මගින් පවුල්වලට වඩාත් ප්‍රවේශ විය හැකි ලෙස ස්ථාපිත වූ අතර කොළඹ පිහිටි එහි මූලස්ථානයේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කළේය. තවද, අවශ්‍ය නිපුණතා හා පළපුරුද්ද සහිත ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට සහ අභ්‍යන්තර නීති රීති හා ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ

[42] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (උ), 18 වගන්තිය.

කාර්යාලය සැලකිය යුතු උත්සාහයක් දැරීය. තවද, අභ්‍යන්තර නීතිරීති හා ක්‍රියා පටිපාටි සහ පුහුණුව ඇතුළුව එහි සියලුම ආයතනික සංවර්ධන ප්‍රයත්නයන්හි දී, මූලික සලකා බැලීමක් ලෙස පවුල්වලට සෑම විටම සංවේදීතාව, ගෞරවය සහ අභිමානය දැක්විය හැකි බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහතික කළේය.

4.2. අනුමත රජයේ වැටුප් පරිමාණයන්හි කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය බරපතල අභියෝගයන්ට මුහුණ දුන් අතර එය අවශ්‍ය කුසලතා හා පළපුරුද්ද සහිත අපේක්ෂකයින් ආකර්ෂණය කර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවීය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය මූලික අරමුණු ඵලදායි ලෙස ඉටු කිරීමට හැකියාව ඇති පළපුරුදු, දක්ෂ පුද්ගලයින් බඳවා ගත හැකි බව සහතික කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ දිගටම සාකච්ඡා පවත්වයි. අයවැය යටතේ වෙන් කර ඇති අරමුදල් සම්පූර්ණයෙන් භාවිතා කිරීමේ හැකියාව සීමා කර ඇති රජයේ ක්‍රියා පටිපාටික රීති හා රෙගුලාසි මගින් ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සීමා කර ඇත.

4.3. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සංවර්ධනයට මග පෙන්වීම සඳහා සභාපති සහ කොමසාරිස්වරු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ අතර ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා එකවර විවිධ මට්ටම්වල නිරත වූහ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සංවර්ධනයන් සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරව හමුවිය. 2019 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය රැස්වීම් පහළොවක් සහ කොමසාරිස් රැස්වීම් විස්සක් පවත්වා ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත උපායමාර්ගික මග පෙන්වීමක් ලබා දීමට අමතරව, සියලුම ඒකක ප්‍රධානීන් පත් කරන තෙක් කොමසාරිස්වරුන්ට එහි තනි ඒකක අධීක්ෂණය කිරීමට සිදුවිය. ස්ථිර කාර්ය මණ්ඩලයේ හිඟකම හේතුවෙන් කොමසාරිස්වරුන්ට විමර්ශන පැවැත්වීම, ක්ෂේත්‍ර චාරිකා, කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සහ පවුල්, සිවිල් සමාජය සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සමඟ සම්බන්ධ වීම වැනි ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට ද සිදුවිය.

### භෞතික පරිශ්‍රය ස්ථාපිත කිරීම

4.4. 2018 ඔක්තෝම්බර් මාසයේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කොළඹ 7 හි ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත අංක 32 හි පිහිටි "ශ්‍රාවස්ති සංකීර්ණය" වෙත ගෙන යන ලදී. මෙම පරිශ්‍රය ගරු පාර්ලිමේන්තු කථානායකවරයාගේ විෂය පථයට අයත් වන අතර, වසර දෙකක කාලයක් එම පරිශ්‍රයේ රැඳී සිටීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අනුමැතිය ලබා දෙන ලදී.

4.5. 2019 ජූලි මාසයේ දී, ශ්‍රාවස්ති සංකීර්ණය පිළිබඳ විශේෂයෙන් පිහිටුවන ලද කමිටුවක් අතර පැවති රැස්වීමකදී, නියෝජ්‍ය කථානායක ගරු ආනන්ද කුමාරසිංහ මහතා කොළඹ ආනන්ද කුමාරස්වාමි මාවත පිහිටි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල වෙත අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ගෙන යන ලෙසට යෝජනා කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල කොමසාරිස්වරු සහ කාර්ය මණ්ඩලය, ගොඩනැගිල්ල පරීක්ෂා කළ අතර දේපල සම්බන්ධ නොවිසඳුණු ගැටළු හේතුවෙන් එම ඉඩම කුලියට නොගැනීමට තීරණය කළහ. තවද, අදාළ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිවලට අනුකූලව විකල්ප පරිශ්‍රයක් ලබා ගැනීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දිගටම පියවර ගත්තේය

4.6. පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතාගේ උපදෙස් පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් වරින් වර අවශ්‍ය පරිදි ගොඩනැගිල්ල සහ දේපළ අලුත්වැඩියා කරන ලදී. අඛණ්ඩ කාන්දුවීම් වැනි පරිශ්‍රයන්හි බරපතල ගැටළු වලට විසඳුම් සෙවීමේ අවශ්‍යතාවය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මහලේකම්වරයාට දැනුම් දෙනු ලැබුවද, ගොඩනැගිල්ලේ සැලකිය යුතු ඓතිහාසික බවට හානිවන හෝ වෙනත් හානියක් සිදු නොවන කිසිදු අලුත්වැඩියාවක් සිදු නොකිරීමට සහතික විය.

### කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

4.7. පළමු වසර තුළ තාවකාලික කාර්ය මණ්ඩලයක් පමණක් බඳවා ගැනීමට හැකි වූ බැවින්, දෙවන වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් කැප කර ඇත.

4.8. එහි යෝජිත ආයතනික ව්‍යුහයට අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ලේකම් ධුරය විධායක අධ්‍යක්ෂවරයෙකු විසින් ප්‍රතිස්ථාපනය කළ යුතුය. 2019 දෙවන භාගය තුළ OMP විධායක අධ්‍යක්ෂ ධුරය සඳහා දැන්වීම් පල කළ අතර අයදුම්පත් සමාලෝචනය කර අපේක්ෂකයින් සම්මුඛ සාකච්ඡා කළේය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමෙන් පසු එහි ලේකම් ලෙස සේවය කළ එම්. අයි. එම්. රෆීක් මහතා 2019 ජුනි 30 දින සිය ධුර කාලය සම්පූර්ණ කළේය. 2019 ජුනි 30 දින සිට සී. එස්. පුලෝකසිංහම් මහතා ලේකම්ගේ රාජකාරි ආවරණය කිරීම සඳහා නම් කරන ලදී.

4.9. දීර්ඝ සාකච්ඡා වලින් අනතුරුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2019 මාර්තු මාසයේදී ස්ථිර සේවකයින් බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගත් අතර 2019 අප්‍රේල් මාසයේදී බඳවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. බඳවා ගැනීම් ක්‍රියාවලිය කෙටි ලැයිස්තුගත කිරීම, සම්මුඛ පරීක්ෂණ සහ අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා ස්ථාපිත ක්‍රමවේදයන්ට අනුකූලව සිදු කරන ලදී. කෙටි ලැයිස්තුගත කර ඇති අයදුම්කරුවන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අයත් නොවන රාජ්‍ය සේවකයෙකුගෙන් හෝ අවශ්‍ය විට අදාළ ක්ෂේත්‍රවලට සම්බන්ධ වෘත්තිකයකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලදී,

4.10. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කාර්ය මණ්ඩල තනතුරු රාශියක් සඳහා අයදුම්පත් 22,000 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇති අතර, ලැබී ඇති සියලුම අයදුම්පත් සමාලෝචනය කිරීමෙන් අනතුරුව, කළමනාකරණ සහායකයින්,[43] වින්දිත සහ පවුල් සහායක නිලධාරීන්,[44] ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන්,[45] සහකාර මූල්‍ය ප්‍රසම්පාදන ප්‍රධානීන්[46], සහය පරිපාලන නිලධාරීන්;[47] පරිපාලන නිලධාරියෙක්[48] සහ නඩත්තු නිලධාරියෙක්[49]ලෙස ස්ථිර සේවකයින් 46 දෙනෙකු බඳවා ගන්නා ලදී. තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ආරක්ෂක ඒකකය සඳහා ප්‍රධානියෙකු[50] සහ දත්ත කළමනාකරණ ඒකකයේ ප්‍රධානියෙකු[51]බඳවා ගන්නා ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අයදුම්පත් සමාලෝචනය කළ අතර තවත් ඒකක තුනක් සඳහා අපේක්ෂකයින් සම්මුඛ සාකච්ඡා කළ නමුත් සුදුසු අපේක්ෂකයින් සොයා ගැනීමට නොහැකි විය.[52]

4.11. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කොන්ත්‍රාත් හා පැවරුම් පදනම මත ප්‍රාදේශීය සම්බන්ධීකාරක, කළමනාකරණ සහකාර, කාර්යාල කාර්ය සහායක, රියදුරු සහ භාෂා පරිවර්තක තනතුරු සඳහා පුද්ගලයින් හය දෙනෙකු බඳවා ගන්නා ලදී.

---

43 කළමනාකරණ සහකාරවරුන් ලිපිකරු සහ ගිණුම්කරණ කටයුතු සිදු කරයි.

44 අතුරුදහන් වූවන්ගේ පවුලේ සාමාජිකයන් සහ සාමාන්‍ය ජනතාව අතර සම්බන්ධතාවයේ පළමු පුරුක වන්නේ වින්දිතයින් සහ පවුල් උපකාරක නිලධාරීන් ය. පැමිණිලි වාර්තා කිරීම සහ පරිපාලන හා මූල්‍ය සේවා සහ සුභසාධන හිමිකම් සඳහා තනි විමසුම් ඇති පවුල්වලට සහාය වීම ඔවුන්ගේ වගකීම වේ.

45 ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය සඳහා වගකියනු ලබයි.

46 සහකාර මූල්‍ය හා ප්‍රසම්පාදන ප්‍රධානීන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වත්කම් ලේඛනය, සැපයුම්, වැටුප් ගෙවීම, උපයෝගිතා සහ අරමුදල් සඳහා වන වෙනත් ඉල්ලීම් කළමනාකරණය කරයි; එමෙන්ම අවසාන ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන සකස් කරයි.

47 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ එදිනෙදා පරිපාලන කටයුතු කළමනාකරණය කිරීම සහ අදාළ පරිපාලන ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහකාර පරිපාලන ප්‍රධානියාගේ වගකීම වේ.

48 කළමනාකරණ සහකාරවරුන් අධීක්ෂණය සහ බාහිර රජයේ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම පරිපාලන නිලධාරියාගේ වගකීම වේ.

49 නඩත්තු නිලධාරියාගේ වගකීම වන්නේ සුළු අලුත්වැඩියාවන් සිදු කිරීම සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ භෞතික යටිතල පහසුකම් නඩත්තු කිරීමයි.

50 ආරක්ෂක අංශ ප්‍රධානියා ආරක්ෂක ඒකකයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන අතර ඔහු හෝ ඇය වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව මෙන්ම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ පරිශ්‍රයන් ආරක්ෂා කිරීම සඳහා වගකිව යුතුය.

51 අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ දත්ත සමුදාය සහ සමස්ත දත්ත කළමනාකරණ ප්‍රතිපත්ති පරිපාලනය කිරීම සඳහා දත්ත කළමනාකරණ ප්‍රධානියා වගකිව යුතුය.

52 නෛතික, විමර්ශන සහ හඳුනාගැනීම් සහ සන්නිවේදනය යන ඒකක තුන වේ.

4.12. අනුමත රජයේ වැටුප් පරිමාණයන්හි කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය බරපතල අභියෝගයන්ට මුහුණ දුන් අතර විමර්ශන සහ හඳුනාගැනීම් වැනි විශේෂිත හැකියාවන් සහ පළපුරුද්ද සහිත අපේක්ෂකයින් ආකර්ෂණය කර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවීය. තීරණාත්මක කාර්යයන් ඉටු කිරීමේදී දීර්ඝ ප්‍රමාදයන් ඇතිවීම ඇතුළුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට මෙය බරපතල අභියෝගයක් වී තිබේ. විශේෂයෙන්, ඒකක පිහිටුවා ක්‍රියාත්මක වන බවටසහ ක්‍රියාත්මක වන ඒකකවලට අවශ්‍ය විශේෂිත දැනුම හා ධාරිතාව ඇති බවට සහතික කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නොහැකි වී තිබේ; මේ අනුව, සුදුසු අපේක්ෂකයින් නොමැති වීම හේතුවෙන් දැන්වීම් පළ කරන ලද ඒකක ප්‍රධානී තනතුරු හය අතුරින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පිරවීමට හැකි වූයෙ තනතුරු දෙකක් පමණි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය මූලික අරමුණු ඵලදායී ලෙස ඉටු කිරීමට හැකියාව ඇති, විශේෂයෙන් විමර්ශන සහ හඳුනාගැනීම් සඳහා පළපුරුදු, දක්ෂ පුද්ගලයින් බඳවා ගත හැකි බව සහතික කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ දිගටම සාකච්ඡා පවත්වයි.

### ප්‍රාදේශීය කාර්යාල

4.13. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අවශ්‍ය වන පරිදි ප්‍රධාන කාර්යාලය කොළඹ සහ ප්‍රාදේශීය කාර්යාලවල පිහිටුවීමට බලය ඇත.[53] CTF හි නිර්දේශ අනුගමනය කරමින්, අතුරුදහන් වූවන්ගේ පවුල් සමඟ තමන් විසින්ම කරන ලද මහජන අදහස් විමසීම් සහ අතුරුදහන් වූවන්ගේ සිදුවීම්වල භූගෝලීය රටාවන් අනුව ප්‍රාදේශීය කාර්යාල හතරක් සහ උප කලාපීය කාර්යාල අටක් ස්ථාපිත කළ යුතු බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තීරණය කළේය. පවුල් හා සාමාන්‍ය ජනතාව වෙත වැඩි ප්‍රවේශයක් සහතික කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2019 කාලය තුළ ප්‍රාදේශීය කාර්යාල හතරක් පිහිටුවන ලදී. පවුල්වල අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා පැමිණිලි වාර්තා කිරීම, විමසීම් පැවැත්වීම සහ දිස්ත්‍රික් මට්ටමේ බලධාරීන්ට මැදිහත් වීම ප්‍රාදේශීය කාර්යාලවල අරමුණු වෙයි.

4.14. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාය සිය මාතර ප්‍රාදේශීය කාර්යාලය 2019 මාර්තු 2 වන දින අංක 54, ධර්මාරාම මාවත, කොටුව, මාතර යන ස්ථානයේ විවෘත කළේය. 2019 මැයි 2 වන දින, අංක 5, දුම්රිය නැවතුම්පොළ පාර, මන්නාරම යන ලිපිනයේ මන්නාරම ප්‍රාදේශීය කාර්යාලය විවෘත කරන ලදී. 2019 මැයි 24 වන දින, අංක 123, අඩියපතම් පාර, යාපනය යන ස්ථානයේ යාපනය ප්‍රාදේශීය කාර්යාලය විවෘත කරන ලදී. 2019 මැයි 11 වන දින, අංක 124, මධ්‍යම පාර, මඩකලපුව යන ලිපිනයේ මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය විවෘත කරන ලදී.

4.15. ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රාදේශීය සම්බන්ධීකාරක, වින්දිත සහ පවුල් සහායක නිලධාරීන් සහ කළමනාකරණ සහායකයින් යන නිලධාරීන් සේවය කරයි. පුළුල් පරාසයක සේවාවන් වෙත ප්‍රවේශය සහතික කිරීම සඳහා අනාගතයේදී කලාපීය මට්ටමින් කාර්ය මණ්ඩලය වැඩි කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සැලසුම් කරයි. ප්‍රාදේශීය කාර්යාලවල අරමුණු පැහැදිලි කිරීම සහ අදාළ පාර්ශවකරුවන්ගේ වැඩ කටයුතු තම කාර්යයට අනුපූරක විය හැකි ආකාරය අවධාරණය කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය බලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ රාජ්‍ය නොවන බලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වීය.

4.16. කාර්යාල විවෘත කළ දිනයේ සිට ඒ සෑම කාර්යාලයක්ම, පැමිණිලි වාර්තා කිරීම, මූලික විමසුම් සිදු කිරීම, දක්නට නොමැති බවට වන සහතික ලබාගැනීම සඳහා සහය වීම සහ / හෝ මරණ සහතික අවලංගු කර දක්නට නොමැති බවට වන සහතික ලබාගැනීමට සහය වීම සහ වෙනත් පරිපාලන සේවාවන් සැපයීමට සමත් වී ඇත.

4.17. පහත දැක්වෙන වගුව එක් එක් ප්‍රාදේශීය කාර්යාලයට පැමිණෙන අමුත්තන් සංඛ්‍යාව පිළිබඳ විස්තර සපයයි:

| ප්‍රාදේශීය කාර්යාලය | 2019 දෙසැම්බර් 31 වන දින වන විට පැමිණි අමුත්තන් සංඛ්‍යාව |
|---|---|
| මාතර (විවෘත කළ දිනය 2019 මාර්තු 2) | 450 |

[53]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 3 (3) වගන්තිය.

| | |
|---|---|
| මන්නාරම (විවෘත කළ දිනය 2019 මැයි 2) | 530 |
| යාපනය (විවෘත කළ දිනය 2019 අගෝස්තු 24) | 520 |
| මඩකලපුව (විවෘත කළ දිනය 2019 නොවැම්බර් 11) | 64 |
| එකතුව | 1510 |

### ක්‍රියා පටිපාටි සහ රීති සංවර්ධනය කිරීම

4.18. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට එහි ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය නීති රීති හා ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමට පැහැදිලි බලයක් ඇත.[54] 2019 කාලය තුළ, දන්නට නොමැති බවට වන සහතික නිකුත් කිරීම සහ රැඳවුම් ස්ථාන සෙවීම සම්බන්ධ නීති සහ මාර්ගෝපදේශ සකස් කරන ලද අතර විමර්ශනවල නිශ්චිත අංශ සහ වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ නීති රීති කෙටුම්පත් කිරීම සිදු කරන ලදී.

4.19. පුද්ගලයෙකු අතුරුදහන් වී ඇති බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නිගමනය කළ විට, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවට CoA හෝ CoD නිකුත් කිරීමට හැකිවන පරිදි අතුරු වාර්තා නිකුත් කිරීමට බලය ඇත.[55] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එවැනි අතුරු වාර්තා නිකුත් කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය සහ ඒ හා සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම සඳහා අදාළ ක්‍රියා පටිපාටිය සකස් කරන ලද අතර එය 2019 ජුනි මාසයේදී මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

4.20. එහි විමර්ශන බලතල යටතේ, රැඳවුම් ස්ථාන සෙවීමේ බලය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතු ය.[56] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත අනුව අධිකරණ විෂය භාර ඇමතිවරයා ඒ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය. අධිකරණ අමාත්‍යාංශයේ සහයෝගයෙන්, OMP විසින් රැඳවුම් ස්ථාන සෙවීම පිළිබඳ මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලද අතර එය 2019 ජූලි මාසයේදී ගැසට් කරන ලදී.[57]

### පවුල් කෙරෙහි මනෝ සමාජීය ප්‍රතිචාර දැක්වීම සහ සංවේදීතාව සහතික කිරීම

4.21. අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට පරිපාලනමය හෝ සුභසාධන සේවා සහ මනෝ සමාජීය සහාය ලබා දීමට හෝ පහසුකම් සැපයීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ප්‍රකාශිත අරමුණක් ඇත.[58] අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා සංවේදීතාව සහ ගෞරවය විදහා දැක්වීමට එහි සියලු කාර්යයන් සඳහා මනෝ සමාජීය ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම ප්‍රධාන වන බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වාස කරයි. අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා මනෝ සමාජීය සහය ලබා දීම සඳහා මෙහෙයුම් රාමුවක් ඇතුළුව මනෝ සමාජීය ආධාරක උපායමාර්ගය (PSS) සැකසීම, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2019 දී අවසන් කරන ලදී.

4.22. PSS කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය 2018 දී ආරම්භ කරන ලද අතර උපදේශන ක්‍රියාවලියක් මගින් සමාලෝචනය කරන ලදී. ආරම්භයේ දී, අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා මනෝ සමාජීය ආධාර සැපයීම සම්බන්ධයෙන් CTF විසින් කරන ලද නිර්දේශයන් PSS විසින් සැලකිල්ලට ගන්නා ලදී. මීට අමතරව, අතුරුදහන් වූවන්ගේ පවුල්වල විවිධාකාර හා විකාශනය වන මනෝ සමාජීය සන්දර්භයන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දුන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රජා සත්කාරක සිදුවීම් සහ පොදු සිදුවීම් වලදී ප්‍රකාශිත පවුල් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ ගැටළු සහ අදහස් ද PSS තුළට ඇතුළත් කරන ලදී.

[54] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 11 (ආ): 26 වගන්තිය.
[55] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (අ) (Ii) වගන්තිය.
[56] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 12 වගන්තිය (ඊ).
[57] අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාල පනතේ 12 වන වගන්තිය යටතේ (ස්ථාපිත කිරීම, පරිපාලනය සහ කාර්යයන් මුදා හැරීම) අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ 2016 අංක 14, අති විශේෂ ගැසට් පත්‍රය 2133/36 (2019 ජූලි 24) ).
[58] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) (ඉ) වගන්තිය.

කොලොම්බියාව, පේරු සහ නේපාලයේ ඒ හා සමාන ආයතන ඇතුළුව ජාතික හා ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයින් ඇතුළු පාර්ශ්වකරුවන්ගෙන් උපදෙස් සහ අදහස්ද ලබා ගන්නා ලදී. වර්තමානයේ විවිධ සේවා අංශයන් තුළ ව්‍යාප්ත වී ඇති විවිධාකාර වූ මනෝ සමාජීය සහයෝගයන් එක් තැනකට ගෙන ඒම සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විසින් PSS අගය කිරීමකට ලක් කරන ලදී. විශේෂයෙන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ පාර්ශ්වකාර ආයතන තුළ සේවා ව්‍යුහයන් ක්‍රමවත් කිරීම තුළ, විවිධ වූ අවශ්‍යතාවන් සහ සේවාවන් සඳහා වන ඉල්ලුම් මට්ටම් තනි රාමුවකට ගෙන ඒමේදී එහි ඇති පැහැදිලිකම සම්බන්ධව ඇගයීමට ලක් විණි.

4.23. PSS 2019 අප්‍රේල් මාසයේ දී මණ්ඩලය ඉදිරියේ සභාගත කරන ලද අතර විශේෂඥයින් කණ්ඩායමක් ඉදිරියේ තවදුරටත් සංශෝධනය කරන ලදී. PSS වරින් වර සමාලෝචනය කිරීමට අවශ්‍ය වන අතර එමඟින් වෙනස් වන සන්දර්භයන්ට අනුව උපාය මාර්ගයන් අනුවර්තනය වීමට ඉඩ ලබා දේ.

4.24. අතුරුදහන් වූවන්ගේ පවුල්වලට ඔවුන්ගේ දුක් වේදනා හා වේදනාව අනවශ්‍ය ලෙස ව්‍යාධි නොකරමින් පූර්ණ, අන්තර් ආංශික සහය ලබා දීම PSS හි අරමුණයි. අතුරුදහන් වූ කෙනෙකුගේ ඉරණම පිළිබඳ අවිනිශ්චිතතාවය සහ මෙම සන්දර්භය තුළ පැන නගින සමාජ, ආර්ථික, පෞද්ගලික සහ මානසික අභියෝග සමඟ ජීවත් වීමට සිදුවීමේ වේදනාව හා දුක් වේදනා PSS හඳුනා ගනී.

4.25. අතුරුදහන් වූවන්ගේ පවුල්වල සුවිශේෂී සන්දර්භය සහ දුක් වේදනා හඳුනා ගැනීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තුළ සහ බාහිර පාර්ශවකරුවන් අතර සක්‍රීය පරිසරයක් වර්ධනය කරන වැඩ කොටස් හතක් මෙම උපාය මාර්ගයෙන් ගෙන එනු ලැබේ; ඔවුන්ගේ මනෝ සමාජීය අවශ්‍යතා, අවදානම් සහ හැකියාවන් පිළිබඳව සංවේදී වීම; සමාජ සහයෝගය සඳහා පහසුකම් සැපයීම; ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා කරන සහ ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරන ආකාරයෙන් සංවේදී සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම.

4.26. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ ඇති සියළුම අන්තර්ක්‍රියා වලදී අතුරුදහන් වූවන්ගේ සියලු පවුල්වලට ගෞරවය සහ මනෝ සමාජීය සංවේදීතාව පෙන්වීම උපායමාර්ගයේ කොටස් හතට ඇතුළත් ය; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සියලුම පද්ධති හා කාර්යයන් සඳහා මනෝ සමාජීය ප්‍රතිචාර දැක්වීම ඒකාබද්ධ කිරීම සඳහා අභ්‍යන්තර ආයතනික ධාරිතාව වර්ධනය කිරීම; අතුරුදහන් වූවන්ගේ පවුල් සමඟ සහයෝගයෙන් සහ සමීපව කටයුතු කර ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සොයා ගැනීමටත් සත්‍යය දැන ගැනීමේ අයිතියට ගරු කිරීමටත් ක්‍රියා කිරීම;ගැඹුරු සහයක් අවශ්‍ය පවුල් සහ පවුලේ සාමාජිකයින් සඳහා ඉලක්කගත චිත්තවේගීය සහය සහ මනෝ සමාජීය සත්කාර සැපයීම සඳහා චින්දිත සහ පවුල් ආධාර ඒකකය තුළ ධාරිතාව වර්ධනය කිරීම; අතුරුදහන් වූවන්ගේ පවුල් තම අහිමිවීම සම්බන්ධව අවිනිශ්චිතභාවය සහිතව ජීවත් වීමේදී මුහුණ දෙන අභියෝගයන් සම්බන්ධව ප්‍රජාව දැනුවත් කිරීම සහ ඔවුන් සඳහා සමාජයීය සහයෝගය ලබාදීම; සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල අවදානම් සහ හැකියාවන් හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දක්වන යොමු කිරීමේ යාන්ත්‍රණ සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ ජාලගත වීම.

4.27. උපායමාර්ගයේ අනිවාර්ය අංගයක් වන්නේ මෙහෙයුම් පිරමිඩය වන අතර එය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙතින් පවුල් අපේක්ෂා කරන සේවාවන්හි ස්වභාවය සහ ඉල්ලුමේ මට්ටම ග්‍රහණය කරයි. පිරමිඩයේ පුළුල්ම මට්ටම, පවුල් විසින් බහුලව අපේක්ෂා කරන සේවාවන්, එනම් පවුල් මුහුණ දෙන නෛතික, පරිපාලන, ප්‍රායෝගික සහ ආරක්ෂක ගැටළු වලට අදාළ උපදෙස් සහ සහාය සහ විවිධාකාර වූ වෙනස් කොට සැලකීම් සමඟ කටයුතු කිරීමට සහාය වීම හා සම්බන්ධ වෙයි. පවුල්වලට ඔවුන්ගේ ගැටළු ප්‍රකාශ කිරීමට ඉඩ ලබාදීම සහ ක්‍රියාශීලීව සවන් දීම; නිවැරදි තොරතුරු සැපයීම සහ අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වෙත යොමු කිරීම යනාදිය එවැනි ගැටළු විසඳීම සඳහා වන මනෝ සමාජීය සහයෝගයට අයත් වෙයි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමඟ සම්බන්ධ වන පවුල් සඳහා පළමු සම්බන්ධතා ස්ථානය වන චින්දිත සහ පවුල් ආධාර ඒකකය විසින් එවැනි සහාය ලබා දෙනු ඇත. දෙවන මට්ටම විමර්ශන වලදී මනෝ සමාජීය සහය ලබා දීම සම්බන්ධ වන අතර, එයට සමාජ සහයෝගය සඳහා පහසුකම් සැලසීම සහ විමර්ශනයේ අභියෝගාත්මක, එනම් කැණීම් හෝ මෘත දේහ ගොඩ ගන්නා අවස්ථාව වැනි අවස්ථා වලදී පවුලේ සාමාජිකයන් සමඟ මනෝ සමාජීය කාර්ය මණ්ඩලය සිටින බව සහතික කිරීම ඇතුළත් වේ. තෙවන මට්ටමේදී සමහර පවුල්වල සාමාජිකයින්ට අවධානය යොමු කළ යුතු, ගැඹුරු මානසික සහයක් සහ මානසික රැකවරණයක් අවශ්‍ය විය හැකි බව හඳුනා ගනී. එවැනි පුද්ගලයින්ගේ විශේෂිත ගැටළු

විසඳීම සඳහා අවශ්‍ය සහය ලබා දීම සහ අවශ්‍ය නම් අඛණ්ඩ සහාය අවශ්‍ය අයට උපදේශනය ලබා දීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අරමුණු කරයි. අවසාන වශයෙන්, සිව්වන මට්ටමේ දී, විශේෂිත වෘත්තීමය මානසික සෞඛ්‍ය සේවාවන් අවශ්‍ය වන උග්‍ර මානසික සෞඛ්‍ය ගැටළු තිබිය හැකි පුද්ගලයන් කිහිප දෙනෙක් සිටිය හැකි බව පිරමීඩයෙන් හඳුනාගනු ලබයි. එවැනි අවස්ථාවන්හිදී, අදාළ පුද්ගලයන් මනෝචිකිත්සකයින්, මනෝ විද්‍යාඥයින් වැනි මානසික සෞඛ්‍ය වෘත්තිකයන් සහ ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් රෝහල්වල මානසික සෞඛ්‍ය ඒකක වෙත යොමු කෙරෙනු ඇත.

4.28. PSS අදියර දෙකකින් ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පළමු අදියරේදී, අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා මනෝ සමාජීය සහයෝගයේ අවම ප්‍රමිතීන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ස්ථාපිත කරනු ලබන අතර අනාගතයේ දී වඩාත් පුළුල් මනෝ සමාජීය සත්කාර සඳහා අඩිතාලම දමනු ඇත. මෙහෙයුම් රාමුවේ මට්ටම් හතරේම සවිස්තරාත්මක මනෝ සමාජීය සත්කාර සැපයීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා මානව සම්පත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අත්පත් කර ගනු ඇතැයි දෙවන අදියර අපේක්ෂා කරයි.

4.29. PSS සහ එහි මෙහෙයුම් රාමුව ප්‍රධාන මනෝ සමාජීය මූලධර්ම හතකින් තහවුරු වේ. ඒවා නම්, අතුරුදහන් වූ හෝ අතුරුදහන් වූ පවුලේ සාමාජිකයින්ගේ ඉරණම නොදැන ජීවත්වීමේ දුක්ඛිත අත්දැකීම් හා සම්බන්ධ සාමාන්‍ය ශෝකජනක ක්‍රියාවලීන් ව්‍යාධි නොකිරීම; ඔවුන්ගේ ශෝකය වසා දැමීමට බල නොකිරීම; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සියලුම පද්ධති සහ ක්‍රියාවලීන් සඳහා ගෞරවය සහ මනෝ සමාජීය සංවේදීතාව කාවැද්දීම; තම ආදරණීයයන් අහිමි වීමේ අවිනිශ්චිතතාවය ගැන ශෝකවීමේ අවශ්‍යතාවය පිළිබඳව සංවේදීව සිටින අතරම පවුල්වල ප්‍රත්‍යස්ථභාවය ගොඩනැගීම හා ශක්තිමත් කිරීම අවධාරණය කිරීම; සියළුම පවුල්වල සමාජ-ආර්ථික පසුබිම හෝ දේශපාලන අනුබද්ධතා නොසලකා පිළිගැනීම සහ සහාය ලබා දීම; ඔවුන්ගේ දුක් වේදනා හා අනාරක්ෂිතතාවන්ගෙන් පවුල් හුදෙකලා වීම වැළැක්වීම සඳහා පවුල් සහ ප්‍රජා ආධාරක කවයන් ශක්තිමත් කිරීම; පවත්නා සේවාවන් අනුපිටපත් කිරීමෙන් වැළකීම සහ ඒ වෙනුවට පවුල් සහ අතුරුදහන් වූවන්ගේ සුවිශේෂී සන්දර්භය කෙරෙහි සංවේදී වීමට රාජ්‍ය හා රාජ්‍ය නොවන සේවා සපයන්නන්ට බලපෑම් කිරීම සහ ඔවුන්ගේ දුර්වලතා විසඳීම සඳහා සුදුසු ප්‍රතිපත්ති හා සේවාවන් සඳහා පහසුකම් සැපයීම.

### ධාරිතා වර්ධනය හා දැනුම බෙදාගැනීම

4.30. අතුරුදහන් වූ පුද්ගලයින් සහ මිනිස් දේහයන්, ලේඛනාගාරය සහ දත්ත සමුදාය කළමනාකරණය පිළිබඳ පරීක්ෂණවල විශේෂඥ දැනුම ඇති ජාතික හා ජාත්‍යන්තර පාර්ශවකරුවන්ගේ රැස්වීම් සහ පුහුණු වැඩසටහන් රැසකට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහභාගී විය. තවද, කාර්ය මණ්ඩලයේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් ගණනාවක් පවත්වා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සහ බලතල පිළිබඳව දැනුවත් කිරීම සහ පීඩාවට පත් පුද්ගලයින්ට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා කුසලතා ලබා දීමට කටයුතු කරන ලදී. බලපෑමට ලක්වූ පුද්ගලයින් සමඟ කටයුතු කරන, සංවේදී, දැනුවත් හා ගෞරවනීය ආකාරයකින් ප්‍රතිචාර දැක්වීමට හැකිවන කාර්ය මණ්ඩලයක් සහතික කිරීම අරමුණු කරගනිමින්ද මෙම පුහුණු වැඩසටහන් පවත්වන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කොමසාරිස්වරුන් සහ විශේෂිත ඒකක පුහුණු කිරීම සඳහා විශේෂිත ක්ෂේත්‍ර හඳුනා ගන්නා ලදී. අධිකරණ වෛද්‍ය විද්‍යාව, විමර්ශන සහ දත්ත කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් සැපයීම සඳහා වෙනත් රටවල ඒ හා සමාන ආයතනවල පුද්ගලයින් ඇතුළු ජාත්‍යන්තර විශේෂඥයින් සහ වෘත්තිකයින් හඳුනා ගන්නා ලදී.

4.31. 2019 වසර තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පහත පුහුණු වැඩසටහන් පවත්වන ලදී

| දිනය | තේමාව | සහභාගි වූවන් ගණන |
|---|---|---|
| ජනවාරි 23 | මනෝ සමාජීය සංවේදීතාව හා පවුල් සමඟ සම්බන්ධ වීම සම්බන්ධ මූලික කුසලතා සංවර්ධනය පිළිබඳව පිළිගැනීමේ කාර්ය මණ්ඩලය සඳහා අර්ධ දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. | 3 |

| | | |
|---|---|---|
| පෙබරවාරි 18, 22 | අතුරුදහන් වූවන් සෙවීමේදී විමර්ශන, විමර්ශන දත්ත සමුදායන් සහ අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපායමාර්ගික ප්‍රවේශයන් පිළිබඳව කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය සඳහා දින පහක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. | 10 |
| පෙබරවාරි 23 | මාතර ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා අර්ධ දින සමාරම්භක වැඩසටහනක් කොළඹදී පවත්වන ලද අතර එමඟින් පහත සඳහන් මාතෘකා ආමන්ත්‍රණය කරන ලදී: අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මූල්‍ය හා පරිපාලන ක්‍රියා පටිපාටි; කලාපීය සම්බන්ධීකාරකවරුන්ගේ කාර්යභාරය; සහ මනෝ සමාජීය සංවේදීතාවයේ මූලික අංග. | 2 |
| මාර්තු 13 | පහත සඳහන් මාතෘකා ආවරණය වන පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සහ යුතුකම් මෙන්ම මනෝ සමාජීය සංවේදීතාව පිළිබඳ සමාරම්භක වැඩසටහනක් මාතර ප්‍රාදේශීය කාර්යාලයේදී පවත්වන ලදී: අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සහ කාර්යයන්; රහස්‍යභාවය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නීතිමය බැඳීම්; අතුරු වාර්තා සහ CoA නිකුත් කිරීම; අතුරු සහන පටිපාටි; සහ මරණ සහතික ලබා ගැනීම සහ අතුරුදහන් වූවන් සොයා ගැනීම ඇතුළු පවුල් විසින් මතු කරනු ලබන පොදු නීතිමය ගැටළු; මනෝ සමාජීය යහපැවැත්ම; පවුල් සමඟ සම්බන්ධ වන විට මනෝ සමාජීය සංවේදීතාව; තෙවන පාර්ශවයන්ගේ දුක්ඛිත කථා සමඟ වැඩ කිරීමේදී ස්වයං රැකවරණය සහ ආතතිය කළමනාකරණය කිරීම. | 4 |
| මාර්තු 18-22 | අතුරුදහන් වූවන් විමර්ශනය කිරීම හා සොයා ගැනීම සඳහා සංසන්දනාත්මක ප්‍රවේශයන්; මෘත දේහ හඳුනා ගැනීම; සහ දත්ත සමුදායන් කළමනාකරණය කිරීම පිළිබඳව කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය සඳහා දින පහක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී; | 10 |
| මැයි 6-7 | මන්නාරම ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සහ යුතුකම් සහ මනෝ සමාජීය සංවේදීතාව පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී. | 3 |
| ජූනි 12-14 | විමර්ශනය කිරීම සහ සෙවීම සඳහා අධිකරණ වෛද්‍ය විද්‍යාව සඳහා යොදා ගැනීම පිළිබඳව කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය සඳහා දින තුනක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. | 10 |
| ජූනි 3-14 | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සඳහා දත්ත සමුදායක් සහ වාර්තා කළමණාකරණ පද්ධතියක් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳව දින දහයක පුහුණු වැඩසටහනක් දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරුවන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද අතර පහත සඳහන් මාතෘකා ආවරණය කරන ලදී: අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සඳහා ගොනු වර්ගීකරණ පද්ධතියක් සැලසුම් කිරීම; හැකි දත්ත ආකෘති ඇතුළුව ස්ථිර දත්ත සමුදායක් සංවර්ධනය කිරීම සඳහා වන ප්‍රධාන කරුණු; තාවකාලික දත්ත සමුදායේ නිරවද්‍යතාව වැඩි කිරීමට පියවර; අතුරුදහන් වූවන් සම්බන්ධ වෙනත් වාර්තා ඩිජිටල්කරණය කිරීම සඳහා අවශ්‍යතා තක්සේරුවක් සහ සංකල්පීය ප්‍රවේශයක්. | 10 |
| අගෝස්තු 5-9 | පවුල් සහායක නිලධාරීන්ගේ කාර්යභාරය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සහ යුතුකම් පිළිබඳව දින පහක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී: අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සහ කාර්යයන්; රහස්‍යභාවය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නීතිමය බැඳීම්; අතුරු වාර්තා සහ CoA නිකුත් කිරීම; අතුරු සහන පටිපාටි; CoD ලබා ගැනීම සහ අතුරුදහන් වූවන් සොයා ගැනීම ඇතුළු පවුල් විසින් මතු කරනු ලබන පොදු නීතිමය ගැටළු; අතුරුදහන් වූවන්ගේ පවුල්වල මනෝ සමාජීය සන්දර්භය හඳුන්වාදීම; මනෝ සමාජීය යහපැවැත්ම පිළිබඳ සංකල්පය හඳුන්වාදීම සහ උපදේශනය සහ මනෝචිකිත්සක සත්කාරයෙන් ඔබ්බට මනෝ | 16 |

| | | |
|---|---|---|
| | සමාජීය සහයෝගය ලැබෙන බව අවබෝධ කර ගැනීම; අතුරුදහන් වූවන්ගේ පවුල් සමඟ ගෞරවයෙන් හා මනෝ සමාජීය සංවේදීතාවයකින් යුතුව කටයුතු කිරීමේ කුසලතා සංවර්ධනය; මනෝ සමාජීය සහය සැපයීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අනුගමනය කර ඇති මෙහෙයුම් රාමුව පිළිබඳ දැනුවත්භාවය; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මනෝ සමාජීය ආධාර සැපයීමට මග පෙන්වන මනෝ සමාජීය මූලධර්ම; සක්‍රීය සවන්දීම පිළිබඳ පුහුණු සැසි. | |
| ඔක්තෝබර් 2 | පවුල් උපකාරක නිලධාරීන්ගේ කාර්යභාරය පිළිබඳ පුහුණුවෙන් මසකට පසු පූර්ණ දින ආවර්ජන හා සමාලෝචන රැස්වීමක් පවත්වන ලදී. | 11 |
| ඔක්තෝබර් 7- 17 | මෘත දේහ කැණීම, පිටතට ගැනීම සහ හඳුනාගැනීමේදී අධිකරණ වෛද්‍ය විද්‍යාව භාවිතා කිරීම පිළිබඳව කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය සඳහා දින දහයක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ආවරණය කරන ලද විශේෂිත මාතෘකා අතරට ඇටසැකිලි වූ මෘතදේහ විමර්ශනය කිරීමේදී අධිකරණ මානව විද්‍යාව භාවිතා කිරීම; මිනිස් අවශේෂවල කාබන් දින ගණනය; මෘතදේහ කළමනාකරණය; සහ මෘත දේහ විමර්ශනය කිරීමේදී පවුල් සමඟ සන්නිවේදනය කිරීමේ උපාය මාර්ග යනාදිය ඇතුළත් විය. | 11 |
| ඔක්තෝබර් 24 | අතුරු වාර්තා සහ CoA සම්බන්ධ ගැටළු; අතුරු සහන පටිපාටි; CoD ලබා ගැනීම සහ අතුරුදහන් වූවන් සොයා ගැනීම ඇතුළු පවුල් විසින් මතු කරනු ලබන පොදු නීතිමය ගැටළු පිළිබඳව යාපනය සහ මන්නාරම් ප්‍රාදේශීය කාර්යාල සඳහා පසු විපරම් පුහුණුවක් පවත්වන ලදී. | 5 |
| නොවැම්බර් 6-7 | යාපනය, මන්නාරම සහ මඩකලපුවේ ප්‍රාදේශීය කාර්යාලවලට අලුතින් බඳවා ගත් ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් සහ කළමනාකරණ සහායකයින් සඳහා මනෝ සමාජීය සහාය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන යාපනයේ පැවැත්වූ අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අනුගමනය කරන ලද මනෝ සමාජීය ආධාරක උපායමාර්ගය පිළිබඳව සහභාගිවන්නන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම, කලාපීය කාර්යාල වෙත පැමිණෙන පවුල් පිළිගැනීමේදී සහායක සන්නිවේදනයේ මූලික කුසලතා හඳුන්වා දීම සහ කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා ස්වයං රැකවරණය සහ කණ්ඩායම් රැකවරණය පිළිබඳව අවධානය යොමු කරන ලදී. . | 9 |

4.32. මීට අමතරව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති, කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය 2019 කාලය තුළ පහත සඳහන් බාහිර පුහුණු වැඩසටහන් සහ අවස්ථා සඳහා සහභාගී වූහ.

| දිනය | අවස්ථාව |
|---|---|
| අප්‍රේල් 22-24 | කොමසාරිස් මිරාක් රහීම් මහතා මැලේසියාවේ ක්වාලාලම්පූර් හි පැවති “අධිකරණ වෛද්‍ය මිනිස් හඳුනාගැනීම් වැඩි දියුණු කිරීම සඳහා වෛද්‍ය-නීති පද්ධති ශක්තිමත් කිරීම” යන මැයෙන් පැවති වැඩමුළුවකට සහභාගී විය. මෙම සමුළුව අන්තර්ජාතික රතුකුරුස කමිටුව විසින් මෙහෙයවන ලද අතර නාඳුනන මියගිය පුද්ගලයින් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය වැරදි ලෙස කළමනාකරණය කිරීමේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා ආසියාවේ වෘත්තිකයින් එක්රැස් කරන ලදී. |
| ජූනි 30 - ජූලි 3 | කොමසාරිස් කේ. වෙන්තන් මහතා මානව හිමිකම් සඳහා දකුණු ආසියානුවන් සහ නේපාලයේ කත්මණ්ඩු හි ජගරන් නේපාල් විසින් සංවිධානය කරන ලද “ආගමික සහජීවනය සහ ආගමික සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම” පිළිබඳ පුහුණුකරුවන්ගේ වැඩමුළුවකට සහභාගී විය. |
| ජූලි 2 - 3 | කොමසාරිස් පී. ජෙයතීපා මහත්මිය බොස්නියාවේ හා හර්සගොවිනා හි පැවති අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ වැඩකටයුතු සඳහා සහයෝගය දැක්වීම සහ ශක්තිමත් කිරීම පිළිබඳ විශේෂඥ රැස්වීමකට සහභාගී වූ අතර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සහ වැඩ කටයුතු පිළිබඳවත් ශ්‍රී ලංකාවේ |

| | |
|---|---|
| | අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල තත්ත්වය පිළිබඳවත් අදහස් දැක්වීය. |
| ඔක්තෝබර් 16- 17 | කොමසාරිස්වරුන් වන එස්. කේ. ලියනගේ සහ කොමසාරිස් කේ. වෙන්තන් යන මහත්වරුන් සයිප්‍රසයේ අතුරුදහන් වූවන් සඳහා වූ කමිටුව සහ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසින් පවත්වන ලද "අතුරුදහන් වූවන් සඳහා වූ යාන්ත්‍රණ - ඉරණම පැහැදිලි කිරීම සහ පවුල්වලට සහය වීම" යන මැයෙන් පැවැත්වූ විශේෂඥ රැස්වීමකට සහභාගී වූහ. |
| නොවැම්බර් 27-29 | කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු, පෘතුගාලයේ "අතුරුදහන් වීම වැළැක්වීම සහ විසඳීම සඳහා වන අධිකරණමය හොඳම පිළිවෙත් හා මූලධර්ම" යන මාතෘකාව යටතේ මානුෂීය අධිකරණ වෛද්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගී වූ අතර, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, පෘතුගීසි රතු කුරුස ජාතික සංගමය, කොයිම්බ්‍රා විශ්ව විද්‍යාලය සහ ස්පාඤ්ඤ අධිකරණ අමාත්‍යාංශයේ ඓතිහාසික ස්මරණ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සත්කාරකත්වය සපයන ලදී. |

## 5. සන්නිවේදනය සහ ප්‍රජාව වෙත යොමුවීම

5.1. අතුරුදහන් වීම්වලට හේතු, සිදුවීම් සහ බලපෑම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මහජන සහයෝගය ඇති කිරීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට පැවරී ඇති එක් වගකීමකි.[59] මහජනතාවට පුළුල් වශයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු සහ එහි වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම; අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ පවුල්, ප්‍රධාන පාර්ශවකරුවන් සහ සාමාන්‍ය ජනතාව සමඟ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධ වීම සහතික කිරීම; අතුරුදහන් වීමේ ප්‍රතිවිපාක සහ මෙම ගැටළුව විසඳීම සඳහා රාජ්‍යයේ හා සමාජයේ වගකීම පිළිබඳව සාමාන්‍ය ජනතාව අතර දැනුවත්භාවය සහ සංවේදනය ඇති කිරීම සම්බන්ධව සන්නිවේදන හා ළඟා වීමේ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ආරම්භ කරන ලදී මේ සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් පොදු අවස්ථා, මාධ්‍ය සහභාගීත්වයන් ගණනාවක් පැවැත්වූ අතර මාධ්‍ය ප්‍රචාරණයක් දියත් කරමින් ඩිජිටල් ක්ෂේත්‍රය තුළ පැවැත්ම තහවුරු කරගන්නා ලදී.

5.2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ මාධ්‍ය අධීක්ෂණය කිරීම සහ සන්නිවේදනය සංවර්ධනය කිරීම ඇතුළු සන්නිවේදන කටයුතු සිදු කිරීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සිටින අතර එම කටයුතු සභාපතිවරයා සහ මණ්ඩලයේ සාමාජිකයන් විසින් අධීක්ෂණය කරනු ලැබේ. ඒකක ප්‍රධානියාගේ තනතුර සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්මුඛ සාකච්ඡා පැවැත්වීය. කෙසේ වෙතත්, සුදුසු අපේක්ෂකයෙකු හඳුනා ගැනීමට නොහැකි විය.

### පොදු අවස්ථා

5.3. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු පිළිබඳව දැනුවත් කිරීම සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට මෙන්ම සාමාන්‍ය ජනතාවට ද එහි වැඩ කටයුතුවල නිරත වීමට දිරිගැන්වීමේ අරමුණින් මහජන උත්සව රාශියක් පවත්වන ලදී.

### ප්‍රාදේශීය කාර්යාල විවෘත කිරීම

5.4. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිළිබඳ දැනුවත් කිරීම සඳහා, 2019 මාර්තු 2 වන දින මාතර කලාපීය කාර්යාලය විවෘත කිරීම සනිටුහන් කළ අතර, විවෘත කිරීමේ උත්සවයට අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින් 250 කට වැඩි පිරිසක් සහභාගී වූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගරු පාර්ලිමේන්තුවේ කථානායක කරු ජයසූරිය මහතා සහභාගී වූ අතර ඔහු අතුරුදහන් වූවන්ගේ වින්දිතයින්ගේ වගවීම සහ අනෙකුත් අයිතිවාසිකම් පිළිබඳ වැදගත්කම පෙන්වා දුන්නේය. ජාතික

[59] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (ඒ) වගන්තිය.

ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගමන සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය මනෝ ගනේසන් මහතා, අඛණ්ඩව තම ආදාරණීයයන් වෙනුවෙන් සෙවීම් සිදු කළ අතුරුදහන් වූවන්ගේ පවුල්වල උත්සාහය පැසසුමට ලක් කළ අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම ඔවුන්ගේ ජයග්‍රහණයක් බව සඳහන් කළේය. . අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රගතිය සඳහා අධිකරණය, අමාත්‍ය මණ්ඩලය සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව ඔහු නිරීක්ෂණය කළේය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති සාලිය පීරිස් මහතා, තම කාර්යාලය විසින් 2018 අගෝස්තු මාසයේදී කරන ලද යුක්තිය සම්බන්ධ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස රජයෙන් ඉල්ලා සිටි අතර, රටක් වශයෙන්, සත්‍යය තහවුරු කිරීම සහ අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට යුක්තිය ඉටු කිරීම ශ්‍රී ලංකාවේ යුතුකම බව නැවත අවධාරණය කළේය. .

5.5. සමාරම්භක උත්සවයට පෙර පවුලේ සාමාජිකයින් ගණනාවක් උත්සවයෙන් පිටත විරෝධතාවක් පැවැත්වූ අතර තවත් බොහෝ අය කාර්යාලය පිහිටුවීම පිළිබඳව ප්‍රසාදයකින් පසු වූහ. සමාරම්භක උළෙලට සහභාගී වන ලෙස සැමටමත්, ආරම්භක උත්සවයේ කොටසක් ලෙස අදහස් දැක්වීමට සහ ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට සමහරුන්ටත් ආරාධනා කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා බාහිර කමිටුවක් පත් කරන ලෙස ගාල්ලේ මල්ලිකා මහත්මිය ඉල්ලා සිටි අතර, මාතර ප්‍රදේශයේ නදීෂා ලක්මාලි මහත්මිය රජයෙන් ඉල්ලා සිටියේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසයි. හම්බන්තොටින් පැමිණිඑස්.එච්. නන්දසිරි මෙය, කාන්තාවන් ගෘහ මූලිකයන් වූ පවුල් වෙත ලැබෙන අවම සහය පිළිබඳව ඉස්මතු කළ අතර ජාතිය නොසලකා සැමටම සමාන සැලකීමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියාය. කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමට හේතු වූයේ පවුල්වල අරගලයන් බව නිරීක්ෂණය කළ අතර පැමිණ සිටි සැමට ස්තුතිය පුද කළාය.

5.6. අගෝස්තු 24 වනදා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් යාපනය ප්‍රාදේශීය කාර්යාලය විවෘත කරන ලදී. මෙම අවස්ථාව සනිටුහන් කිරීමට යාපනය කච්චේරියේ මහජන රැස්වීමක් පවත්වන ලදී. අතුරුදහන් වූවන්ගේ පවුල් 100 කට ආසන්න සංඛ්‍යාවක් සහ සිවිල් සමාජ සංවිධානවල සාමාජිකයින් 18 දෙනෙකු මෙම රැස්වීමට සහභාගී වූහ. සභාපති සාලිය පීරිස් මහතා ආරම්භක දේශන පැවැත්වූ අතර, පසුව පවුල් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කොමසාරිස්වරුන් අතර ප්‍රශ්න හා පිළිතුරු සැසියක් පැවැත්විණි.

### අධිකරණ වෛද්‍ය විද්‍යාව භාවිතය පිළිබඳ දැනුවත් කිරීම

5.7. සැක සහිත සොහොන් බිම් පිළිබඳව විමර්ශනය කිරීමේදී විශේෂිත අධිකරණ වෛද්‍ය කුසලතා උපයෝගී කර ගැනීමේ අවශ්‍යතාවය සහ ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය කටයුතු සිදුකරන අය අතර ධාරිතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අවබෝධය වැඩි කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අපේක්ෂා කරයි. මේ සඳහා, පිහිටුවීමේ පළමු වසර සංවත්සරය නිමිත්තෙන්, ආර්ජන්ටිනාවේ අධිකරණ මානව විද්‍යා කණ්ඩායමේ ප්‍රධානී, ආචාර්ය ලූවී ෆොන්ඩෙබ්‍රයිඩර්ගේ " සත්‍යය සඳහා වන විද්‍යාත්මක සෙවීම තුළ මනුෂ්‍යත්වයට ගෞරව කිරීමේ වැදගත්කම" මැයෙන් යුත් දේශනය මාර්තු 9 වන දින කොළඹදී පැවැත්වීමට කාර්යාලය කටයුතු කරන ලදී.අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෙම දේශනය සඳහා සිවිල් සමාජ සංවිධාන, අධිකරණ වෛද්‍ය ප්‍රජාව සහ රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලයන් 50 කට අධික පිරිසක් සහභාගී වූහ.

5.8. ඔක්තෝම්බර් 12 වන දින අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් කොළඹ අධිකරණ ව්‍යාධි විද්‍යාඥයින්ගේ විද්‍යාලය සමඟ "අධිකරණ පුරාවිද්‍යා හා විමර්ශන සඳහා අධිකරණ මානව විද්‍යාවේ දායකත්වය" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. අර්ධ දින වැඩමුළුව Anthro.NL හි ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය රෆාල් පන්හුයිසන් සහ ස්මිත්සෝනියන් ආයතනයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය ඩග්ලස් උබෙලකර් විසින් පවත්වන ලද අතර එයට අධිකරණ වෛද්‍ය නිලධාරීන් 60 ක් සහභාගී වූහ. අපරාධ පරීක්ෂණ වලදී අධිකරණ වෛද්‍ය විද්‍යාව භාවිතා කිරීම සහ අතුරුදහන් වූවන් සෙවීම සහ එවැනි අවස්ථාවන්හිදී කාබන් දින ගණනය භාවිතය පිළිබඳ විශේෂඥයින් ඉදිරිපත් කිරීම් කළහ.

### මාධ්‍ය සමඟ සම්බන්ධතා

5.9. පුවත්පත් නිවේදන, පුවත්පත් සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා, විවෘත සංස්කරණ සහ මාධ්‍ය සාමාජිකයින්ගේ තොරතුරු සඳහා වන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම මගින් මාධ්‍ය සමඟ සම්බන්ධ වීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය උත්සාහ කරයි. එවැනි කටයුතු මගින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය වැඩ කටයුතු පිළිබඳව මහජනයා දැනුවත් කිරීමටත් ඒ පිළිබඳ වැරදි වැටහීම් දුරු කිරීමටත් උත්සාහ කරයි.

5.10. 2019 වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පහත මාධ්‍ය නිවේදන නිකුත් කළේය.

| දිනය | මාතෘකාව |
|---|---|
| ජනවාරි 7 | "අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් සමඟ සහයෝගිතාවයට නව වැඩසටහනක්[60] |
| ජනවාරි 30 | "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මන්නාරම සමූහ මිනී වලෙන් තෝරාගත් සාම්පල රේඩියෝ කාබන් දින පරීක්ෂාව සඳහා විදේශීය රසායනාගාරයකට භාර දීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කරයි" [61] |
| පෙබරවාරි 28 | "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, වසරකට පසු"[62] |
| මාර්තු 11 | "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඉදිරිපත් කළ අතුරු සහන යෝජනා 2019 අයවැයෙහි අන්තර්ගත වීම සාදරයෙන් පිළිගනිමු"[63] |
| අගෝස්තු 16 | "යාපනය ප්‍රාදේශීය කාර්යාල විවෘත කිරීම"[64] |

60 "Solidarity with Families of Missing Persons at the Heart of New Campaign" (2019 ජනවාරි 7) <https://drive.google.com/file/d/1J89Cc0OgeLYWKoZMZqWUZ8SSQM18TMZs/view> 2020 ජනවාරි 20 දින පිවසුණි; "காணாமற் போனோரின் குடும்பத்துடன் புதிய பிரச்சாரத்தினூடாக இதயபூர்வமான கூட்டிணைவு" (2019 ජනවාරි 7) <https://drive.google.com/file/d/1Nl6mh9c4myg1TnJNV-Xp-8TlVyRndHNJ/view> 2020 ජනවාරි 20 දින පිවසුණි; "අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් සමඟ සහයෝගිතාවයට නව වැඩසටහනක්" <https://drive.google.com/file/d/1UnMd85bkTpwYweyZzEZkumygI9OM6euf/view> 2020 ජනවාරි 20 දින පිවසුණි

61 "Office on Missing Persons acts as observer when handing over bone samples from the Mannar mass grave to an international laboratory for carbon dating" (2019 ජනවාරි 30) <https://www.facebook.com/ompsrilanka/posts/2232615733664321> 2020 ජනවාරි 20 දින පිවසුණි; "மன்னார் பாரிய மனித புதைகுழிகளின் மாதிரிகளைக் கார்பன் பரிசோதனைக்காக சர்வதேச ஆய்வகத்திற்கு கையளிப்பதில் பார்வையாளராக காணாமற் போன ஆட்கள் பற்றிய அலுவலகம் பங்கு பற்றியது" <https://www.facebook.com/ompsrilanka/posts/2232619410330620> 2020 ජනවාරි 20 දින පිවසුණි; "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මන්නාරම සමූහ මිනී වලෙන් තෝරාගත් සාම්පල රේඩියෝ කාබන් දින පරීක්ෂාව සඳහා විදේශීය රසායනාගාරයකට භාර දීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කරයි" <https://www.facebook.com/ompsrilanka/posts/2232620036997224> 2020 ජනවාරි 20 දින පිවසුණි.

62 "One year on: The Office on Missing Persons" (2019 පෙබරවාරි 28) <https://www.facebook.com/ompsrilanka/posts/2250605728531988> 2020 ජනවාරි 20 දින පිවසුණි; "ஓராண்டு நிறைவு: காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்" (2019 පෙබරවාරි 28) <https://www.facebook.com/ompsrilanka/posts/2250606001865294> 2020 ජනවාරි 20 දින පිවසුණි; "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වසරකට පසු" (2019 පෙබරවාරි 28)) <https://www.facebook.com/ompsrilanka/posts/2250606265198601> 2020 ජනවාරි 20 දින පිවසුණි.

63 "The Office on Missing Persons welcomes the inclusion of its Interim Relief proposals in the 2019 Budget" (2019 මාර්තු 11) <https://www.facebook.com/ompsrilanka/posts/2256970291228865> 2020 ජනවාරි 20 දින පිවසුණි; "2019 வரவு செலவுத் திட்டத்தில் இடைக்கால நிவாரணம் உள்ளடக்கப்பட்டிருப்பதை காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம் வரவேற்கின்றது" (2019 මාර්තු 11) <https://www.facebook.com/ompsrilanka/posts/2256971787895382> 2020 ජනවාරි 20 දින පිවසුණි; "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඉදිරිපත් කළ අතුරු සහන යෝජනා 2019 අයවැයෙහි අන්තර්ගත වීම සාදරයෙන් පිළිගනිමු" (2019 මාර්තු 11) <https://www.facebook.com/ompsrilanka/posts/2256972081228686> 2020 ජනවාරි 20 දින පිවසුණි.

64 "Jaffna Regional Office Opening" (2019 අගෝස්තු 16) <https://www.facebook.com/ompsrilanka/posts/2359579180967975> 2020 ජනවාරි 20 දින පිවසුණි; "யாழ்ப்பாணம் பிராந்திய அலுவலகத் திறப்பு" (2019 අගෝස්තු 16) <https://www.facebook.com/ompsrilanka/posts/2359580240967869> 2020 ජනවාරි 20 දින පිවසුණි; "යාපනය ප්‍රාදේශීය කාර්යාලය විවෘත කිරීම" (2019 අගෝස්තු 16) <https://www.facebook.com/ompsrilanka/posts/2359580927634467> 2020 ජනවාරි 20 දින පිවසුණි.

| | |
|---|---|
| අගෝස්තු 29 | "බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද වින්දිතයන්ගේ ජාත්‍යන්තර දිනය සැමරීම"[65] |
| ඔක්තෝබර් 27 | "අතුරුදහන් වූවන්ගේ ජාතික දිනය (සභාපතිගේ ප්‍රකාශය)"[66] |

5.11. 2019 වසරේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පහත මාධ්‍ය කටයුතු හා සම්බන්ධ විය:

| දිනය | අවස්ථාව |
|---|---|
| මාර්තු 8 | සභාපති සාලිය පීරිස් මහතා නිව්ස් ෆර්ස්ට් සමඟ සාකච්ඡාවකට එක් විය |
| මාර්තු 21 | සභාපති සාලිය පීරිස් මහතා Daily FT සමඟ සාකච්ඡාවකට එක් විය |
| මාර්තු 17 | සභාපති සාලිය පීරිස් මහතා Sunday Times සමඟ සාකච්ඡාවකට එක් විය |
| මාර්තු 18 | කොමසාරිස් ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු දිනමිණ සමඟ සාකච්ඡාවකට එක් විය. |
| ඔක්තෝබර් 29 | කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා රාසා සමඟ සාකච්ඡාවකට එක් විය. |

5.12. 2019 වසරේදී මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය පහත අවස්ථාවලදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නියෝජනය කළේය:

| දිනය | අවස්ථාව |
|---|---|
| ජනවාරි 21 | SCRM විසින් අනුරාධපුරයේ සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| පෙබරවාරි 2 | SCRM විසින් කොළඹ සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| පෙබරවාරි 12 | SCRM විසින් ත්‍රිකුණාමලයේ සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| පෙබරවාරි 15 | SCRM විසින් මාතර සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| මාර්තු 3 | SCRM විසින් මහනුවර සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| අප්‍රේල් 17-20 | සභාපති සාලිය පීරිස් මහතා රජය සමඟ එක්ව නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ සාම ගොඩනැගීමේ කොමිෂන් සභාවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වැඩ කටයුතු පිළිබඳ කෙටි විස්තරයක් ලබා දුන්නේය. |
| මැයි 22 | අතුරුදහන් වූවන් හා අතුරුදහන් වූවන් සම්බන්ධ ගැටළු සහ CoA සහ අතුරු සහන ලබා ගන්නේ කෙසේද යන්න පිළිබඳවත් මාතර මරණ සහතික පිළිබඳ ගැටළු පිළිබඳවත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නීති කාර්ය මණ්ඩලය මාතර සිවිල් සමාජ සංවිධාන සඳහා පුහුණුවක් ලබා දෙන ලදී. මෙම වැඩසටහනට |

[65] "Commemorating the International Day of the Victims of Enforced Disappearances" (2019 අගෝස්තු 29) <https://www.facebook.com/ompsrilanka/posts/2368312663427960> 2020 ජනවාරි 20 දින පිවසුණි; "பலவந்தமாக காணாமல் ஆக்கப்பட்டவர்களின் சர்வதேச தினத்தை நினைவுகூறல்" (2019 අගෝස්තු 29) <https://www.facebook.com/ompsrilanka/posts/2368314800094413> 2020 ජනවාරි 20 දින පිවසුණි; "බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද වින්දිතයන්ගේ ජාත්‍යන්තර දිනය සැමරීම" (2019 අගෝස්තු 29) <https://www.facebook.com/ompsrilanka/posts/2368316686760891> 2020 ජනවාරි 20 දින පිවසුණි.

[66] "National Day of the Disappeared" (2019 ඔක්තෝම්බර් 27) <https://www.facebook.com/ompsrilanka/posts/2415109422081617> 2020 ජනවාරි 20 දින පිවසුණි; "காணாமல் ஆக்கப்பட்டவர்குளுக்கான தேசிய தினம்" (2019 ඔක්තෝම්බර් 27) <https://www.facebook.com/ompsrilanka/posts/2415113822081177> 2020 ජනවාරි 20 දින පිවසුණි; "අතුරුදහන් වූවන්ගේ ජාතික දිනය" (2019 ඔක්තෝම්බර් 27) <https://www.facebook.com/ompsrilanka/posts/2415119262080633> 2020 ජනවාරි 20 දින පිවසුණි.

| | |
|---|---|
| | පවුල් විසින් මුහුණ දෙන කලාපයට විශේෂිත වූ විවිධ ගැටලු විසඳීම සඳහා නීති ආධාර සායනයක් ඇතුළත් විය. |
| ජූනි 7 | සභාපති සාලිය පීරිස්, කොමසාරිස්වරුන් වන මේජර් ජෙනරාල් (විශ්‍රාමික) මොහාන්ති පීරිස් සහ මිරැක් රහීම් යන මහත්වරුන් විසින් මීගමුවේ හානිපූර්ණය සඳහා වන කාර්යාලය ක්‍රියාත්මක කිරීම පිළිබඳ SCRM විසින් පවත්වන ලද වැඩමුළුවකට සහභාගී විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අත්දැකීම් වලින් උගත හැකි පාඩම් පිළිබඳව ද සභාපතිවරයා අදහස් දැක්වීය. |
| ජූලි 25 | බදුල්ල ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා පොලිසිය සඳහා සංවිධානය කරන ලද වැඩමුළුවකදී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු පිළිබඳව දැනුවත් කිරීම සඳහා සම්පත්දායකයෙකු ලෙස කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සහභාගී විය. |
| ජූනි 25 | කොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) මොහාන්ති පීරිස් සහ සභාපතිනි සාලිය පීරිස් ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ පොලීසිය ඉලක්ක කරගත් සංක්‍රාන්ති යුක්තිය සහ සංහිඳියාව පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා සම්පත්දායකයෙකු ලෙස සහභාගී වූහ. |
| අගෝස්තු 1 | මොණරාගල ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් හඳුන්වාදීමේ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| අගෝස්තු 8 | නුවර එළිය ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් හඳුන්වාදීමේ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| අගෝස්තු 22 | ත්‍රිකුණාමලය ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් හඳුන්වාදීමේ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| සැප්තැම්බර් 12 | ගාල්ල ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් හඳුන්වාදීමේ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| නොවැම්බර් 11-13 | ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ 9 වන දකුණු ආසියානු කලාපීය සමුළුවේදී කොමසාරිස් මිරාක් රහීම් මහතා "ජාත්‍යන්තර මානුෂවාදී නීතිය අප රටට ගෙන ඒම" යන මාතෘකාව යටතේ ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පහසුකම් සපයන ආකාරය පිළිබඳව අදහස් දක්වන ලදී. |
| නොවැම්බර් 30 | කොළඹ ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් හඳුන්වාදීමේ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| දෙසැම්බර් 3 | කොළඹ ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් හඳුන්වාදීමේ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| දෙසැම්බර් 6 | කොළඹ ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් හඳුන්වාදීමේ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |
| දෙසැම්බර් 10 | ජාත්‍යන්තර මානව හිමිකම් දිනය නිමිත්තෙන් කොළඹ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද කමිටුවකදී සභාපති සාලිය පීරිස් මහතා වෛරී කථාව පිළිබඳව අදහස් දැක්වීය. |
| දෙසැම්බර් 18 | කොළඹ ජාතික සාම කවුන්සිලය විසින් සංවිධානය කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් හඳුන්වාදීමේ වැඩමුළුවකට කොමසාරිස් එස්.කේ. ලියනගේ මහතා සම්පත්දායකයෙකු ලෙස සහභාගී විය. |

5.13. ඩිජිටල් මාධ්‍ය, ගුවන්විදුලිය සහ රූපවාහිනිය හරහා ප්‍රචාරය කරන ලද "වේදනාව කිසි කලෙක නැති වී නොයයි, සත්‍යය සෙවීමේ අපගේ වගකීම ඉටු කරමු" යන මැයෙන් සන්නිවේදන ව්‍යාපාරයක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිර්මාණය කර සංවර්ධනය කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අරමුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා වැඩි සංවේදනය ඇති කිරීම සඳහා වෙළඳ දැන්වීම් පහක් සිංහල,[67] දෙමළ[68] සහ ඉංග්‍රීසි[69] භාෂාවෙන් නිෂ්පාදනය කරන ලදී. බලහත්කාරයෙන් අතුරුදහන් වූවන්ගේ වින්දිතයින්ගේ ජාත්‍යන්තර දිනයට සමගාමීව මෙම දැන්වීම් 2019 ජනවාරි 5 සිට 2019 මාර්තු 13 දක්වා සහ 2019 අගෝස්තු 30 සිට 31 දක්වා විකාශය විය. මේ සඳහා පිවිසුණු සංඛ්‍යාව මිලියන 4.2 කට වඩා වැඩි විය.ෆේස්බුක් හි පමණක් එය නැරඹූ සංඛ්‍යාව මිලියන එකක් වූ අතර මිලියන 7.7 ක් ප්‍රතිචාර තිබිණි.

### ඩිජිටල් මාධ්‍ය මත පැවැත්ම

5.14. සමාජ මාධ්‍ය ඔස්සේ කාර්යාලයට නිල වේදිකාවක් ලබා දීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය ඩිජිටල් පැවැත්ම2018 ජූනි 24 දින ට්විටර්[70] හි සහ 2018 ඔක්තෝබර් 23 දින ෆේස්බුක්[71] හි ස්ථාපිත කළේය. වසර පුරා ට්විටර් සහ ෆේස්බුක් හි OMP සිය සමාජ මාධ්‍යවල වර්ධනයක් පෙන්නුම් කරයි. 2019 දෙසැම්බර් 17 වන විට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ට්විටර් හි අනුගාමිකයන් 1,621 ක් සහ ෆේස්බුක් හි අනුගාමිකයන් 5,256 ක් සිටියහ. එය මේ වන විට සිය වෙබ් අඩවිය සංවර්ධනය කිරීමේ කටයුතු කරමින් සිටින අතර 2020 දී වෙබ් අඩවිය ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 6. අනුස්මරණය සහ ස්මරණය

6.1. අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මහජන සහයෝගය ඇති කිරීමට පියවර ගැනීම සහ අනුස්මරණය හා පිළිගැනීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලය ඇත.[72] තම ආදරණීයයන් සැමරීමට, පවුල්වලට සහ මහජනතාවට ඇති අයිතිය සඳහා සහය ලබාදෙන අතරම ගැටලුව සහ බලපෑමට ලක්වූවන් පිළිබඳ වැඩි රාජ්‍ය පිළිගැනීමක් සහතික කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය උත්සාහ කරයි.

6.2. අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින් 400 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2019 අගෝස්තු 30 වන දින කොළඹ පිහිටි සිය ප්‍රධාන කාර්යාලයේදී බලහත්කාරයෙන් අතුරුදහන් වූවන්ගේ වින්දිතයින්ගේ ජාත්‍යන්තර දිනය සැමරීමේ දෙවන රාජ්‍ය උත්සවය පැවැත්වීය. අතුරුදහන් වූවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් පිළිබඳ මූලික වගකීම ඇති එකම රාජ්‍ය ආයතනය ලෙස, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් මෙම දිනය සැමරීම හරහා අතුරුදහන් වූවන්ගේ පවුල්වල දුක් වේදනා සහ අයිතිවාසිකම් පිළිගැනීමටත්, අතුරුදහන් වීමේ ප්‍රතිවිපාක පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමටත් අපේක්ෂා කරයි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමට පෙර, මෙම ගැටළුව සම්බන්ධයෙන් කටයුතු කරන පවුල් සහ සිවිල් සමාජ සංවිධාන විසින් මෙම දිනය සමරන ලදී.

[67] "ගිය මග නොකියා ම අතුරුදහන් වූ සහෝදරයා" (2019 ජනවාරි 5) <https://www.facebook.com/ompsrilanka/videos/518021968694232/> 2020 ජනවාරි 20 දින පිවසුණි, "අතුරුදහන් වූ රැකවරණය" (2019 ජනවාරි 5) <https://www.facebook.com/ompsrilanka/videos/213776772886037/> 2020 ජනවාරි 20 දින පිවසුණි

[68] "දරුවන් සොයන දෙමාපියන්ට විසඳුම් දෙමු" (2019 ජනවාරි 5) <https://www.facebook.com/ompsrilanka/videos/339694883293982/> 2020 ජනවාරි 20 දින පිවසුණි; "අවිනිශ්චිතබවේ වේදනාව" (5 January 2019) <https://www.facebook.com/ompsrilanka/videos/1087508171410079/> 2020 ජනවාරි 20 දින පිවසුණි

[69] "යටපත් කෙරුණු සත්‍යය" (2019 ජනවාරි 5) <https://www.facebook.com/ompsrilanka/videos/546370692504682/> 2020 ජනවාරි 20 දින පිවසුණි.

[70] "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ට්විටර් ගිණුම" (2018 ජූනි 24) <https://twitter.com/ompsrilanka> (2020 ජනවාරි 20 දින පිවිසුණි).

[71] "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ෆේස්බුක් ගිණුම" (2018 ඔක්තෝබර් 23 ). <https://www.facebook.com/ompsrilanka/> 2020 ජනවාරි 20 දින පිවිසුණි

[72]අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත, 13 (1) ,(j),(k)(ii).වගන්තිය.

6.3. මෙම අවස්ථාව සනිටුහන් කිරීම සඳහා, අතුරුදහන් වූවන්ගේ පවුල්වලට තාවකාලික අනුස්මරණ පවුරක් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිර්මාණය කරන ලද අතර ඔවුන්ගේ ආදරණීයයන්ගේ පින්තූර පණිවිඩ සමඟ ප්‍රදර්ශනය කිරීමට හැකි විය. තවද, අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් අත්විඳින ලද වේදනාව පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිංහල හා දෙමළ භාෂාවෙන් ගීත නිර්මාණය කිරීමට මූලිකත්වය ගත් අතර ඒවා නිලාර් එන්.කාසිම් මහතා විසින් රචනා කරන ලදුව සංගීත සංයෝජනය කරන ලදී.

6.4. අතුරුදහන් වූවන් පිළිබඳ සමස්ත ලංකා කොමිෂන් සභාවේ සභාපති, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු කොමසාරිස් සහ CTF හි සභාපති මනෝරි මුත්තෙටුවගම මහත්මිය අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයිතිවාසිකම් සම්බන්ධයෙන් රැස්වීම ඇමතීය. අතුරුදහන් වීම් සහ ඒවා මගින් අතුරුදහන් වූවන්ගේ පවුල් කෙරෙහි අඛණ්ඩව සිදුවෙමින් පවතින විනාශකාරී ප්‍රතිවිපාක පිළිබඳව අඛණ්ඩව දැනුවත් කිරීමේ වැදගත්කම පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති සාලිය පීරිස් මහතා අවධාරණය කළේය. සහකාර රෙජිස්ට්‍රාර් ජෙනරාල් ආනන්දි ජෙයරත්නම් මහත්මිය, දක්නට නොමැති බව පිළිබඳ සහතිකයක් ලබා ගත හැකි ආකාරය පිළිබඳව කතා කළ අතර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති, කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය, අතුරුදහන් වූ සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින් විසින් නගන ලද, CoAs, CoDs, අතුරු සහන ගෙවීම් සහ විමර්ශන පිළිබඳව අවධානය යොමු කළහ.

## 7. මූල්‍ය කටයුතු

| ශේෂ පත්‍රය | | | |
|---|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට | | | |
| | | | |
| **වත්කම්** | **සටහන** | **2019** | **2018** |
| | | (රු) | (රු) |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **1** | 33,668,713.34 | 6,983,096.75 |
| සේවක පුහුණුව | | - | 150,750.00 |
| | | | |
| ජාත්‍යන්තර දින සැමරුම | | 5,497,564.70 | - |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| පෙරගෙවූ වියදම් | **2** | 310,000.00 | - |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | - | 0.31 |
| | | | |
| **මුළු වත්කම්** | | **39,476,278.04** | **7,133,847.06** |
| | | | |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| උපචිත වියදම් | **3** | 5,199,967.17 | 1,760,192.47 |
| ණය හිමියන් | | 37,268.56 | - |
| නොගෙවනලද වැටුප් | **4** | 120,603.10 | - |
| **මුළු වගකීම්** | | **5,357,838.83** | **1,760,192.47** |
| | | | |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | **5** | 34,118,439.21 | 5,373,654.59 |
| | | | |
| **මුළු කොටස් හා වගකීම්** | | **39,476,278.04** | **7,133,847.06** |
| | | | |
| **සහතික කිරීම** | | | |

2019 දෙසැම්බර් 31 දින දක්වා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරණ බව සහතික කරමු.

……………………………… ………………………………

ඩී.ඒ. දිසානායක — සී. පුලෝකසිංහම්

අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන) — වැඩබලන ලේකම්

මූල්‍ය ප්‍රකාශය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් ඒ වෙනුවෙන් අත්සන් කරන ලදී;

…………………………… ……………………………

සාලිය පීරිස් (ජ.නි) — මීරාක් රහීම්

සභාපති — මණ්ඩල සාමාජික (කොමසාරිස්)

……………………………

එම් ඒ මාල්තිදේවි පීරිස්

මණ්ඩල සාමාජික (කොමසාරිස්)

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**
**ආදායම් සහ වියදම් ප්‍රකාශය**
2019 දෙසැම්බර් 31 වන දින අවසන් වූ වසර සඳහා

| | සටහන | 2019 (රු) | 2018 (රු) |
|---|---|---|---|
| **අයභාර** | | | |
| පුනරාවර්තන ප්‍රදාන | 6 | 64,039,036.37 | 23,000,000.00 |
| **මුළු අයභාරය** | | **64,039,036.37** | **23,000,000.00** |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක වරප්‍රසාද | 7 | 25,853,203.06 | 15,558,000.20 |
| ගමන් වියදම් | 8 | 4,333,055.88 | 321,030.95 |
| සැපයුම් සහ පරිභෝජ්‍ය වියදම් | 9 | 7,628,739.02 | 1,299,741.70 |
| නඩත්තු වියදම් | 10 | 1,344,602.98 | 1,237,265.25 |
| ක්ෂයවීම් | | 698,309.68 | - |
| සේවා වියදම් | 11 | 31,626,346.98 | 6,660,307.31 |
| **මුළු වියදම්** | | **71,484,257.60** | **25,076,345.41** |
| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / ඌනතාවය** | | **(7,445,221.23)** | **(2,076,345.41)** |

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**
**2019 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2019 (රු) | 2018 (රු) |
|---|---|---|
| **මුදල් ලැබීම්** | | |
| අරමුදල් | 87,000,000.00 | 30,450,000.00 |
| ජලය සහ විදුලිය සඳහා ජනාධිපති / කැබිනට් මණ්ඩලයෙන් මුදල් ලැබීම් | 2,036,492.81 | - |

| | | |
|---|---|---|
| වෙනත් මුදල් ලැබීම් | 39,685.31 | 1,138.00 |
| **මුළු මුදල් ගලා ඒම** | **89,076,177.81** | **30,451,138.00** |

**මුදල් ගෙවීම්**

**මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| | | |
|---|---|---|
| වැටුප් සහ වේතන | (15,124,076.91) | (7,010,219.66) |
| නිවාඩු ගෙවීම් සහ අතිකාල දීමනා | (481,505.78) | (37,844.44) |
| වෙනත් දීමනා | (10,239,701.45) | (8,369,805.00) |
| සංචාරක සහ යැපීම් - දේශීය | (3,086,592.41) | - |
| සංචාරක සහ යැපීම් - විදේශීය | (1,321,145.91) | (321,030.95) |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | (2,481,226.98) | (1,044,616.57) |
| ඉන්ධන වියදම් | (1,330,741.92) | - |
| ආහාර සඳහා වියදම් | (2,903,439.28) | (233,946.13) |
| වාහන නඩත්තු කිරීම | (252,087.05) | - |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම | (704,051.20) | - |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් නඩත්තු කිරීම | (353,614.73) | (797,807.06) |
| ප්‍රවාහනය | (3,143,989.91) | (534,163.30) |
| තැපැල් හා සන්නිවේදනය | (8,612,625.73) | (1,391,749.97) |
| විදුලි බිල්පත් සහ ජල බිල්පත් | (4,838,424.66) | (55,493.56) |
| කුලී සහ දේශීය බදු | (1,148,283.37) | - |
| වෙනත් සේවා ගාස්තු | (10,650,834.01) | (3,623,127.18) |
| ජාත්‍යන්තර දිනය සැමරීම වෙනුවෙන් වියදම් | (5,497,564.39) | - |
| සේවක පුහුණුව | - | (150,750.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(72,169,905.69)** | **(23,570,553.82)** |

**ආයෝජන ක්‍රියාකාරකම්**

| | | |
|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් සඳහා ගෙවීම් | (808,304.00) | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | (3,466,302.43) | (6,880,583.87) |
| පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම | (12,631,666.00) | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(16,906,272.43)** | **(6,880,583.87)** |

| | | |
|---|---|---|
| **මුදල් සහ මුදල් සමාන දෑ - ශුද්ධ අඩුවීම් / වැඩිවීම්** | (0.31) | 0.31 |
| කාල පරිච්ඡේදයේ ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 0.31 | - |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | **0.00** | **0.31** |

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**
**ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය**
**2019 දෙසැම්බර් 31 වන දින අවසන් වූ වසර සඳහා**

| | මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන ප්‍රදානය (රු) | සමුච්චිත අරමුදල් (රු) | වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) (රු) | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| 2018/07/01 දිනට අරම්භක ශේෂය | | | | |
| භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන | 7,450,000.00 | - | - | 7,450,000.00 |
| 2018 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | - | - | 2,076,345.41 | (2,076,345.41) |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | - | - | - |
| 31/12/2018 දිනට ශේෂය | - | - | - | 5,373,654.59 |
| | 7,450,000.00 | - | 2,076,345.41 | **10,747,309.18** |
| 01/01/2019 දිනට අරම්භක ශේෂය | - | 5,373,654.59 | - | 5,373,654.59 |
| භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන | 24,892,401.27 | - | - | 24,892,401.27 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - උපකරණ සහ වෙනත් පරිත්‍යාග කිරීම් | 8,497,942.00 | - | - | 8,497,942.00 |
| පෙර අතිරික්තය / (හිඟය) ගැලපීම් | | | 1,814,545.00 | 1,814,545.00 |
| 2019 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | - | - | 7,445,221.23 | (7,445,221.23) |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | 985,117.58 | - | 985,117.58 |
| 31/12/2019 දිනට ශේෂය | 33,390,343.27 | 6,358,772.17 | 9,259,766.23 | **34,118,439.21** |

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2019 දෙසැම්බර් 31 දිනට

| සටහන | කේතය | | | | | (රු) |
|---|---|---|---|---|---|---|
| 1 | | **දේපල පිරියත සහ උපකරණ** | | | | |
| | | **වර්ගය** | **ශේෂය 01.01.2019** | **එකතු කිරීම්** | **බැහැර කිරීම්** | **ශේෂය 31.12.2019** |
| | **2001** | **ගොඩනැගිලි සහ ව්‍යුහයන්** | | 808,304.00 | - | 808,304.00 |
| | **2102** | **ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ** | 6,983,096.75 | 8,825,813.46 | - | 15,808,910.21 |
| | **2103** | **පිරියත යන්ත්‍රෝපකරණ සහ උපකරණ** | | 17,749,808.81 | - | 17,749,808.81 |
| | | | **6,983,096.75** | **27,383,926.27** | **-** | **34,367,023.02** |
| | **1304** | **සමුච්චිත ක්ෂයවීම** | | | | |
| | | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | - | - | - | - |
| | | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | - | 698,309.68 | - | 698,309.68 |
| | | **පිරියත යන්ත්‍රෝපකරණ සහ උපකරණ** | - | - | - | - |
| | | | **-** | **698,309.68** | **-** | **698,309.68** |
| | | **ලිඛිත අගය** | | | | **33,668,713.34** |

| සටහන | කේතය | | | (රු) |
|---|---|---|---|---|
| 3 | 2201 | **උපචිත වියදම්** | | |
| | | වෙනත් දීමනා | | 42,741.94 |
| | | සංචාර - දේශීය | | 32,200.00 |
| | | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | | 630,336.34 |
| | | ඉන්ධන | | 1,500.00 |
| | | ආහාර | | 96,327.00 |
| | | යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම | | 34,850.00 |
| | | ප්‍රවාහනය | | 311,431.25 |
| | | තැපැල් හා සන්නිවේදනය | | 288,291.32 |
| | | විදුලිය සහ ජලය | | 317,778.74 |
| | | බදු වියදම් | | 267,422.67 |
| | | වෙනත් | | |
| | | පිරිසිදු සේවා | 815,371.53 | |
| | | ආරක්ෂක සේවා | 2,017,816.38 | |
| | | වෙනත් | 343,900.00 | 3,177,087.91 |
| | | | | **5,199,967.17** |
| 4 | 2201 - 2 | **නොගෙවනලද වැටුප්** | | |
| | | නොගෙවූ වැටුප | | 80,062.58 |
| | | නොගෙවූ මුද්දර ගාස්තු | | 75.00 |
| | | නොගෙවූ සේ.හා.අ | | 35,187.41 |
| | | නොගෙවූ සේ.නි.හා.අ. | | 5,278.11 |
| | | | | **120,603.10** |
| 5 | | **ශුද්ධ වත්කම්** | | |
| | | ප්‍රාග්ධන අරමුදල් 01/01/2019 | | 5,373,654.59 |
| | | පෙර වසරේ ගැලපීම් | | 985,117.58 |
| | | පෙර වර්ෂය - අතිරික්තය / (හිඟ) | | 1,814,545.00 |
| | | | | 8,173,317.17 |
| | | ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අරමුදල් | | 24,892,401.27 |
| | | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (උපකරණ සහ වෙනත් පරිත්‍යාග) | | 8,497,942.00 |
| | | අතිරික්තයට පෙර සමුච්චිත අරමුදල / (හිඟය) | | 41,563,660.44 |
| | | වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | | (7,445,221.23) |
| | | | | **34,118,439.21** |
| 6 | | **ආදායම - පුනරාවර්තන ප්‍රදාන** | | |
| | | භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදාන | | 63,935,713.87 |
| | | අමාත්‍යාංශයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදාන | | 103,322.50 |
| | | | | **64,039,036.37** |

| සටහන | කේතය | | | (රු) |
|---|---|---|---|---|
| 7 | | **වැටුප්, වේතන සහ සේවක වරප්‍රසාද** | | |
| | 1001 | **වැටුප් සහ වේතන** | | 15,165,676.56 |
| | 1002 | **නිවාඩු ගෙවීම් සහ අතිකාල දීමනා** | | 471,598.14 |
| | 1003 | **වෙනත් දීමනා** | | |
| | | ජීවන වියදම් සහ වෘත්තීය දීමනා | 3,036,248.78 | |
| | | මාසික දීමනා - කොමසාරිස්වරුන් සහ සේවක මණ්ඩල | 6,404,072.00 | |
| | | සේවක දීමනා - සේවයෙන් ඉවත් වූ | 38,484.97 | |
| | | සේවක පුහුණුව, කාර්යය පැවරුම් සඳහා ගෙවීම් | 737,122.61 | 10,215,928.36 |
| | | | | **25,853,203.06** |
| 8 | | **ගමන් වියදම්** | | |
| | 1101 | **සංචාර - දේශීය** | | |
| | | කාර්ය මණ්ඩල ගමන් | 118,792.41 | |
| | | කොමසාරිස් සංචාර | 3,000,000.00 | 3,118,792.41 |
| | 1102 | **සංචාර - විදේශීය** | | 1,214,263.47 |
| | | | | **4,333,055.88** |
| 9 | | **සැපයුම් සහ පරිභෝජ්‍ය වියදම්** | | |
| | 1201 | **ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා** | | |
| | | ශ්‍රී ලංකා ප්‍රාන්ත වෙළඳ පොදු සංස්ථාව | 1,017,615.00 | |
| | | මෙට්රොපොලිටන් කාර්යාලය | 731,958.00 | |
| | | සෙන්කඩ මුද්‍රණකරුවෝ | 220,900.00 | |
| | | වෙනත් | 1,285,021.57 | 3,255,494.57 |
| | 1202 | **ඉන්ධන** | | 1,332,241.92 |
| | 1203 | **ආහාර වියදම්** | | |
| | | යාපනය කාර්යාලය විවෘත කිරීම | 806,565.00 | |
| | | මාතර කාර්යාලය විවෘත කිරීම | 222,550.00 | |
| | | අධිකරණ වෛද්‍ය විද්‍යාලය සඳහා රැස්වීම | 155,250.00 | |
| | | පළමු වසර සංවත්සර සැමරුම - BMICH | 171,600.00 | |
| | | කොමසාරිස් / සේවක ක්ෂේත්‍ර සංචාර සහ වෙනත් | 1,685,037.53 | 3,041,002.53 |
| | | | | **7,628,739.02** |
| 10 | | **නඩත්තු වියදම්** | | |
| | 1301 | **වාහන නඩත්තුව** | | 252,087.05 |
| | 1302 | **යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම** | | 738,901.20 |
| | 1303 | **ගොඩනැගිලි සහ ව්‍යුහයන්** | | 353,614.73 |
| | | | | **1,344,602.98** |

| සටහන | ක්ෂේත්‍රය | | | (රු) |
|---|---|---|---|---|
| 11 | | **සේවා** | | |
| | **1401** | **ප්‍රවාහනය** | | |
| | | කාර්ය මණ්ඩල ප්‍රවාහන දීමනා | 1,889,681.21 | |
| | | ප්‍රවාහන වියදම් | 440,599.93 | |
| | | කුලි රථ වියදම් | 1,097,300.80 | 3,427,581.94 |
| | **1402** | **තැපැල් හා සන්නිවේදනය** | | |
| | | රැකියා පුරප්පාඩු සඳහා පුවත්පත් දැන්වීම | 6,772,083.25 | |
| | | මුද්දර වියදම් | 146,940.00 | |
| | | අන්තර්ජාල සඳහා වියදම් | 199,551.22 | |
| | | දුරකථන ගාස්තු | 1,473,038.70 | |
| | | පුවත්පත් ගාස්තු | 280,081.00 | 8,871,694.17 |
| | **1403** | **විදුලිය සහ ජලය** | | 3,042,859.38 |
| | **1404** | **බදු සහ කුලී** | | 1,415,706.04 |
| | **1409** | **වෙනත් සේවා** | | |
| | | ආරක්ෂක සේවය | 7,040,043.53 | |
| | | පිරිසිදු කිරීමේ සේවා | 2,222,677.73 | |
| | | සමූහ මිනීවළ සඳහා දැරූ වියදම් | 1,442,792.50 | |
| | | S.W.R.D බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේ ගාස්තු | 83,575.85 | |
| | | ශබ්ද පද්ධතිය සහ පරිවර්තන වියදම් - වින්දිතයින් සහ පවුල් සහයෝගය පුහුණු කිරීම සඳහා | 92,000.00 | |
| | | ශ්‍රී ලංකා පදනම - පුහුණු වැඩසටහන | 463,650.00 | |
| | | මාතර සහ මන්නාරම් සඳහා කුලි වියදම් | 2,450,000.00 | |
| | | වෙනත් වියදම් | 1,073,765.84 | 14,868,505.45 |
| | | | | **31,626,346.98** |

**ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**
**2019 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා**

## 1. මිනුම්

අදාල සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු හෙළිදරවු කිරීම් හැරුණු විට මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඓතිහාසික පිරිවැය පදනම මතය. වත්කම් සහ වගකීම් ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතා තත්ත්වය පිළිබිඹු වන අනුපිලිවලකට කාණ්ඩ කර ඇත. 2019 ජනවාරි මස 1 වන දින සිට 2019 දෙසැම්බර් මස 31 දක්වා මාස 12 කාලයක් සඳහා මූල්‍ය ප්‍රකාශය සකස් කර ඇත.

2016 අංක 16 දරන පනත යටතේ සහ 2017 අංක 09 දරණ සංශෝධනය යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කොට ඇත.

## 2. දේපළ සහ උපකරණ

**අ) හඳුනාගැනීම සහ මිනුම්**

දේපළ සහ උපකරණ ගිණුම් ගත කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් අඩුකරන ලද පිරිවැය හෝ සාධාරණ වටිනාකම මතයි. සියලුම දේපල හා උපකරණ ප්‍රථමයෙන් වාර්තාගත වන්නේ පිරිවැය මතයි.

**ආ) ක්ෂය වීම**

ක්ෂය ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සරල මාර්ග ක්‍රමය භාවිතා කිරීමෙන් වන අතර එමගින් අදාල අගයන්, වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය පුරා කපා හරිනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය පහත පරිදි වේ.

| වත්කම | ප්‍රතිශත |
|---|---|
| ගොඩනැගිලි | 05% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| කාර්යාලීය උපකරණ (පරිගණක/මුද්‍රණ යන්ත්‍ර/ඡායා පිටපත් යන්ත්‍ර) | 20% |
| මෝටර් රථ | 20% |

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම් මිලදීගත් වර්ෂයේදී සිදු නොකරන අතර දෙවන වසර සිට සිදු කරනු ලැබේ. බැහැර කරන මාසය නොසලකා බැහැර කරන වර්ෂයේදී සම්පූර්ණ ක්ෂය කිරීම් සිදු කළ යුතුය.

## 3. සේවක ප්‍රතිලාභ

### a) පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ ඇති අවශ්‍යතා කිසිඳු සේවකයෙකු සපුරා නොමැති බැවින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලය සඳහා පාරිතෝෂික වෙන්කිරීමක් සිදුකර නොමැත.

### b) දායක සැලසුම්

අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලය සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක වැටුපෙන් 12% ප්‍රතිශතයකින්ද සේවක භාර අරමුදල සඳහා සේවක වැටුපෙන් 3% ප්‍රතිශතයකින්ද දායකත්වය සපයනු ලබන අතර සෑම සේවකයෙකුම සිය වැටුපෙන් 8% ප්‍රතිශතයක් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායනත්වය දැරිය යුතුය.

## 4. ප්‍රදාන සඳහා ගිණුම්කරණය

ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගම් අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන ලබා දෙනු ලබන අතර ප්‍රාග්ධන අරමුණු සඳහා වෙන්වන ප්‍රතිපාදන සමුච්චිත අරමුදලට බැරකරනු ලබන අතර පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය ප්‍රකාශන වල ආදායම යටතේ පෙන්වා දී ඇත.

## 5. ආදායම් සහ වියදම්

සියලුම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සාධාරණ ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත.

එමෙන්ම භාණ්ඩාගාර ප්‍රදාන මුදල් පදනම මත හඳුනාගෙන ඇති අතර අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත. වත්මන් ගිණුම්කරණ වර්ෂයට අදාල සියලු වියදම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

**6. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

සෘජු ක්‍රමය භාවිත කරමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

**7. මූල්‍ය ඉදිරිපත් කිරීම්**

මෙකී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මුදලින් ඉදිරිපත් කර ඇත.

මගේ අංකය / எனது இல. / My No. EHA/D/OMP /FS 01/19/56

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020 අගෝස්තු 27 දින

සභාපති

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කාර්යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රසිද්ධ කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් දරන ලද පුනරාවර්තන වියදම් රු.2,924,950 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද, අදාල ප්‍රදාන ලැබීම් කාර්යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන සංචිතවලට එකතු කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ කාර්යාලයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වියදම් අයිතම 3කට අදාළව ගෙවිය යුතු වටිනාකම රු.1,436,320 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් දරන ලද රු.2,505,909 ක උත්සව වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඈ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.200,000 ක ගොඩනැගිලි කුලී වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.2,450,000 ක ගොඩනැගිලි කුලී වියදම වෙනත් සේවා වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් වටිනාකම රු. 6, 845,457 ක්වූ පරිගණක හා උපාංග මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ

යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම විසින් පවත්වාගෙන ගොස් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.2 (ඇ) ඡේදයේ සඳහන් නිර්දේශය හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති /විධිවිධානවලට යොමුව | විස්තරය |
| --- | --- |
| 2017 නොවැම්බර් 21 දිනැති අංක 02/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (i) ඡේදය ප්‍රකාරව | අමාත්‍යාංශය සතු වාහනයක් චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් පවරා ගැනීමකින් තොරව භාවිතයට ගෙන තිබූ අතර වාහන නඩත්තු වියදම් හා ඉන්ධන වෙනුවෙන් පිළිවෙලින් රු.252,087ක් හා රු.328,802 ක් දරා තිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

03.අනෙකුත් විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙනුවෙන් 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, ආයතනයේ අවශ්‍යතාවයන් වෙනුවෙන් උපකරණ හා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් පමණක් මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණු අතර 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරිම හා කර්තව්‍ය ඉටු කිරීම) පනතේ II කොටසේ 10 (1)හි දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීමට අදාළ කාර්යයන් කිසිවක් මෙම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණ රු. 2,935,713 ක් අයභාර වියදම් සඳහා වැය කර එම ප්‍රදාන ලැබීම් කාර්යාලයේ ආදායමක් ලෙස දක්වා තිබුණ ද, මේ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 39න් 30ක් හා තෘතිය මට්ටමේ තනතුරු 114න් 99ක්ම පුරප්පාඩු පැවතීම පරිපාලන කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් ඇති වීමේ හැකියාවක් පැවතිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
OFFICE ON MISSING PERSONS

නො.408,තෙවන මහල
ගාලු පාර
කොළඹ 03, ශ්‍රී ලංකා

இல.408, 03ம் மாடி,
காலி வீதி,
கொழும்பு 03, இலங்கை.

No. 408, Level 03,
Galle Road,
Colombo 03, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No: OMP/F&P/44

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2020.11.30

නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2019 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 13 (7) ඒ, වගන්ති ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව**

ඉහත ශීර්ෂයෙන් යුතුව ඔබ විසින් මා වෙත යොමු කරන ලද යොමු අංක ඊ එච් ඒ/ ඩී/ ඕ එම් පී/ එස් එස්/ 01/ 19/56 හා 2020.09.25 දිනැති ලිපිය සම්බන්ධවයි.

අදාල ලිපියෙහි සඳහන් කරුණු පිළිබඳව දැනට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇති බව දක්වා සිටිමි.

## 1.4 මූල්‍ය ප්‍රකාශ

### 1.4.1 ගිණුම්කරණ අඩුපාඩු

| | |
|---|---|
| I. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් විසින් දරණ ලද පුනරාවර්තන වියදම් රු.2,924,950.00ට පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් කර තිබුණද, අදාල ප්‍රදාන ලැබීම කාර්යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන සංචිත වලට එකතු කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ කාර්යාලයේ ඌණතාවය එම ප්‍රමාණයට වැඩිකොට දැක්වුණි. | I. මෙම වරද 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| II. සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් හා දීමනා, සේවක අර්ථ සාධක අරමුදල් හා භාරකාර අරමුදල් දායකය හා වෙනත් ගෙවිය යුතු බිල්පත්වල වටිනාකම රු.1,436,320.00 අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | II. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| III. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් දරණ ලද රු.2,505,909.00ක උත්සව වියදම් ප්‍රාග්ධනික කර තිබුණි. | III. ඉදිරියේදී අදාල වැරදි නිවැරදි කිරීමට නිලධාරියාට උපදෙස් දෙන ලදි. |
| IV. මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය වෙනුවෙන් ඉදිරි වර්ෂයේ මාස 02ක් වෙනුවෙන් දරණ ලද ගොඩනැගිලි කුලිය රු.200,000.00ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | IV. නිවැරදිව ගිණුම් ගැලපීමට කටයුතු කර ඇත. |

| | |
|---|---|
| V. මාතර හා මන්නාරම ප්‍රාදේශීය කාර්යාල වෙනුවෙන් ගෙවන ලද රු.2,450,000.00ක ගොඩනැගිලි කුලී වෙනත් සේවා වියදම් වල මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | V. නිසි පරිදි ගිණුම් ගත කිරීමට 2020 වර්ෂයේදී කටයුතු කරනු ඇත. |
| VI. සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් වටිනාකම රු.6,845,457.00ක් වූ පරිගණක හා උපාංග මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලෙස ගිණුම් ගත කර තිබුණි. | VI. 2020 වර්ෂයේ සිට නව ගිණුම් සංකේත හඳුන්වා දී නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. |

## 1.4.2 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| | |
|---|---|
| මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණ රු.2,935,713.00ක් අයභාර වියදම් සඳහා වැයකර එම ප්‍රදාන ලැබීම් කාර්යාලයේ අවශ්‍යතා ලෙස දක්වා තිබුණද මේ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොතිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. |

## 1.5 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම

| | |
|---|---|
| (අ) චක්‍රලේඛණයට පටහැනිව භාෂා පරිවර්තනය වෙනුවෙන් එක් වචනයක් වෙනුවෙන් රු.4ක් හා රු.5ක් වශයෙන් රු.20802.00ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | රජයේ භාෂා පරිවර්තකයෙකු සොයාගැනීමේ අපහසුවත්, ඔවුන්ගෙන් අවශ්‍ය වේලාවට කාර්ය ඉටු කර ගැනීමට නොහැකි නිසාත් මෙම ආකාරයට කටයුතු කලද ඉදිරියේදී චක්‍ර ලේඛණ උපදෙස් පරිදි කටයුතු කිරීමට උපදෙස් දෙන ලදි. |
| (ආ) අමාත්‍යාංශය සතු වාහනයක් චක්‍රලේඛණ ප්‍රකාරව විධිමත්ව පවරා ගැනීමකින් තොරව භාවිතයට ගෙන තිබුණි. | අදාල වාහනය විධිමත්ව පවර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනයට

### 3.1 ප්‍රසම්පාදන කළමණාකරනය

| | |
|---|---|
| (අ) යාපනය ප්‍රාදේශීය කාර්යාලය සංචාරක කාමර සඳහා රු.91511.00ක් වටිනා ලී බඩු හා උපකරණ ගෙන තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) (ඉ) (ඊ) ප්‍රකාරව උපරිම ආර්ථික වාසි සලසා ගැනීමට හා ඇගයීම් හා තේරීමේ කාර්ය පටිපාටියේ විනිවිදභාවය හා නීත්‍යානුකූලභාවය සහතික වන අයුරින් මිල ගණන් කැඳවා නොතිබුණි. | භාණ්ඩ වර්ග 17ක් මේ යටතේ මිලදී ගෙන ඇත. භාණ්ඩ වල මුළු වටිනාකම සැලකීමේදී පිරිවිතර සැකසීම, තාක්ෂණ කමිටු පත්කිරීම ආදිය ප්‍රායෝගික නොවේ. මෙවැනි අවස්ථාවල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 හා 3.6 යටතේ සෘජු මිලදී ගැනීම් වලට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව කටයුතු කර ඇත. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව වෙළඳපල මිල සැලසුම් ක්‍රමය | මේ යටතේ ජනවාරි, පෙබරවාරි, මාර්තු, මැයි, ජූනි, ඔක්තෝබර්, |

අනුගමනය කරමින් වැඩ හා භාණ්ඩ සඳහා මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවෙන් මිල කැඳවිය යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී රු.765947.00ක් වූ ස්ථාවර වත්කම් හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සිදුකර තිබුණි.

නොවැම්බර්, යන මාසවල අවස්ථා 08 කදී සිදුකරන ලද මිලදී ගැනීම් ඇතුලත් වේ. ඒ ඒ අවස්ථාවල හදිසි අවශ්‍යතා මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 හා 3.6 යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන අනුව මිලදී ගැනීම් සිදුකර ඇත.

### 3.2 මානව සම්පත් කළමණාකරනය

ජ්‍යෙෂ්ඨ කළමණාකරන මට්ටමේ තනතුරු 39න් 30 කට හා සාධනීය මට්ටමේ තනතුරු 114න් 99කට පුරප්පාඩුව පැවති, පරිපාලන කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවීමේ හැකියාව පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

අදාල තනතුරු 2021 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත.

## 4. ගිණුම් කටයුතු හා යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙනුවෙන් 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද ආයතනයේ අවශ්‍යතාවයන් වෙනුවෙන් උපකරණ හා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් පමණක් මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණි. 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම, කර්තව්‍යය ඉටු කිරීම) පනතේ II වන කොටසේ 10 (1) හි දැක්වෙන කාර්යභාරය ඉටුකිරීමට අදාල කාර්යන් කිසිවක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

නිසි පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අදාල අංශ ප්‍රධානීන්ට උපදෙස් දෙන ලදි.

විධායක අධ්‍යක්ෂ (වැ. බ)
අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි

පිටපත්: 01. ගරු අධිකරණ අමාත්‍යතුමා - අධිකරණ අමාත්‍යාංශය
02. ගරු මුදල් අමාත්‍යතුමා - මුදල් අමාත්‍යාංශය